DCS
www.statistics.gov.lk

ආර්ථික ප්‍රතිපත්ති හා
සැලසුම් ක්‍රියාත්මක කිරීමේ
අමාත්‍යාංශය

# ළමා නිවාසගත ළමුන් පිළිබඳ සංගණනය 2019

## දකුණු පළාත

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සහ
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

# ළමා නිවාසගත ළමුන් පිළිබඳ සංගණනය 2019

## දකුණු පළාත

2022 ජනවාරි 31

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

**ISBN 978-624-5919-46-8**

## පෙරවදන

ළමයෙකුගේ කායික, මානසික හා අධ්‍යාත්මික යන සෑම අංශයකම සිදුවන සංවර්ධනය “ළමා සංවර්ධනය” වේ. මෙහිදී පෝෂ්‍යදායක ආහාර මෙන්ම දෙමාපිය වැඩිහිටියන්ගෙන් ලැබෙන රැකවරණය, ආදරය, උණුසුම, කරුණාව හා සන්නිවේදනය ද මානසික සංවර්ධනයට අත්‍යවශ්‍ය වන අතර දෙමාපියන්ගෙන් හා වැඩිහිටියන් ඇසුරින් ලබන අත්දැකීම් ළමයෙකුගේ ප්‍රාථමික සමාජානුයෝජනයට ඉතා වැදගත් වේ.

එහෙත් පවුලක රැකවරණය නොලබන ළමුන්ගේ මූලික අවශ්‍යතා ඉටුකර දෙනු ලැබුවද දෙමාපියන්ගෙන් වැඩිහිටියන්ගෙන් ලබන ආදරය හා උණුසුම ඒ අයුරින්ම දරුවන්ට ලබාදීම ආයතනගත රැකවරණයේදී අපහසු කාර්යයකි. තවද ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 9 වන හා 10 වන වගන්ති කෙරෙහි අවධානය යොමු කිරීමේදී ළමයාගේ උපරිම යහපත සඳහා පවුලක් තුළ ජීවත්වීම අත්‍යවශ්‍ය සාධකයක් ලෙසට හඳුනාගෙන තිබේ.

ළමයින් සඳහා විකල්ප රැකවරණය සැලසීමේදී ඒ සඳහා වන නීතිරීති ශ්‍රී ලංකාව තුළ ඇතත් සෑම පළාතකටම පොදුවේ පිළිගත් මඟපෙන්වීමක් නොතිබුණි. මෙම තත්ත්වය කෙරෙහිද අවධානය යොමු කර “ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තියක්” සකස් කරන ලද අතර එම ප්‍රතිපත්තිය 2019.03.06 දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත.

එම ප්‍රතිපත්තියට අනුව යමින් ළමා නිවාසගත දරුවන්ට වඩා වැඩි සේවාවක් හා සුභසාධනයක් ලබාදීමේ හා ඔවුන්ව සමාජගත කිරීමේ හැකියාව සොයා බැලීමේ අරමුණින් එම දරුවන් පිළිබඳ විධිමත් දත්ත රැස්කිරීමක් සිදු කළ යුතු බව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, දිවයිනේ ළමා නිවාසගතව සිටිනා සියළුම ළමුන්ගේ තොරතුරු/ දත්ත විධිමත් පරිදි ලබාගෙන එම ළමා නිවාසගත ළමුන්ගේ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීමේ අරමුණ පෙරදැරිව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ වී මෙම ළමා නිවාස පිළිබඳ සංගණනය පවත්වන ලදී. දිවයිනේ සියළුම ළමා නිවාසවල ළමුන්ගේ දත්ත ඒකරාශී කොට ජාතික මට්ටමේ වාර්තාව එළිදක්වන ලද අතර එම වාර්තාව තුළින් සමස්ථ ළමා නිවාසගත ළමුන්ගේ තත්ත්වය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව ඇත.

එම දත්ත/ තොරතුරු පදනම් කර ගනිමින් ජාතික වශයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.

සමස්ථ සංගණන වාර්තාව අනුව දිස්ත්‍රික් මට්ටමින් හා පළාත් මට්ටමින් ළමා නිවාසගත ළමුන්ගේ සංඛ්‍යාවේ මෙන්ම අනෙකුත් සලකා බැලූ කරුණුවල විෂමතාවයන් රාශියක් දක්නට ඇති බව හඳුනාගන්නා ලදී. එසේම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විමධ්‍යගත විෂය පථයක් සහිත දෙපාර්තමේන්තුවක් වන බැවින් පළාත් මට්ටමින් ඇති ළමා නිවාසවල දත්ත පදනම් කර ගනිමින් පළාත් නවය සඳහා පළාත් මට්ටමේ සංගණන වාර්තා සකස් කිරීම අරඹන ලදී.

මෙම වාර්තාව සකස් කිරීමේදී ඒ සඳහා විශේෂයෙන් දායකත්වය ලබාදෙන ලද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාත්, පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශයේ අධ්‍යක්ෂ හා එහි කාර්ය මණ්ඩලයටත්, යුනිසෙෆ් ආයතනයේ ළමාරක්ෂක ප්‍රධානී, මිරන්ඩා ඊ. ආර්ම්ස්ට්‍රෝන් මහත්මිය හා ළමා ආරක්ෂක නිලධාරී මිහිලාර් මොහොමඩ් මහතාටද ස්තූතිය පුද කරමි.

ළමා නිවාසගත ළමුන් වෙනුවෙන් පළාත් මට්ටමින් ප්‍රතිපත්ති තීරණ ගැනීමට, එම ළමුන්ගේ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීමට හා ළමා නිවාසගත ළමුන්ට හැකි ඉක්මනින් පවුල් පසුබිමක ජීවත්වීමේ අවස්ථාව උදාකරලීමට මෙම පළාත් වාර්තා බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව විශ්වාස කරමි.

සුධීර නිලංග විතාන
නියෝජ්‍ය කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## පූර්විකාව

ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ඒ සඳහා සැබවින්ම සමාජ යථාර්ථය පිළිඹිබු වන, එනම් සත්‍ය වශයෙන්ම සමාජය තුළ දක්නට ලැබෙන දත්ත පදනම් කරගැනීම එම ප්‍රතිපත්ති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මහඟු පිටිවහලක් වේ. ළමා නිවාසගතව සිටින ළමුන් සඳහා වඩාත් නිවැරදි මෙන්ම සාධාරණ වූ ප්‍රතිපත්ති සම්පාදනය පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වේ. මෙම අරමුණ පෙරදැරිව 2019 මාර්තු මස කැබිනට් මණ්ඩලය මගින් අනුමත කරන ලද ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය, ජාතික ක්‍රියාකාරී සැලැස්මක් හරහා ක්‍රියාවට නැංවීම සඳහා වන දත්ත අවශ්‍යතාවය සම්පූර්ණ කරගැනීමට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහයෝගය අපේක්ෂා කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාලේඛන ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත රජයේ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙන්ම සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මැනීම සඳහා අවශ්‍ය නිල සංඛ්‍යාති සකස් කිරීම නිතැතින්ම පැවරී ඇත. රට තුළ සංගණන හා සමීක්ෂණ පවත්වමින් දත්ත එක්රැස් කිරීම සඳහා බලය හිමිව ඇති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට ළමා නිවාසගත ළමුන් පිළිබඳව සංගණනයක් පවත්වා දත්ත රැස් කර දීමේ අභියෝගය භාරගන්නා ලදී.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 1987 වර්ෂයේ දී ගෙන එන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභාවලට බලය පැවරීම සමග පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයය පළාත් සභා වෙත විමධ්‍යගත කරන ලදි. එබැවින් මෙම කර්තව්‍යයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මධ්‍යම රජය යටතේ ඇති පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමග මෙන්ම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සමග ද සහයෝගයෙන් කටයුතු කරමින් සංගණනය සඳහා අදාළ සියලුම ළමා රැකවරණ මධ්‍යස්ථාන ආවරණය වන බවට තහවුරු කරගන්නා ලදී.

මෙම සංගණනය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය මගින් සිදු කරන ලද අතර දත්ත එක්රැස් කිරීම ප්‍රධාන වශයෙන්ම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවලට අනුබද්ධිත කාර්ය මණ්ඩලය විසින් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහයෝගය ද ඇතිව සිදු කරන ලදී.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව මගින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නවතම කාලීන වාර්තාවල නිරීක්ෂණ මගින් නැවත නැවතත් නිර්දේශ කර ඇත්තේ නොසලකාහැරීම්වලට ලක්වන හා අවදානම් තත්ත්වයේ පසුවන ළමුන් සම්බන්ධයෙන් දත්ත යාවත්කාලීනව රැස් කිරීම තහවුරු කරන ලෙසය. මෙම සංගණනයේ ප්‍රතිඵල ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැලසුම් කිරීම සඳහා උපකාරී වනවා පමණක් නොව මෙහි අතුරු ප්‍රතිඵලයක් ලෙස ඉහත කමිටුවේ ප්‍රධාන නිර්දේශ වලින් එකක් වන ළමා රැකවරණ මධ්‍යස්ථානගත ළමුන් සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් සකස් කිරීම ඉටු කර ගැනීමට ද උපකාරී වේ.

ළමා අයිතිවාසිකම් පිළිබඳව සම්මුතියේ 20 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි අනාථ, අත්හල, අසරණ, වින්දිත, සැකකරු හෝ වරදකරු වශයෙන් ළමා රැකවරණ මධ්‍යස්ථානගතව සිටින ළමුන්ගේ අභිවෘද්ධිය උදෙසා මෙම සංගණනයේ දත්ත ඉවහල් කරගත හැකිවනු ඇතැයි යන්න ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඒකායන බලාපොරොත්තුව වේ.

පී.එම්.පී. අනුර කුමාර
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්

## ස්තූතිය

ශ්‍රී ලංකාවේ පළමු වරට පවත්වන ලද ළමා නිවාසගත ළමුන් පිළිබඳ සංගණනය සාර්ථක කරගැනීම සඳහා විවිධ ආයතන මගින් හා විවිධ පුද්ගලයන් විසින් නන් අයුරින් සහයෝගය ලබා දෙන ලදී. මෙම සංගණනය සාමූහික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වුව ද, මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ලැබුණු පහත සඳහන් විශේෂ දායකත්වයන් වෙනුවෙන් ස්තූතිය පුද කරමි.

- මෙම සංගණන ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා ඉටු කරන ලද කාර්යභාරය වෙනුවෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පී.එම්.පී. අනුර කුමාර මහතාට හා හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අයි.ආර්. බණ්ඩාර මහත්මියට ස්තූතිය පුද කරමි.

- සංගණනය සාර්ථක ලෙස සැලසුම් කරගැනීම සඳහා මෙන්ම සංගණන දත්ත තහවුරු කරගැනීම සඳහා ද නොමඳ සහයෝගයක් ලබා දුන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ හිටපු කොමසාරිස් චන්දිමා සිගේරා මහත්මිය හා මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා අගනා දායකත්වයක් ලබා දුන් වර්තමාන කොමසාරිස් ධූරයේ රාජකාරී ආවරණය කරන සුධීර නිලංග විතාන මහතා කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

- මෙම කාර්යය වෙනුවෙන් අප නිරන්තරයෙන් දිරිගන්වමින් අවශ්‍ය සහයෝගය ලබා දුන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් වන ඩී.ඩී.ජී.ඒ. සෙනෙවිරත්න මහත්මිය හා කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න මහත්මිය, සංගණන ක්ෂේත්‍ර රාජකාරි වෙනුවෙන් කාර්ය මණ්ඩලය මුදාහරිමින් සහයෝගය දැක්වූ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අංශ භාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ අංශ ප්‍රධාන මහත්ම මහත්මීන් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

- මෙම කාර්යය සඳහා සහයෝගය ලබා දුන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරුන් වන සඳරේඛා ලියනගේ හා හර්ෂිකා එදිරිවීර මහත්මීන් ද, විශේෂයෙන්ම මෙම කාර්යය ආරම්භයේ සිට අවසානය දක්වා සියලු සම්බන්ධීකරණ කටයුතු කරමින් අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදුන් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී නිර්මලී පෙරේරා මහත්මිය ද, මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා නොමඳ සහයෝගයක් ලබා දුන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරී අරුණි සිරිසේන මෙනෙවිය ද ස්තූති පූර්වකව සිහිපත් කරමි.

- මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා මහඟු සහයෝගයක් ලබා දුන් දකුණු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ට ද ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

- මෙම සංගණනයේ සැලසුම් කටයුතු සඳහා මෙන්ම දත්ත රැස් කිරීමේ කටයුතු සඳහා විවිධ අදියරවලදී නොමඳ සහයෝගයක් ලබා දුන් දකුණු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සියලු ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරීවරුන්ට, පරිවාස නිලධාරීවරුන්ට හා අනෙකුත් කාර්ය මණ්ඩලවලට විශේෂ ස්තූතිය පිරිනමමි.

- මෙම සංගණනයේ දත්ත එක්රැස් කිරීමේ කටයුතු සිදු කළ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවලට අනුයුක්ත සියලු නිලධාරීන්ටත්, ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සියලු නිලධාරීන්ටත්, දත්ත එක් රැස් කිරීමේ කටයුතු අධීක්ෂණය කරමින් සහයෝගය ලබා දුන් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන් වන නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ නිලධාරීන්ටත් විශේෂ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

- සංගණන දත්ත රැස්කිරීම සාර්ථක කරගැනීමට නන් අයුරින් සහයෝගය දැක්වූ ළමා රැකවරණ මධ්‍යස්ථාන ප්‍රධානීන්ට හා කාර්යය මණ්ඩලවලට ස්තූතිය පුද කරමි.

- මෙම වාර්තාව සකස් කිරීම සහ පිටු සැකසුම් කටයුතු සිදු කළ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී අයි.ජී.සෙනෙවිරත්න මහතා හා සංඛ්‍යාලේඛන නිලධාරී එච්.පී.ඩී.එන්.දේවප්‍රිය මහත්මිය, මෙම කාර්යය අධීක්ෂණය කරමින් අවශ්‍ය මගපෙන්වීම් සිදුකළ පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශයේ අධ්‍යක්ෂ යූ.වී. ජයකොඩි මහත්මිය ස්තූති පූර්වකව සිහිපත් කරමි.

- මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා විවිධ ආකාරයෙන් සහයෝගය ලබා දුන් අනෙකුත් සියලුම පාර්ශ්වයන්ට ද ස්තූතිය පුදකර සිටිමි.

## පටුන


පෙරවදන ........ iii
පූර්විකාව ........ v
ස්තුතිය ........ vii
පටුන ........ ix
වගු ලැයිස්තුව ........ x
රූප සටහන් ලැයිස්තුව ........ xiii

1 වන පරිච්ඡේදය
ශ්‍රී ලංකාව තුළ ළමුන් ආයතනගත කිරීම ........ 01
1.1 හැඳින්වීම ........ 01
1.2 ළමුන් ආයතනගත කිරීම ........ 01
1.3 ශ්‍රී ලංකාව තුළ ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන වර්ග ........ 03

2 වන පරිච්ඡේදය
සංගණනයේ පසුබිම හා සංගණන ක්‍රමවේදය ........ 05
2.1 සංගණනයේ පසුබිම ........ 05
2.2 සංගණනය සැලසුම් කිරීම ........ 05
2.3 සංගණන ඒකක ලැයිස්තුගත කිරීම ........ 06
2.4 උපලේඛන සකස් කිරීම ........ 06
2.5 ක්ෂේත්‍ර කටයුතු සැලසුම් කිරීම ........ 07
2.6 දත්ත එක්රැස් කිරීම ........ 07
2.7 දත්ත සැකසුම් කටයුතු ........ 07
2.8 සංගණනයේ සීමාවන්........ 07

3 වන පරිච්ඡේදය
ළමා රැකවරණ මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු ........ 08
3.1 ආයතන වර්ගය, ක්‍රියාකාරීත්වයේ ස්වභාවය සහ අරමුදල් සම්පාදනය ........ 08
3.2 ළමුන් සඳහා ලබා දෙන පහසුකම් හා සේවාවන් ........ 10
3.3 ආයතනික වත්කම් ........ 15
3.4 ආයතනික කමිටු රැස්වීම් ........ 16

4 වන පරිච්ඡේදය
ළමා රැකවරණ මධ්‍යස්ථානගත ළමුන් පිළිබඳ තොරතුරු ........ 17
4.1 ළමුන් පිළිබඳ මූලික තොරතුරු ........ 17
4.2 ළමුන් ආයතනගත කිරීම පිළිබඳ තොරතුරු ........ 21
4.3 අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු ........ 34
4.4 ළමයාගේ චර්යා රටාවන්, රෝගී සහ ආබාධිත තත්ත්වයන් පිළිබඳ තොරතුරු ........ 38
4.5 ළමුන්ගේ දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ තොරතුරු ........ 40
4.6 ළමුන්ගේ සහෝදර/ සහෝදරියන් පිළිබඳ තොරතුරු ........ 48
4.7 ළමුන් සමාජගත කිරීම පිළිබඳ තොරතුරු ........ 49

5 වන පරිච්ඡේදය
කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ........ 52
5.1 මූලික තොරතුරු ........ 52
5.2 රැකියාව පිළිබඳ තොරතුරු ........ 53
5.3 අධ්‍යාපනය/ වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු ........ 56

6 වන පරිච්ඡේදය
ප්‍රතිපත්තිමය ඇගයීම ........ 58

## වගු ලැයිස්තුව

3 වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| වගුව 3.1 | දිස්ත්‍රික්කය හා ආයතන වර්ගය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 08 |
| වගුව 3.2 | ආයතනයේ ස්වභාවය හා දිස්ත්‍රික්කය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 09 |
| වගුව 3.3 | ආයතන වර්ගය හා ආයතනය පවත්වාගෙන යාමට අරමුදල් ලැබෙන ප්‍රධාන මූලාශ්‍රය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 09 |
| වගුව 3.4 | ළමුන් සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ සේවාවන් සැපයීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 10 |
| වගුව 3.5 | ආයතන වර්ගය හා ළමුන්ගේ පරිශීලනය සඳහා පුවත්පත් සහ සඟරා මිල දී ගැනීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 11 |
| වගුව 3.6 | ආයතන වර්ගය හා ළමුන් සඳහා ආයතනය තුළ පුස්තකාල පහසුකම් ලබා දී තිබීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 12 |
| වගුව 3.7 | ළමුන් සඳහා සෞඛ්‍ය පහසුකම් සැපයීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 12 |
| වගුව 3.8 | ළමුන්ගේ පරිශීලනය/ක්‍රියාකාරකම් සඳහා විශේෂ ස්ථාන වෙන්කර ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන | 13 |
| වගුව 3.9 | ළමුන් සඳහා වෙන් කර ඇති ඇඳන් සංඛ්‍යාවේ ප්‍රමාණවත් භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 13 |
| වගුව 3.10 | අතිරික්ත ළමුන් සංඛ්‍යාවක් රඳවා සිටින ළමා රැකවරණ මධ්‍යස්ථාන ආයතන වර්ගය අනුව | 14 |
| වගුව 3.11 | ළමුන් සඳහා වෙන් කරන ලද වැසිකිළිවල ප්‍රමාණවත්භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 14 |
| වගුව 3.12 | බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 14 |
| වගුව 3.13 | මෝටර් වාහන හිමිකාරීත්වය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 15 |
| වගුව 3.14 | ආයතනයට අයත් මුළු භූමි ප්‍රමාණය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 16 |
| වගුව 3.15 | ආයතන වර්ගය හා ස්ථාපන කමිටු/ බලපත්‍ර කමිටු/ විෂය කමිටු රැස්වීම් පැවැත්වීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 16 |
| වගුව 3.16 | 2019 වසර තුළ පවත්වා ඇති ස්ථාපන කමිටු/ බලපත්‍ර කමිටු/ විෂය කමිටු රැස්වීම් සංඛ්‍යාව අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 16 |


4 වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| වගුව 4.1 | දිස්ත්‍රික්කය, ආයතන වර්ගය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 17 |
| වගුව 4.2 | දිස්ත්‍රික්කය, වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 18 |
| වගුව 4.3 | ජාතිය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 19 |
| වගුව 4.4 | ආගම හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 19 |
| වගුව 4.5 | දිස්ත්‍රික්කය හා ළමයා උපදින විට මව බාලවයස්කාරියක් ද යන වග අනුව ආයතනගත ළමුන් | 19 |
| වගුව 4.6 | ආයතන වර්ගය හා උපත ලියාපදිංචියේ ස්වභාවය අනුව ආයතනගත ළමුන් | 20 |
| වගුව 4.7 | ආයතන වර්ගය හා උපත ලියාපදිංචි කළ ලියවිල්ල අනුව උපත ලියාපදිංචි කරන ලද ආයතනගත ළමුන් | 20 |
| වගුව 4.8 | වර්තමාන ආයතනයට ඇතුළත් කරන විට ළමයාගේ වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 21 |
| වගුව 4.9 | මුල්වරට ආයතනගත කරන විට ළමයාගේ වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 21 |
| වගුව 4.10 | ආයතනගත කරන ලද වර්ෂය අනුව ආයතනගත ළමුන් | 21 |
| වගුව 4.11 | ආයතනගත වන අවස්ථාව වන විට ළමයා පදිංචිව සිටි ස්ථානය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 22 |
| වගුව 4.12 | ආයතනගත වන අවස්ථාව වන විට ළමයා ජීවත්ව සිටියේ කා සමග ද යන්න හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 22 |
| වගුව 4.13 | ආයතනගත වූ ආකාරය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 23 |

| | | |
|---|---|---|
| වගුව 4.14 | දිස්ත්‍රික්කය, ආයතනගතවීමට හේතුව හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 23 |
| වගුව 4.15 | දිස්ත්‍රික්කය, ආයතනගත වීමට හේතුව හා වයස් කාණ්ඩය අනුව ආයතනගත ළමුන් | 25 |
| වගුව 4.16 | කවදා හෝ අසරණභාවයට පත් ආයතනගත ළමුන් දිස්ත්‍රික්කය, අසරණභාවයට හේතුව/ හේතු හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 27 |
| වගුව 4.17 | කවදා හෝ අසරණභාවයට පත් ආයතනගත ළමුන් අසරණභාවයට හේතුව/ හේතු හා වයස් කාණ්ඩය අනුව | 29 |
| වගුව 4.18 | කවදා හෝ වින්දිතභාවයට පත් ආයතනගත ළමුන් දිස්ත්‍රික්කය, වින්දිතභාවයට හේතුව/ හේතු හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 30 |
| වගුව 4.19 | කවදා හෝ වින්දිතභාවයට පත් ආයතනගත ළමුන් වින්දිතභාවයට හේතුව/ හේතු හා වයස් කාණ්ඩය අනුව | 32 |
| වගුව 4.20 | සැකකරුවන්/ වරදකරුවන් ලෙස ආයතනගතව සිටින ළමුන් දිස්ත්‍රික්කය, සැකකරුවකු/ වරදකරුවකු වීමට හේතුව/ හේතු හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 33 |
| වගුව 4.21 | සැකකරුවන්/ වරදකරුවන් ලෙස ආයතනගතව සිටින ළමුන් සැකකරුවකු/ වරදකරුවකු වීමට හේතුව/ හේතු හා වයස් කාණ්ඩය අනුව | 33 |
| වගුව 4.22 | දිස්ත්‍රික්කය, ආයතන වර්ගය හා අධ්‍යාපන කටයුත්තක නිරතවීම අනුව අවුරුදු 3 හා ඊට වැඩි ආයතනගත ළමුන් | 34 |
| වගුව 4.23 | ස්ත්‍රී/ පුරුෂ භාවය, වයස් කාණ්ඩය, අධ්‍යාපන කටයුත්තක නිරතවීම අනුව අවුරුදු 3 හා ඊට වැඩි ආයතනගත ළමුන් | 35 |
| වගුව 4.24 | දැනට නිරත වන අධ්‍යාපන කටයුත්ත හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව අවුරුදු 3 හා ඊට වැඩි ආයතනගත ළමුන් | 35 |
| වගුව 4.25 | දැනට අධ්‍යාපනය නොලබන අවුරුදු 3 හා ඊට වැඩි ආයතනගත ළමුන් එයට හේතුව හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 36 |
| වගුව 4.26 | ලබා ඇති ඉහළ ම අධ්‍යාපන සුදුසුකම හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව අවුරුදු 6 හා ඊට වැඩි ආයතනගත ළමුන් | 36 |
| වගුව 4.27 | ස්ත්‍රී/ පුරුෂ භාවය, වයස් කාණ්ඩය හා සාක්ෂරතාවය අනුව අවුරුදු 6 හා ඊට වැඩි ආයතනගත ළමුන් | 37 |
| වගුව 4.28 | ආයතනගතව සිටින පිළිගත් වෘත්තීය සුදුසුකමක් සහිත අවුරුදු 16 හා ඊට වැඩි ළමුන් ස්ත්‍රී/ පුරුෂ භාවය හා වයස අනුව | 37 |
| වගුව 4.29 | සාමාන්‍ය නිරීක්ෂණය අනුව ළමයාගේ හැසිරීම් රටාව හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 38 |
| වගුව 4.30 | දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ආයතනගත ළමුන් වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 38 |
| වගුව 4.31 | දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ආයතනගත ළමුන් රෝගය/ ආබාධය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 39 |
| වගුව 4.32 | දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ආයතනගත ළමුන් රෝගය/ ආබාධය හා වයස් කාණ්ඩය අනුව | 39 |
| වගුව 4.33 | දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන සහ ඒ සඳහා ප්‍රතිකාර ලබා ගන්නා ආයතනගත ළමුන් ස්ත්‍රී/ පුරුෂ භාවය හා වයස් කාණ්ඩය අනුව | 40 |
| වගුව 4.34 | දිස්ත්‍රික්කය හා ආයතනගත කරන අවස්ථාව වන විට භාරකාරිත්වයේ ස්වභාවය අනුව ආයතනගත ළමුන් | 40 |
| වගුව 4.35 | දිස්ත්‍රික්කය, ආයතනගත කරන අවස්ථාව වන විට දෙමව්පියන් ජීවත්වූයේ ද යන්න හා ස්ත්‍රී/ පුරුෂභාවය අනුව ආයතනගත ළමුන් | 41 |
| වගුව 4.36 | ආයතනගත කරන අවස්ථාව වන විට පියාගේ තොරතුරු අනුව ආයතනගත ළමුන් | 42 |
| වගුව 4.37 | ආයතනගත කරන අවස්ථාව වන විට මවගේ තොරතුරු අනුව ආයතනගත ළමුන් | 42 |
| වගුව 4.38 | ආයතනගත කරන අවස්ථාව වන විට භාරකරුවෙක් යටතේ සිටි ළමුන් භාරකරුට තිබූ ඥාතිත්වය හා භාරකරු ඒ වන විට පදිංචියට සුදුසු වාසස්ථානයක ජීවත්ව සිටියේද යන්න අනුව | 43 |
| වගුව 4.39 | ආයතනගත කරන අවස්ථාව වන විට භාරකරුවෙක් යටතේ සිටි ළමුන් භාරකරුගේ තොරතුරු අනුව | 44 |
| වගුව 4.40 | වර්තමාන භාරකාරිත්වයේ ස්වභාවය අනුව ආයතනගත ළමුන් | 45 |
| වගුව 4.41 | පියාගේ වර්තමාන තොරතුරු අනුව ආයතනගත ළමුන් | 45 |

| | | |
|---|---|---|
| වගුව 4.42 | මවගේ වර්තමාන තොරතුරු අනුව ආයතනගත ළමුන් | 46 |
| වගුව 4.43 | වර්තමානයේ මව/ පියා නොවන වෙනත් භාරකරුවෙක් සිටින ආයතනගත ළමුන් භාරකරුගේ තොරතුරු අනුව | 47 |
| වගුව 4.44 | ළමයාට සිටින සහෝදර/ සහෝදරියන් සංඛ්‍යාව අනුව ආයතනගත ළමුන් | 48 |
| වගුව 4.45 | සහෝදර/ සහෝදරියන් සිටින ආයතනගත ළමුන් එම සහෝදර/ සහෝදරියන් දැනට ජීවත්වන ස්ථානය අනුව | 48 |
| වගුව 4.46 | ස්ත්‍රී/ පුරුෂ භාවය, වයස් කාණ්ඩය හා ළමයා සමාජගත කිරීම සඳහා කෙදිනක හෝ කිසියම් උත්සාහයක් දරා තිබේද යන්න අනුව ආයතනගතව සිටින ළමුන් | 49 |
| වගුව 4.47 | සමාජගත කිරීම සඳහා උත්සාහ කරන ලද ආයතනගත ළමුන් සමාජගත කිරීමට මෙතෙක් කරන ලද/ මේ වන විට කරමින් පවතින උත්සාහයන් හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 50 |
| වගුව 4.48 | සමාජගත කිරීම සඳහා උත්සාහ නොකරන ලද ආයතනගත ළමුන් එසේ නොකිරීමට හේතුව/ හේතු හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 50 |
| වගුව 4.49 | කුලවැද්දීමේ ක්‍රියාවලියකට (දේශීය/ විදේශීය) ඇතුළත් කර ඇති ආයතනගත ළමුන් කුලවැද්දීම සඳහා මේ වන විට සිදුකර ඇති/ සිදුකරමින් පවතින ක්‍රියාමාර්ග හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව | 51 |
| වගුව 4.50 | සමාජගත කිරීම සඳහා උත්සාහ කර ඇති නමුත් කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර නොමැති ආයතනගත ළමුන් එයට හේතුව අනුව | 51 |


5 වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| වගුව 5.1 | ආයතන වර්ගය හා දිස්ත්‍රික්කය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 52 |
| වගුව 5.2 | වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 52 |
| වගුව 5.3 | රැකියාව හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 53 |
| වගුව 5.4 | සේවා කාලය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 54 |
| වගුව 5.5 | රැකියාවේ ස්වභාවය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 55 |
| වගුව 5.6 | සේවයේ නිරතවීමේ ස්වභාවය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 55 |
| වගුව 5.7 | ඉහළ ම අධ්‍යාපන සුදුසුකම හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 56 |
| වගුව 5.8 | වර්තමාන රැකියාවට අදාළ වන වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 56 |

## රූප සටහන් ලැයිස්තුව


3 වන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| රූප සටහන 3.1 | දිස්ත්‍රික්කය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 08 |
| රූප සටහන 3.2 | ආයතනය පවත්වාගෙන යාමට අරමුදල් ලැබෙන ප්‍රධාන මූලාශ්‍රය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථානවල ප්‍රතිශත ව්‍යාප්තිය | 09 |
| රූප සටහන 3.3 | ළමුන්ගේ පරිශීලනය සඳහා පුවත්පත් සහ සඟරා මිල දී ගැනීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථානවල ප්‍රතිශත ව්‍යාප්තිය | 11 |
| රූප සටහන 3.4 | බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 15 |
| රූප සටහන 3.5 | මෝටර් වාහන හිමිකාරීත්වය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 15 |
| රූප සටහන 3.6 | ආයතනයට අයත් මුළු භූමි ප්‍රමාණය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන | 16 |

4 වන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| රූප සටහන 4.1 | දිස්ත්‍රික්කය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 18 |
| රූප සටහන 4.2 | වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන් | 19 |
| රූප සටහන 4.3 | ජාතිය අනුව ආයතනගත ළමුන් | 19 |
| රූප සටහන 4.4 | ආයතනගත කරන ලද වර්ෂය අනුව ආයතනගත ළමුන් | 21 |
| රූප සටහන 4.5 | ආයතනගත වන අවස්ථාව වන විට ළමයා ජීවත්ව සිටියේ කා සමග ද යන්න අනුව ආයතනගත ළමුන් | 23 |
| රූප සටහන 4.6 | ආයතනගත වූ ආකාරය අනුව ආයතනගත ළමුන් | 23 |
| රූප සටහන 4.7 | ආයතනගත වීමට හේතුව අනුව ආයතනගත ළමුන් | 24 |
| රූප සටහන 4.8 | ආයතන වර්ගය හා අධ්‍යාපන කටයුත්තක නිරතවීම අනුව ආයතනගත ළමුන් | 35 |
| රූප සටහන 4.9 | ආයතනගත කරන අවස්ථාව වන විට භාරකාරීත්වයේ ස්වභාවය අනුව ආයතනගත ළමුන් | 41 |
| රූප සටහන 4.10 | ආයතනගත කරන අවස්ථාව වන විට දෙමව්පියන් ජීවත්වූයේ ද යන්න අනුව ආයතනගත ළමුන් | 42 |
| රූප සටහන 4.11 | ආයතනගත කරන අවස්ථාව වන විට භාරකරුවෙක් යටතේ සිටි ළමුන් භාරකරුට තිබූ ඥාතිත්වය අනුව | 44 |
| රූප සටහන 4.12 | වර්තමාන භාරකාරීත්වයේ ස්වභාවය අනුව ආයතනගත ළමුන් | 45 |
| රූප සටහන 4.13 | ළමයාට සිටින සහෝදර/ සහෝදරියන් සංඛ්‍යාව අනුව ආයතනගත ළමුන් | 48 |

5 වන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| රූප සටහන 5.1 | වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 53 |
| රූප සටහන 5.2 | රැකියාවේ ස්වභාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 55 |
| රූප සටහන 5.3 | ඉහළ ම අධ්‍යාපන සුදුසුකම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය | 56 |

## 1 වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකාව තුළ ළමුන් ආයතනගත කිරීම

### 1.1. හැඳින්වීම

සිය න්‍යෂ්ඨික පවුල තුළ හෝ විස්තෘත පවුල තුළ රැකවරණය අහිමි වන ළමුන්, විකල්ප රැකවරණ ක්‍රමයක් ලෙස ආයතනික රැකවරණයක් කරා යොමු කිරීම දැනට ශ්‍රී ලංකාව තුළ ප්‍රායෝගිකව සිදු කරනු ලබන ක්‍රියාදාමය වේ. මෙම ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද්දේ යටත් විජිත පාලන සමයේදී වන අතර 1930, 1940 දශක තුළ ළමයින් සම්බන්ධ නීති බලාත්මක කිරීමත් සමග ආයතනික රැකවරණය ලබා දීම විධිමත් ක්‍රමයක් බවට පරිවර්තනය විය. එතැන් සිට ළමා සැකකරුවන්, ළමා වරදකරුවන්, අනාථ හා අත්හල ළමුන් මෙන්ම රැකවරණය හා ආරක්ෂාව අවශ්‍ය ළමුන් ද විකල්පමය රැකවරණය ලබාදීම සඳහා අධිකරණ ක්‍රියාවලියක් මගින් ළමා රැකවරණ මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ.

වර්තමාන සමාජය තුළ ළමුන් සඳහා රැකවරණය හා ආරක්ෂාව ලබා දීම අතිශය ගැටලුකාරී තත්ත්වයක් පෙන්නුම් කළ ද අතීත ශ්‍රී ලාංකික පාරම්පරික සමාජය තුළ ළමුන්හට අවශ්‍ය රැකවරණය හා ආරක්ෂාව සැලසීම සමස්ත සමාජයේම වගකීමක් විය. එනම් තම ජීව විද්‍යාත්මක පවුල, විස්තෘත පවුල, අසල්වාසීන්, ඥාතීන්, මිතුරන් මෙන්ම ප්‍රදේශයේ ජීවත්වන සමස්ත ප්‍රජාවම ළමුන්ගේ ආරක්ෂාව රැකවරණය වෙනුවෙන් තම වගකීම ස්වේච්ඡාවෙන්ම ඉටු කරන ලදී. එහෙත් ක්‍රමයෙන් කාලයත් සමග සමාජයේ ඇති වූ ආර්ථික, දේශපාලන, සංස්කෘතික පරිවර්තනයන් හේතුවෙන් සමාජය තුළ පවුල හුදෙකලා ඒකකයක් බවට පත්විය. එසේම ආර්ථික අභියෝගවලට මුහුණදීමේ දී පියාට අමතරව මව ද ආර්ථික කටයුතුවල නිරතවීම හේතුවෙන් පවුල තුළ ද ළමයා හුදෙකලා තත්ත්වයට පත්වීම ආරම්භ විය. ඒ සමගම මෙතෙක් කල් තමා ජීවත්වන සමාජය හා පවුල තුළින් ළමයාට ලැබී තිබූ රැකවරණය ක්‍රමයෙන් ගිලිහීම ආරම්භ විය. එසේම දෙමව්පියන් දික්කසාද වීම/ වෙන්ව ජීවත්වීම, දැඩි ආර්ථික අර්බුදවලට මුහුණ දීම හා දිගු කාලීන රෝග හා ආබාධිත තත්ත්වයන්ගෙන් පෙළීම වැනි හේතු නිසා දරුවන් රැකබලාගැනීමට දෙමව්පියන්ට නොහැකි වීම තුළ ළමයින් අසරණ තත්ත්වයට පත්විය. මෙවැනි හේතුවල බලපෑමෙන් පසුගිය දශක කිහිපය තුළ අනාථ හා අත්හල කාණ්ඩවලට සාපේක්ෂව අසරණ ළමුන් ආයතනගත කිරීමේ කැපී පෙනෙන වර්ධනයක් නිරීක්ෂණය විය.

ආර්ථික හා සමාජයීය සාධකවලට අමතරව ගෝලීය වසංගත තත්ත්වයන් හා ස්වභාවික මෙන්ම මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසනයන් ද ළමයින්ගේ රැකවරණයට හා ආරක්ෂාවට තර්ජනයක් වී තිබේ. උදාහරණයක් ලෙස මේ වන විට ආයතනික රැකවරණය යටතේ සිටින ළමුන්ගෙන් සැලකිය යුතු පිරිසකට තම පවුලෙන් වෙන්වීමට සිදුව ඇත්තේ විවිධ විපත් හේතුවෙන් දෙමව්පියන්/ භාරකරුවන් අහිමිවීම, දෙමව්පියන්/ භාරකරුවන් ආබාධිත තත්ත්වයන්ට පත්වීම හෝ තම පදිංචි ස්ථානය අහිමිවීම වේ.

කෙසේ වෙතත් දෙමව්පියන්ගේ රැකවරණය අහිමි වූ ළමයකු ආයතනික රැකවරණයට යොමු කළ යුත්තේ වෙනත් කිසිඳු විකල්ප රැකවරණ ක්‍රමයක් නොමැති අවස්ථාවක අවසාන පියවර වශයෙන් පමණක් බව ළමයින්ගේ විකල්ප රැකවරණය සඳහා වන එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ මගින් ද මතුකර දක්වා ඇති අතර ළමයකු ඔහුගේ/ ඇයගේ ස්වභාවික පවුලෙන් වෙන්වුවහොත් එම ළමයාට විකල්ප රැකවරණ ලබා දීමේදී රජය අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ද මෙමගින් දක්වයි.

ආයතනගත වූ ළමයකු නැවත සමාජගත කළ පසුව සමාජය තුළින් ද එම ළමයා අපකීර්තියට ලක්කිරීම සුලභව නිරීක්ෂණය වන කරුණකි. එබැවින් මේ වන විට ඇතැම් සංවිධාන ආයතනගත ළමයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් හඬනගමින් සිටින අතර උප්පැන්න සහතික නොමැති වීම, සමාජය තුළදී සමාන අවස්ථා අහිමිවීම, වෙනත් විකල්ප රැකවරණයක් ලබා ගැනීම සඳහා අවස්ථාව අහිමිවීම යනාදිය හේතුවෙන් මෙවැනි ළමයින්ට නිරන්තරයෙන් මුහුණපෑමට සිදුවන ගැටලුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් ද මෙම සංවිධාන අවධානය යොමු කර ඇත.

ස්වභාවික පවුල තුළදී අනාරක්ෂිත වූ හෝ අතවරයට ලක් වූ ළමයකු ස්වභාවික පවුලෙන් තාවකාලිකව වෙන් කළ යුතු වුව ද දීර්ඝ කාලීනව ආයතනගත කිරීම හේතුවෙන් එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් තුළ මානසික ගැටලු ද වර්ධනය විය හැකිය. උදාහරණයක් ලෙස ළමා මව්වරුන්ගේ තත්ත්වය පෙන්වා දිය හැකි ය. ඇතැම් විට ළමා ආරක්ෂණ පද්ධතිය තුළදීම ළමයාට ද්විතියිකව ද හිංසනයට ලක්වීමට සිදුවිය හැකිය.

### 1.2. ළමුන් ආයතනගත කිරීම

ළමුන් සඳහා ආයතනික රැකවරණය සැලසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක අණපනත් කිහිපයක් මගින් නීතිමය විධිවිධාන සලසා දී ඇත. එම අණ පනත් නම්,

1. 1939 අංක 48 දරණ (1956 සංශෝධන) ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනත
2. 1941 අංක 22 දරණ (1956 සංශෝධන) අනත්දරු නිවාස ආඥාපනත/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය
3. 1907 අංක 05 දරණ නිවර්තන නිවාස ආඥාපනත
4. 1841 අංක 04 දරණ අයාල ආඥාපනත

ශ්‍රී ලංකාව තුළ ළමුන් ආයතනගත කිරීමේදී ප්‍රධාන වශයෙන් ක්‍රම දෙකක් භාවිතා කෙරේ. අවුරුදු 16ට අඩු ළමා වින්දිතයන්, ළමා සැකකරුවන් හා ළමා වරදකරුවන් අධිකරණ නියෝගයක් මත ආයතනගත කිරීම මින් පළමු ක්‍රමය වන අතර ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනත මගින් මේ සඳහා ප්‍රතිපාදන සලසා ඇත. ළමා වින්දිතයෙක් වශයෙන් ළමයෙක් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු අදාළ සියලුම පාර්ශ්වකරුවන් විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය සඳහන් කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශ (Case Management Guidelines) නිකුත්කොට ඇත. දෙවන ක්‍රමය වන්නේ අනාථ, අත්හල හා අසරණ ගණයෙහිලා සැලකෙන ළමුන් සම්බන්ධයෙන් දෙමව්පියන්/ භාරකරුවන් හෝ වෙනත් අදාළ පාර්ශ්වයක් විසින් කරන ලද ඉල්ලීමකට අනුව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ අනුමැතිය මත එම ළමුන් ආයතනගත කිරීම වේ. මේ සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය මගින් ප්‍රතිපාදන සලසා දී අත.

කෙසේ වුව ද ඉහත අණ පනත්වල නීතිමය ප්‍රතිපාදන නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් හා ආයතනගත කිරීම හෝ පුනරුත්ථාපනය සඳහා ඇති වෙනත් විකල්ප ක්‍රම භාවිතා කිරීම අවම මට්ටමක පැවතීම හේතුවෙන් වර්තමානයේ ළමයින් සඳහා ආයතනික රැකවරණය ලබා දීම පහසු ක්‍රමයක් ලෙස සලකා කටයුතු කරන බවක් දක්නට ලැබේ.

අනාථ, අත්හල හා අසරණ ළමුන් සඳහා ස්වේච්ඡා ළමා නිවාස තුළ තාවකාලිකව නේවාසික රැකවරණය සැලසීම ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියෙහි හා අනත්දරු නිවාස ආඥාපනතෙහි විධිවිධාන ප්‍රකාරව සිදු කරනු ලැබේ. මෙම ආයතන තුළ ඉතා කෙටි කාලයක් සඳහා ළමුන් රඳවා තැබිය හැකි අතර හැකි ඉක්මනින් මෙම ළමුන් පවුල වෙත නැවත යොමු කිරීම සඳහා විශේෂ වැඩසටහන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම අතිශයින් වැදගත් වන බව මෙහිදී අවධාරණය කර ඇත. මෙවැනි විශේෂ වැඩසටහන්වලට උදාහරණ ලෙස පවුල වෙත මූල්‍යමය සහනාධාර ලබා දීම, මගපෙන්වීම් හා උපදේශන සේවා සැපයීම හා පෝෂිත මාපිය ක්‍රමයක් (Foster parent system) ඇති කිරීම පෙන්වා දිය හැකිය.

උසාවියට ඉදිරිපත් කරන ළමා වින්දිතයන්, ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත යටතේ සහතික කළ පාසල්වලට ඇතුළත් කරනු ලබන අතර මීට අමතරව එම පනතේ 35 වන වගන්තිය ප්‍රකාරව මෙම ළමයින් සුදුසු පුද්ගලයකුගේ (Fit person) රැකවරණය යටතට පත් කළ හැකිය. මෙය පෝෂිත මාපිය ක්‍රමයට බෙහෙවින්ම සමාන වන අතර ළමයා ඥාති හෝ ඥාති නොවන සුදුසු පුද්ගලයකුගේ භාරයට පත්කිරීමට මෙහි නීතිමය විධිවිධාන ඇත. කෙසේ වුව ද ඥාතීන් නොවන දෙමව්පියන් හඳුනාගෙන ළමයින් එම දෙමව්පියන්ට භාරදීමේ ක්‍රමවේදයක් රට තුළ ප්‍රායෝගිකව දක්නට නොලැබේ.

ළමා වින්දිතයන් හා ළමා සැකකරුවන් ආයතනගත කර ආයතනික විශෝධනයට (Institutional corrections) ලක්කිරීමට අමතරව ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත මගින් දඬුවම් නියමයන් ද සපයනු ලබයි. මෙහිදී එවැනි දඬුවම් විධිවිධාන නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රජාපාදක පුනරුත්ථාපනයට භාජනය කළ නොහැකි ළමයින් පමණක් ආයතනගත කර නිවැරදි කිරීම් සිදුකිරීම් සඳහා යොමුකළ යුතුය. මීට අමතරව ළමා සැකකරුවන් උසාවියට ඉදිරිපත් කිරීම වෙනුවට සමථ මණ්ඩල පනතේ විධිවිධාන භාවිත කරමින් විසඳුම්වලට එළඹීමට හැකියාවක් ද ඇත.

ළමයා ආයතනගත කිරීමට බලපාන ලද හේතුව නොසලකා හරිමින් ආයතනගත ළමුන් නැවත සමාජගත කිරීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර ක්‍රියා පටිපාටීන් හඳුන්වා දී ඇති අතර මෙහිදී ස්වේච්ඡා ළමා නිවාස, සහතික කළ පාසල හා නිවර්තන නිවාසය යන ස්ථානවල රඳවා සිටින ළමයින් සමාජගත කිරීම සඳහා අදාළ වන තීරණ ගනු ලබන්නේ පිළිවෙලින් ස්ථාපන කමිටු, බලපත්‍ර කමිටු හා විෂය කමිටු මගිනි.

ආයතනගත කරන ලද ළමයකු නැවත සමාජගත කිරීම සඳහා වන වැඩසටහන සකස් කිරීම සැලසුම් කළ යුත්තේ තනි පුද්ගල සත්කාර සැලැස්මක් (Individual care plan) හරහා එම ළමයා ආයතනගත කරන ලද දින සිට වුව ද මේ වන විට එය නිසි පරිදි ක්‍රියාත්මක වීමක් දක්නට නොලැබේ. එක් එක් ළමයා සම්බන්ධව වෙන වෙනම සමීප අධීක්ෂණයක් පවත්වාගෙන යාම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ හා ජාතික ළමාරක්ෂක අධිකාරියේ නිලධාරීන්ගේ වගකීම වේ. මෙම අඛණ්ඩ අධීක්ෂණය නිසියාකාරව සිදු නොවීම හේතුවෙන් ඇතැම් ළමයින්ට ආයතන තුළ දීර්ඝ කාලයක් රැඳී සිටීමට සිදුවන අවස්ථා ද ඇත.

ළමා රැකවරණ මධ්‍යස්ථානගතව සිටින ළමුන් පිළිබඳව දීර්ඝ වශයෙන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව සකස් කරන ලද ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සඳහා 2019.03.06 දින කැබිනට් අනුමැතිය හිමිව ඇති අතර මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය පදනම් කරගෙන රට තුළ ශක්තිමත් විකල්ප රැකවරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මේ වන විට කටයුතු කරමින් සිටී. ඒ අනුව මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා මෙම සංගණනය දිවයින පුරා පිහිටි සියලු ළමා රැකවරණ මධ්‍යස්ථාන ආවරණය කරමින් සිදු කරන ලදී.

### 1.3. ශ්‍රී ලංකාව තුළ ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන වර්ග

වර්තමානය වන විට රට තුළ රජය මගින් හා රාජ්‍ය නොවන අංශය මගින් ක්‍රියාත්මක වන විවිධ අණ පනත් යටතේ ස්ථාපනය කරන ලද ළමා රැකවරණ මධ්‍යස්ථාන 379 ක් ඇති බව වාර්තා වී ඇත. පරිවාස විෂය පළාත් සභා වෙත විමධ්‍යගත කර ඇති විෂයයක් වන බැවින් 1987 වර්ෂයේ සිට මෙම ළමා රැකවරණ මධ්‍යස්ථානවල පරිපාලනය හා අධීක්ෂණය පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලැබේ.

| ආයතන වර්ගය | විස්තරය |
|---|---|
| රැඳවුම් නිවාස | ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනතේ 3 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර රැඳවුම් නිවාස ස්ථාපනය කර ඇත. ළමා වින්දිතයන් හා ළමා සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කර අධිකරණ නියෝගය ලබාගන්නා තුරු තාවකාලිකව රඳවා තබා ගැනීම රැඳවුම් නිවාස මගින් සිදු කරනු ලැබේ.<br>රැඳවුම් නිවාස රාජ්‍ය අංශය (පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව) මගින් පවත්වාගෙන යනු ලබන අතර සෑම පළාතක් තුළම ගැහැණු ළමයින් හා පිරිමි ළමයින් වෙනුවෙන් වෙන් වශයෙන් ආයතන 2ක් පවත්වාගෙන යා යුතු වේ. දකුණු පළාතෙහි ගාල්ල දිස්ත්‍රික්කය තුළ බාලක හා බාලිකා රැඳවුම් නිවාස දෙක පිහිටුවා ඇත. |
| ආරක්ෂිත ළමා නිවාස | ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනතේ 3 වන වගන්තිය අනුව ආරක්ෂිත ළමා නිවාස ද ස්ථාපනය කර ඇත. ළමා වින්දිතයන් හා ළමා සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කර අධිකරණය නියෝගය ලබාගන්නා තුරු තාවකාලිකව රඳවා තබා ගැනීම මෙ මගින් ද සිදු කරනු ලැබේ.<br>ආරක්ෂිත ළමා නිවාස ද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන අතර ඇතැම් පළාත් තුළ රැඳවුම් නිවාස වෙනුවට ස්ථාපනය කර ඇත. දකුණු පළාත තුළ ආරක්ෂිත ළමා නිවාස නැත. |
| සහතික කළ පාසල | ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනත යටතේ වරදකරුවන් වන ළමුන් ආයතනික විශෝධනය (Institutional corrections) සඳහා වසර 3ක කාලයක් මෙම ආයතනවල රඳවා තබා ගනී. තව ද භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමුන්ද වසර 3ක කාලයක් සඳහා මෙම ආයතනවලට ඇතුළත් කරනු ලැබේ.<br>සහතික කළ පාසල ද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතනයක් වන අතර සෑම පළාතක් තුළම ගැහැණු ළමයින් හා පිරිමි ළමයින් වෙනුවෙන් වෙන වෙනම ආයතන 2ක් පවත්වාගෙන යා යුතු වේ. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කය තුළ බාලක හා බාලිකා සහතික කළ පාසල් දෙක පිහිටුවා ඇත. |
| රජයේ භාරගැනීමේ ළමා නිවාස | අනත්දරු නිවාස ආඥාපනතේ/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියේ විධිවිධාන අනුව මෙම ආයතන ස්ථාපනය කර ඇත. වයස අවුරුදු 0-5 අතර අනාථ, අත්හල හා අසරණ ළමුන්ට ආරක්ෂාව සැලසීම මෙම ආයතනය මගින් සිදු කරනු ලැබේ. එක් පළාතකට එකක් වන සේ රට තුළ මෙවැනි ආයතන 9ක් ඇති අතර මෙම ආයතන රාජ්‍ය අංශය මගින් පවත්වාගෙන යනු ලැබේ. මෙම ආයතනවල සිටින අනාථ හා අත්හල ළමුන් කුලවැද්දීම සඳහා හෝ වෙනත් විකල්ප රැකවරණ ක්‍රම සඳහා යොමු කරනු ලැබේ. එසේ වුව ද අසරණ ළමයින් සඳහා විකල්ප රැකවරණය ලබා දිය නොහැකි අවස්ථාවලදී එම ළමුන් අධ්‍යාපනය ලබා දීම සඳහා ස්වේච්ඡා ළමා නිවාස වෙත යොමු කරනු ලැබේ.<br>දකුණු පළාතට අයත් රජයේ භාරගැනීමේ ළමා නිවාසය ගාල්ල දිස්ත්‍රික්කයේ කිතුලම්පිටිය ප්‍රදේශයේ පිහිටුවා ඇත. |
| අනුමත කළ පාසල | මෙම ආයතනය ද සහතික කළ පාසල හා සමාන ආයතනයකි. මෙම ආයතනය ද ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනත යටතේ ළමා වරදකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා පිහිටුවන ලද ආයතනයකි.<br>ශ්‍රී ලංකාව තුළ එක් අනුමත කළ පාසලක් පමණක් ඇති අතර එය කළුතර දිස්ත්‍රික්කයේ මග්ගොන පිහිටුවා ඇත. |

| | |
|---|---|
| නිවර්තන ළමා නිවාස | අයාලේ ගිය ළමුන්ට හා වීදි දරුවන්ට රැකවරණය හා ආරක්ෂාව සැලසීම සඳහා මෙම ආයතනය නිවර්තන නිවාස ආඥාපනත යටතේ ස්ථාපනය කර ඇත.<br>ශ්‍රී ලංකාව තුළ එක් නිවර්තන නිවාසයක් පමණක් ඇති අතර එය ගාල්ල දිස්ත්‍රික්කයේ හල්පාතොට පිහිටුවා ඇත. |
| පුහුණු හා උපදේශන මධ්‍යස්ථාන | අපයෝජනයට ලක් වූ ළමුන්ට මනෝ සමාජීය ප්‍රතිකාර හා වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා පිහිටුවන ලද ආයතනයකි.<br>දකුණු පළාත තුළ පුහුණු හා උපදේශන මධ්‍යස්ථාන නැත. |
| ස්වේච්ඡා ළමා නිවාස | අනාථ, අත්හල හා අසරණ ළමුන්ට රැකවරණය හා ආරක්ෂාව සැලසීම සඳහා අනත්දරු ආඥා පනත/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය යටතේ ස්ථාපනය කර ඇති ආයතනයකි. මෙම ආයතන මෙහෙයවනු ලබන්නේ ස්වේච්ඡා සංවිධාන මගින් වුව ද ළමයින් ඇතුළත් කිරීමේ සිට නැවත සමාජගත කිරීම දක්වා සියලු කටයුතු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලැබේ. තව ද මෙම ආයතන පවත්වාගෙන යනු ලබන්නේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ සෘජු අධීක්ෂණය මත වේ. මෙම ආයතන මගින් වයස අවුරුදු 0-18 දක්වා ළමයින්ට රැකවරණය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් මෙම ආයතනවලට ළමුන් ඇතුළත් කරනුයේ අවුරුදු 3ක කාලයකට වන අතර මෙම අවුරුදු 3 සම්පූර්ණ වීමට පෙර ස්ථාපන කමිටු තීරණයකට අනුව ළමුන් නැවත සමාජගත කළ යුතු ය.<br>දකුණු පළාත තුළ ස්වේච්ඡා ළමා නිවාස 24ක් පිහිටා ඇත. |

# 2 වන පරිච්ඡේදය
# සංගණනයේ පසුබිම හා සංගණන ක්‍රමවේදය

## 2.1. සංගණනයේ පසුබිම

ජාතික සංඛ්‍යාලේඛන ආයතනය වශයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට මුළු දිවයිනම ආවරණය වන පරිදි සංගණන හා නියැදි සමීක්ෂණ පැවැත්වීම පිළිබඳව දශක හතකට වැඩි ඉතිහාසයක් ඇත. වසර දහයකට වරක් පවත්වනු ලබන ජන හා නිවාස, කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු පිළිබඳ සංගණන ආදිය දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට මේ දක්වා අඛණ්ඩව පවත්වාගෙන එනු ලැබේ. මීට අමතරව රට තුළ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබා දීම අරමුණු කරගත් වෙනත් සංගණන හා සමීක්ෂණ පැවැත්වීම ද දෙපාර්තමේන්තුව මගින් නිරන්තරයෙන් සිදු කරනු ලබයි.ජාතික සංඛ්‍යාලේඛන ආයතනය වශයෙන් දෙපාර්තමේන්තුවට නිතැතින්ම පැවරෙන ජාතික සංගණන හා සමීක්ෂණ පැවැත්වීමට අමතරව අනෙකුත් රාජ්‍ය ආයතන සිය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීමේ කටයුතු සඳහා වන නිල සංඛ්‍යාති ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන සෑම අවස්ථාවකම අප දෙපාර්තමේන්තුව විසින් එම ඉල්ලීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි.

ආයතනගත ළමුන් සඳහා සකස් කරන ලද විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය, ජාතික ක්‍රියාකාරී සැලැස්මක් හරහා ක්‍රියාවට නැංවීමට සැලසුම් කිරීමේදී ඒ සඳහා පිළිගත් හා විශ්වසනීය මූලාශ්‍රයක් මගින් ලබාගත් දත්තවල අවශ්‍යතාවය පැන නැගී ඇත. ඒ අනුව දීපව්‍යාප්ත සංගණනයක් පවත්වා ළමා නිවාසගත ළමුන් පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට ලබාදීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැවරිණි. මේ සම්බන්ධයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමට අනුව ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ මධ්‍යස්ථාන, ළමා රැකවරණ මධ්‍යස්ථානගත ළමුන් හා එම ආයතනවල කාර්ය මණ්ඩල පිළිබඳව දත්ත එක්රැස් කිරීම සඳහා ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ සිදුකරන ලද පළමු සංගණනය මෙය වේ.

## 2.2 සංගණනය සැලසුම් කිරීම

දෙපාර්තමේන්තුව මගින් සංගණනයක් සිදු කිරීමේදී අනුගමනය කරනු ලබන සාමාන්‍ය ක්‍රමවේදය අනුගමනය කරමින් ආයතනගතව සිටින ළමුන් සඳහා වන විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය දත්ත ලබා ගැනීම වෙනුවෙන් සංගණනයක් සැලසුම් කිරීම දෙපාර්තමේන්තුවට මහත් අභියෝගයක් විය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් සංගණන පවත්වනු ලබන්නේ ගෘහ කාණ්ඩ/ ආයතන මූලික කරගනිමින් වන අතර මෙහිදී ගෘහ කාණ්ඩ සඳහා ගෘහ මූලික හෝ ගෘහ කාණ්ඩයේ වෙනත් වගකිව යුතු සාමාජිකයෙක්ද, ආයතන සඳහා ආයතනයේ වගකිව යුතු නිලධාරියෙක් ද ප්‍රතිචාරක වශයෙන් තෝරා ගනී.

මෙම සංගණනයේ ප්‍රාථමික සංගණන ඒකකය වූයේ ළමා රැකවරණ මධ්‍යස්ථාන වන අතර සංගණනයේදී මෙම ආයතනවල සිටින ළමුන් පිළිබඳව විස්තරාත්මක තොරතුරු රැස් කිරීමට නියමිත විය. ළමයින්ගේ යහපැවැත්ම සඳහා වගකිව යුතු දෙමව්පියන්/ භාරකරුවන් නොමැතිව ළමුන් මෙම ආයතනවල තනිවම ජීවත්වන බැවින් මෙම තොරතුරු ලබා ගැනීම ආයතනයේ පරිපාලනය/ නිලධාරී මණ්ඩලය හා ආයතනය සම්බන්ධයෙන් වගකීම දරන පරිවාස නිලධාරී මගින් සිදු කර ගත යුතු විය. මෙහිදී තොරතුරු රැස් කිරීම සඳහා ළමුන් සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම හා ළමයින් වෙනුවෙන් ආයතනය මගින් පවත්වාගෙන යන ගොනු පදනම් කරගැනීමට සිදු විය. තවද ළමයාගෙන් ළමයාට හා ආයතනයෙන් ආයතනයට ලබාගත හැකි තොරතුරු වෙනස්වන අතර ඒවා ද ආයතනයේ වර්ගය, ළමයා ආයතනගත කිරීමට හේතුව, ළමයාගේ සමාජ ආර්ථික පසුබිම, පළාතේ පරිවාස යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය වැනි බාහිර සාධක මත වෙනස්වීමට හැකියාව ඇත. මෙවැනි තත්ත්වයක් හමුවේ වුව ද මෙම සංගණනය විද්‍යානුකූලව පවත්වා ළමා නිවාසගත ළමුන් සඳහා වන විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය දත්ත ලබා දීමේ වගකීම දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලදී.

මෙම වගකීම භාරගැනීමත් සමග මූලිකවම සංගණනය පිළිබඳව වැදගත් තීන්දු තීරණ ගැනීම සඳහා සංගණන මෙහෙයුම් කමිටුවක් පත්කරගන්නා ලදී. මෙම සංගණන මෙහෙයුම් කමිටුව සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සාමාජිකයින් පත් කරගන්නා ලදී. මීට අමතරව සියලුම පළාත් සභා නියෝජනය කිරීම සඳහා පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයෙක් ද මෙම කමිටුව සඳහා පත් කරගන්නා ලදී.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දත්ත අවශ්‍යතාවය හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ මධ්‍යස්ථානවල ව්‍යුහය හා පරිවාස යාන්ත්‍රණය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන ලදී. මීට අමතරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු නිලධාරීන් මෙන්ම පළාත් පරිවාස කොමසාරිස්වරුන් සමග සාකච්ඡා කිරීම මගින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පිළිබඳව වැඩිදුර අවබෝධයක් ලබාගන්නා ලදී. දිවයින පුරා පිහිටි විවිධ වර්ගයේ ළමා රැකවරණ මධ්‍යස්ථාන ආවරණය වන පරිදි මූලික ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදු කිරීමෙන් අනතුරුව විවිධ ආයතන සතු දත්ත, ආයතනවල සාමාන්‍ය පරිපාලන ක්‍රියා පටිපාටිය හා මෙම ආයතනවල අධීක්ෂණය හා ඇගයීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳව තව දුරටත් අවබෝධයක් ලබා ගන්නා ලදී. මෙසේ සංගණනයේ විෂය පථය පිළිබඳව මූලික අවබෝධයක් ලබා ගැනීමෙන් අනතුරුව සංගණන ක්‍රමවේදය තීරණය කරන ලදී.

ඒ අනුව සමස්ථ සංගණන ක්‍රියාවලිය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

1. සංගණන ඒකක ලැයිස්තුගත කිරීම
2. උපලේඛන සකස් කිරීම
3. උපලේඛන පූර්ව පරීක්ෂාවට ලක්කිරීම
4. ක්ෂේත්‍ර කටයුතු සැලසුම් කිරීම
5. පුහුණු වැඩසටහන් පැවැත්වීම
6. සංගණන ගණන් ගැනීම
7. දත්ත සැකසුම් කටයුතු හා දත්ත විශ්ලේෂණය
8. දත්ත ප්‍රකාශයට පත්කිරීම

## 2.3 සංගණන ඒකක ලැයිස්තුගත කිරීම

මෙම සංගණනයේ පළමු අදියර ලෙස දිවයින පුරා පිහිටි පරිවාස හා සම්බන්ධ විවිධ අණපනත් හා ආඥාපනත් අනුව ක්‍රියාත්මක වන සෑම ළමා රැකවරණ මධ්‍යස්ථානයකම තොරතුරු ඇතුළත් වන පරිදි පූර්ව ලැයිස්තුගත කිරීම සිදුකරන ලදී. සියලුම ළමා රැකවරණ මධ්‍යස්ථාන පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවල අධීක්ෂණය යටතේ ලියාපදිංචියක් සහිතව පවත්වාගෙන යනු ලබන බැවින් දිස්ත්‍රික්ක මට්ටමින් සංගණන ඒකක ලැයිස්තුගත කිරීම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු හරහා සිදුකරවා ගන්නා ලදී. මෙම ලැයිස්තුගත කිරීමේ ආකෘතියට මූලික විචල්‍යයන්ට අමතරව පහත සඳහන් විචල්‍යයන්ද ඇතුළත් කරන ලදී.

1. ආයතනයේ වර්ගය
2. ස්ත්‍රී/ පුරුෂ භාවය හා වයස් කාණ්ඩ අනුව ළමයින් සංඛ්‍යාව
3. ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලය
4. ආයතන ප්‍රධානියා/ භාරකරු පිළිබඳ තොරතුරු
5. ආයතනය/ පරිපාලනය සම්බන්ධ කරගත හැකි දුරකථන අංක

මෙම ලැයිස්තුගත කිරීමට අනුව දකුණු පළාත තුළ ක්‍රියාත්මක ළමා රැකවරණ මධ්‍යස්ථාන 31ක් හඳුනාගන්නා ලද අතර එම ආයතන තුළ රැකවරණය ලබමින් සිටි ළමුන් සංඛ්‍යාව 921ක් ද, කාර්ය මණ්ඩල සාමාජිකයින් 294ක් ද වාර්තා විය. සංගණන පූර්ව සැලසුම් කටයුතු සඳහා පසු කාලීනව මෙම දළ තොරතුරු භාවිතා කරන ලදී.

## 2.4 උපලේඛන සකස් කිරීම

සංගණන උපලේඛන සකස් කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත වන පරිදි කමිටුවක් පත් කරගන්නා ලද අතර නිරන්තරයෙන් එම කමිටුව රැස්වෙමින් උපලේඛන සකස් කිරීම සිදු කරන ලදී. ආයතනගත කරන ලද ළමුන් සඳහා විකල්ප රැකවරණ සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය වන දත්ත ලබාගැනීම මෙම සංගණනයේ මූලික අරමුණ වූ බැවින් එක් උපලේඛනයක් මගින් සියලු තොරතුරු ලබා ගැනීම ඉතා අපහසු කාර්යයක් විය. එබැවින් ඒ සඳහා පහත සඳහන් ආකාරයට උපලේඛන 4ක් යොදා ගැනීමට තීරණය විය.

1. CC1: ආයතනය පිළිබඳ උපලේඛනය

ආයතන මගින් ළමුන් සඳහා ප්‍රමාණවත් වන ආකාරයට පහසුකම් සපයමින් ගුණාත්මක සේවාවක් ලබා දෙන්නේ ද යන්න පිළිබඳව තක්සේරු කිරීමට අවශ්‍ය වන තොරතුරු ලබාගැනීම සඳහා මෙම උපලේඛනය සකස් කරන ලදී.

2. CC2: ළමුන් පිළිබඳ උපලේඛනය

මෙම සංගණනයේ ප්‍රධාන උපලේඛනය CC2 උපලේඛනය වේ. ආයතනගත ළමුන්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ දළ අවබෝධයක් ලබා ගැනීම සඳහා අවශ්‍යවන තොරතුරු මෙන්ම ළමුන් සමාජගත කිරීමට උත්සාහ කිරීමේදී ඒ සඳහා පාදක කරගත යුතු තොරතුරු ලබාගැනීම සඳහා මෙම උපලේඛනය සැලසුම් කරන ලදී. විවිධ වර්ගයේ ආයතන තුළ විවිධ සමාජ ස්ථරයන් නියෝජනය කරමින් එකිනෙකට වෙනස් විවිධ හේතු වල බලපෑමෙන් ආයතනගතව සිටින විවිධ වයස් කාණ්ඩවල පසුවන ළමුන් පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා පොදු උපලේඛනයක් සකස් කිරීම කිසිසේත් පහසු කටයුත්තක් නොවුණි. කෙසේ වුව ද කොටස් 4කින් සමන්විත මෙම උපලේඛනය තුළ ළමයින් පිළිබඳ තොරතුරු, දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ තොරතුරු, සහෝදර සහෝදරයින් පිළිබඳ තොරතුරු හා සමාජගත කිරීම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට අදාළ ප්‍රශ්න ඇතුළත් කරන ලදී.

3. CC3: කාර්ය මණ්ඩලය පිළිබඳ උපලේඛනය

ළමා රැකවරණ මධ්‍යස්ථානවල විවිධ තනතුරු දරමින් සේවය කරන කාර්ය මණ්ඩලය එම ආයතන ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් වන්නේද යන්න විමසා බැලීම හා ළමුන් සම්බන්ධව කටයුතු කිරීමේදී එම කාර්ය මණ්ඩලයේ අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම් ප්‍රමාණවත් වන්නේද යන්න පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම මෙම උපලේඛනය සකස් කිරීමේ අරමුණ වේ.

4. CC4: ළමා අදහස් විමසීමේ උපලේඛනය

ළමුන් වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී ඒ සඳහා ළමුන්ගේ සහභාගීත්වය ඉතා වැදගත් වන බැවින් තම ආයතනික ජීවිතය පිළිබඳ ඔවුන්ගේ අදහස් හා සිතුම් පැතුම් විමසීමේ අරමුණින් ඉතා කෙටි ප්‍රශ්නාවලියක් භාවිතාකර තෝරාගත් ළමුන් නියැදියකගෙන් තොරතුරු රැස් කිරීම සඳහා මෙම උපලේඛනය හඳුන්වා දෙන ලදී. සෑම වයස් කාණ්ඩයක් මෙන්ම ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයම නියෝජනය වන සේ වයස අවුරුදු 6 හෝ ඊට වැඩි ළමුන් නියැදියක් මගින් තොරතුරු ලබා ගැනීමෙන් මෙම උපලේඛනය සම්පූර්ණ කරන ලදී. එසේ වුව ද තෝරාගත් නියැදිය පළාත් මට්ටමින් තොරතුරු නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් පළාත් මට්ටමේ ප්‍රකාශන මගින් මෙම උපලේඛනය මගින් රැස් කරගන්නා ලද තොරතුරු ප්‍රකාශයට පත්නොකිරීමට තීරණය කරන ලදී.

සෑම ආයතන වර්ගයක්ම නියෝජනය වන පරිදි පළාත් කිහිපයකින් තෝරාගන්නා ලද ආයතන තුළ මෙම උපලේඛන පූර්ව පරීක්ෂාවට ලක්කිරීම අදියර 2ක් යටතේ සිදු කරන ලදී. පූර්ව පරීක්ෂාවල අත්දැකීම් පදනම් කරගනිමින් ප්‍රායෝගික තත්ත්වයන්ට වඩාත් ගැලපෙන ලෙස උපලේඛනවල ඇතැම් සංශෝධන සිදු කරන ලදී.

## 2.5 ක්ෂේත්‍ර කටයුතු සැලසුම් කිරීම

සංගණන ක්ෂේත්‍ර කටයුතු සාමූහික කර්තව්‍යයක් ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්ව සිදු කිරීමට තීරණය විය. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවලට අනුයුක්ත කරන ලද සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය හා විවිධ රාජකාරී හේතුවෙන් ඒ වන විට කාර්ය බහුලව පැවති දිස්ත්‍රික්ක සඳහා ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය ද ගණන් ගන්නා නිලධාරීන් ලෙස පත් කරන ලදී. දත්ත එක්රැස් කිරීම ප්‍රධාන වශයෙන්ම ළමයින් වෙනුවෙන් ආයතනය මගින් පවත්වාගෙන යන පුද්ගලික ලිපිගොනු භාවිතයෙන් සිදු කරන ලද බැවින් ආයතන භාරව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරීන්/ පරිවාස නිලධාරීන් දත්ත එක්රැස් කිරීම සඳහා සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයට සහයෝගය ලබා දෙන ලදී. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන් අදාළ දිස්ත්‍රික්ක තුළ සංගණන අධීක්ෂණ නිලධාරීන් වශයෙන් කටයුතු කරන ලදී.

මෙම සියලුම නිලධාරීන්ට සංගණනය සම්බන්ධ න්‍යායාත්මක කරුණු, දත්ත එක්රැස් කරනු ලබන ක්‍රමවේදය, උපලේඛන හා අනෙකුත් ආකෘති සම්පූර්ණ කරනු ලබන ආකාරය පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී.

## 2.6 දත්ත එක්රැස් කිරීම

සංගණනයේ දත්ත රැස් කිරීමේ කටයුතු 2019 නොවැම්බර්/ දෙසැම්බර් මාස තුළ මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදු කරන ලදී. මෙහිදී ආයතන ප්‍රධානියා හෝ සුදුසු නිලධාරියකු සම්බන්ධ කරගනිමින් ආයතනය පිළිබඳ උපලේඛනය (CC1) සම්පූර්ණ කරන ලදී. ළමුන් වෙනුවෙන් ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන පුද්ගලික ලිපි ගොනු හා වෛද්‍ය වාර්තා ගොනු අධ්‍යයනය කිරීමෙන්, ආයතන ප්‍රධානියා හෝ සුදුසු නිලධාරියකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් හා අදාළ පරිවාස නිලධාරී සමග සාකච්ඡා කිරීමෙන් ළමුන් පිළිබඳ උපලේඛනය (CC2) සම්පූර්ණ කරන ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින් සෘජුවම සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීම මගින් කාර්ය මණ්ඩලය පිළිබඳ උපලේඛනය (CC3) ද සම්පූර්ණ කරන ලදී. ළමා අදහස් විමසීමේ උපලේඛනය (CC4) අවුරුදු 6 හා ඊට වැඩි ළමුන් නියැදියක් සම්මුඛ පරීක්ෂණයට ලක් කරමින් සම්පූර්ණ කරන ලදී. මෙම නියැදිය තෝරා ගැනීම සංගණන පුහුණු වැඩසටහන තුළදී ලබා දුන් උපදෙස් අනුව අදාළ ගණන් ගන්නා නිලධාරී විසින් සිදු කරන ලදී.

## 2.7 දත්ත සැකසුම් කටයුතු

සංගණනය අවසන් වූ වහාම සංගණනයේදී සම්පූර්ණ කරන ලද සියලුම උපලේඛන ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීමෙන් අනතුරුව එම උපලේඛන මූලික පරීක්ෂාවකට ලක්කරන ලදී. එනම් මෙහිදී සියලුම ළමා රැකවරණ මධ්‍යස්ථාන ආවරණය කර ඇති බවට හා ආයතනය, ආයතනගත ළමුන්, කාර්ය මණ්ඩලය හා නියැදියට තෝරාගත් ළමුන් වෙනුවෙන් අදාළ පරිදි උපලේඛන සම්පූර්ණ කර ඇති බව තහවුරු කරගැනීමෙන් පසු දත්ත සැකසුම් කටයුතු ආරම්භ කරන ලදී.

එක් ආයතනයක් වෙනුවෙන් සම්පූර්ණ කරන ලද CC1, CC2 හා CC3 උපලේඛන අතර ඇති නොගැලපීම් හා එක් උපලේඛනයක අන්තර්ගතය තුළ ඇති නොගැලපීම් හඳුනාගනිමින් එම උපලේඛනවල අන්තර්ගතය සංස්කරණය කිරීම හා අදාළ කේත යෙදීම මේ යටතේ සිදු කෙරිණ. මෙම උපලේඛනවල විවෘත අවසානයක් ඇති ප්‍රශ්න රාශියක් අන්තර්ගතව තිබූ බැවින් ඒ සඳහා කේත යෙදීම ඉතාමත් සංකීර්ණ විය. එබැවින් කේත ලැයිස්තුව නිරන්තරයෙන් යාවත්කාලීන කරමින් කේත යෙදීම සිදු කරන ලදී.

**උපලේඛන පරිගණකගත කිරීම**

පරිගණකගත කරන ලද දත්ත ගොනුවල නිරවද්‍යතාවය ඉහළ නංවා ගැනීම සඳහා යෙදිය හැකි වැදගත් උපක්‍රමයක් ලෙස සෑම උපලේඛනයක්ම පරිගණකගත කිරීම ද්විත්ව පරිගණකගත කිරීමේ ක්‍රමයට (double blind data entry) සිදු කරන ලදී. සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුව සංගණන හා සමීක්ෂණවලට අදාළ උපලේඛන පරිගණකගත කිරීමේදී අක්ෂර ලෙස සටහන් කරන ලද පිළිතුරු (text fields) පරිගණකගත කරනු නොලැබේ. එහෙත් මෙම සංගණනයේදී එක් එක් ළමයා පිළිබඳව වෙන වෙනම තීරණ ගත යුතු බැවින් අක්ෂර ලෙස සටහන් කරන ලද පිළිතුරු සියල්ල ද පරිගණකගත කරන ලදී. මේ අනුව ළමා නිවාසගත සෑම ළමයකු සඳහාම පුද්ගල අනන්‍ය රැකවරණ සැලැස්මක් සකස් කිරීමට මෙම අවසන් දත්ත ගොනු උපකාරී වනු ඇත.

## 2.8 සංගණනයේ සීමාවන්

1. සාමාන්‍යයෙන් සංගණන හා සමීක්ෂණවලදී අදාළ ප්‍රතිචාරක හෝ ප්‍රතිචාරක පිළිබඳ සියලු තොරතුරු නිවැරදිව ලබා දිය හැකි පවුලේ සාමාජිකයෙක් සම්මුඛ පරීක්ෂණයට ලක්කරමින් උපලේඛන සම්පූර්ණ කළ ද මෙම සංගණනයේදී ආයතනය තුළ ළමයා වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ගොනුවල අඩංගු තොරතුරු පදනම් කරගෙන උපලේඛන සම්පූර්ණ කිරීමට සිදුවීම.
2. ළමුන් සඳහා ආයතන විසින් පවත්වාගෙන යන පුද්ගලික දත්ත ගොනු හා වෛද්‍ය වාර්තා ගොනුවල සම්පූර්ණත්වය පිළිබඳව ගැටළුකාරී තත්ත්ව පැවති බැවින් ඇතැම් ප්‍රශ්න සඳහා අදාළ වන සේ පිළිතුරක් ලබාගත නොහැකි වීම.
3. සංගණන දත්ත ගොනු තුළ ඇතැම් විචල්‍ය තුළ හිස් අගයන් (missing records) සංඛ්‍යාව විශාල වශයෙන් පැවතීම.

# 3 වන පරිච්ඡේදය
# ළමා රැකවරණ මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු

ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ රැකවරණය ලබමින් සිටින ළමුන් සඳහා විකල්ප රැකවරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සඳහා අවශ්‍යය දත්ත ලබා ගැනීමේදී ළමා රැකවරණ මධ්‍යස්ථාන සම්බන්ධ මූලික තොරතුරු, එක් එක් ආයතනය මගින් ළමුන් සඳහා සපයනු ලබන පහසුකම් හා සේවාවන්, ළමුන්ගේ සුභසාධනය උදෙසා ආයතනය සතු වත්කම්, සම්පත් හා ආයතනයේ පරිපාලන කටයුතු පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතා වැදගත් ලෙස සැලකිය හැකි ය. ළමා රැකවරණ මධ්‍යස්ථානයක් තුළ ළමයින් වෙනුවෙන් සැපයිය යුතු පහසුකම් හා පවත්වාගෙන යා යුතු සේවාවන් හා ඒවායේ තිබිය යුතු ප්‍රමිතීන් පිළිබඳ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද මාර්ගෝපදේශයන්හි ද පැහැදිලිව සඳහන් වේ. ඒ අනුව මෙම පරිච්ඡේදය මගින් දකුණු පළාත තුළ පිහිටා ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරේ.


## 3.1 ආයතන වර්ගය, ක්‍රියාකාරිත්වයේ ස්වභාවය සහ අරමුදල් සම්පාදනය

දකුණු පළාත තුළ ක්‍රියාත්මක වන ළමා රැකවරණ මධ්‍යස්ථාන පිළිබඳ මූලික සංඛ්‍යාත්මක විග්‍රහයක් මෙන්ම ආයතනවල ලියාපදිංචිය හා අරමුදල් සම්පාදනය පිළිබඳ තොරතුරු ද මෙමගින් ඉදිරිපත් කෙරේ.

වගුව 3.1 දිස්ත්‍රික්කය හා ආයතන වර්ගය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව

| ආයතන වර්ගය | එකතුව | ගාල්ල | මාතර | හම්බන්තොට |
|---|---|---|---|---|
| රැඳවුම් නිවාසය | 2 | 2 | - | - |
| සහතික කළ පාසල | 2 | 2 | - | - |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 1 | 1 | - | - |
| නිවර්තන ළමා නිවාසය | 1 | 1 | - | - |
| ස්වේච්ඡා ළමා නිවාසය | 24 | 14 | 6 | 4 |
| වෙනත් | 1 | - | - | 1 |
| **එකතුව** | **31** | **20** | **6** | **5** |

රූප සටහන 3.1
දිස්ත්‍රික්කය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව DCS

දකුණු පළාත තුළ ළමා රැකවරණ මධ්‍යස්ථාන 31ක් පිහිටා ඇති අතර ඒ අතරින් වැඩිම ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාවක් (65%) ගාල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කොටගෙන පිහිටා ඇත. විවිධ කාණ්ඩවලට අයත් ළමුන් සඳහා වෙන වෙනම රැකවරණය ලබා දීම වෙනුවෙන් හඳුන්වා දෙන ලද සියලුම වර්ගවලට අදාළ ළමා රැකවරණ මධ්‍යස්ථාන දකුණු පළාත තුළ ද ස්ථාපනය කර ඇති බව වගුව 3.1 අනුව පැහැදිලි වේ. මේ අතරින් රැඳවුම් නිවාස, සහතික කළ පාසල්, රජයේ භාරගැනීමේ ළමා නිවාසය, නිවර්තන ළමා නිවාසය හා වෙනත් යටතේ සඳහන් ආයතනය රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක වන අතර සියලුම ස්වේච්ඡා ළමා නිවාස පෞද්ගලික අංශය මගින් ක්‍රියාත්මක වේ. එමෙන්ම දිවයින තුළ ඇති එකම නිවර්තන ළමා නිවාසය දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයෙහි පිහිටුවා තිබීම විශේෂත්වයකි. අයාලේ ගිය ළමුන්ට හා වීදි දරුවන්ට රැකවරණය හා ආරක්ෂාව සැලසීම සඳහා මෙම ආයතනය ස්ථාපනය කර ඇත.

**වගුව 3.2** ආයතනයේ ස්වභාවය හා දිස්ත්‍රික්කය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව

| ආයතනයේ ස්වභාවය | එකතුව | ගාල්ල | මාතර | හම්බන්තොට |
|---|---|---|---|---|
| අනත්දරු නිවාස ආඥාපනත මගින් ක්‍රියාත්මක රජයේ ආයතනය | 2 | 1 | - | 1 |
| ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත මගින් ක්‍රියාත්මක රජයේ ආයතනය | 4 | 4 | - | - |
| නිවර්තන නිවාස ආඥා පනත මගින් ක්‍රියාත්මක රජයේ ආයතනය | 1 | 1 | - | - |
| අනත්දරු නිවාස ආඥා පනත මගින් ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානයක් මගින් පාලනය වන ආයතනය | 24 | 14 | 6 | 4 |
| **එකතුව** | **31** | **20** | **6** | **5** |


ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සෑම ළමා රැකවරණ මධ්‍යස්ථානයක්ම අනිවාර්යයෙන්ම රජයේ ලියාපදිංචි කළ යුතු වේ. දකුණු පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථාන අතරින් ආයතන 6ක් (රජයේ භාරගැනීමේ ළමා නිවාසය, රැඳවුම් නිවාස 2, සහතික කළ පාසල් 2, වෙනත් යටතේ එන ළමා නිවාසය) පමණක් දකුණු පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන රජයේ ආයතන වන අතර ඒවා අතරින් රජයේ භාරගැනීමේ ළමා නිවාසය හා වෙනත් යටතේ සඳහන් ආයතනය අනත්දරු නිවාස ආඥාපනත මගින් ද, නිවර්තන ළමා නිවාසය නිවර්තන නිවාස ආඥාපනත මගින් ද, අනෙකුත් ආයතන ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත මගින් ද ලියාපදිංචි කර ඇත.

පෞද්ගලික අංශය මගින් පවත්වාගෙන යන ස්වේච්ඡා ළමා නිවාස ක්‍රියාකාරීව පවත්වාගෙන යාම සඳහා වූ නියමයන් රජයේ සෘජු අධීක්ෂණය මත සිදු වන අතර එම සෑම ළමා රැකවරණ මධ්‍යස්ථානයක්ම අනත්දරු නිවාස ආඥා පනත මගින් රාජ්‍ය අංශය තුළ ලියාපදිංචි කර ඇත.

**වගුව 3.3** ආයතන වර්ගය හා ආයතනය පවත්වාගෙන යාමට අරමුදල් ලැබෙන ප්‍රධාන මූලාශ්‍රය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව

| ආයතන වර්ගය | එකතුව | රජයේ අරමුදල් | රජයේ නොවන දේශීය | රජයේ නොවන විදේශීය |
|---|---|---|---|---|
| රැඳවුම් නිවාසය | 2 | 2 | - | - |
| සහතික කළ පාසල | 2 | 2 | - | - |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 1 | 1 | - | - |
| නිවර්තන ළමා නිවාසය | 1 | 1 | - | - |
| ස්වේච්ඡා ළමා නිවාසය | 24 | - | 12 | 12 |
| වෙනත් | 1 | 1 | - | - |
| **එකතුව** | **31** | **7** | **12** | **12** |

රූප සටහන 3.2
ආයතනය පවත්වාගෙන යාමට අරමුදල් ලැබෙන ප්‍රධාන මූලාශ්‍රය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථානවල ප්‍රතිශත ව්‍යාප්තිය




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ ළමා රැකවරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා අරමුදල් ලැබෙන ප්‍රධාන මූලාශ්‍රය සැලකීමේදී රාජ්‍ය අංශය මගින් පාලනය වන රැඳවුම් නිවාස, සහතික කළ පාසල්, රජයේ භාරගැනීමේ ළමා නිවාසය, නිවර්තන ළමා නිවාසය හා වෙනත් යටතේ සඳහන් ආයතනය රාජ්‍ය අරමුදල් වලින් පවත්වාගෙන යනු ලැබේ. පෞද්ගලික අංශය/ ස්වේච්ඡා සංවිධාන මගින් පාලනය වන ස්වේච්ඡා ළමා නිවාස ප්‍රධාන වශයෙන්ම රජයේ නොවන දේශීය/ විදේශීය අරමුදල් වලින් පවත්වාගෙන යනු ලැබේ. ස්වේච්ඡා ළමා නිවාස අතරින් 50%ක් රජයේ නොවන දේශීය මූලාශ්‍රවලින්ද 50%ක් රජයේ නොවන විදේශීය මූලාශ්‍රවලින්ද අරමුදල් සම්පාදනය කරගනු ලැබේ.

## 3.2 ළමුන් සඳහා ලබා දෙන පහසුකම් හා සේවාවන්

ආයතනගත ළමුන් වෙනුවෙන් ආයතනය මගින් ඔවුන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කළ යුතු බව ද, සෞඛ්‍ය පහසුකම් ලබා දිය යුතු බව ද, ආයතන පරිශ්‍රය තුළ ළමයින් වෙනුවෙන් නිදන කාමර, වැසිකිළි හා නාන කාමර, ආලින්දය, අධ්‍යාපන කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රදේශයක්, එළිමහන් ක්‍රීඩා පිටියක්, ගෙඋයනක්, කෑම කාමරය, මුළුතැන්ගෙය යනාදී පහසුකම් ළමුන් සංඛ්‍යාවට ප්‍රමාණවත් වන සේ ලබා දිය යුතු බව ද ළමා රැකවරණ ආයතන සඳහා වන ප්‍රමිතීන්හි සඳහන් වේ. ඒ අනුව ආයතනගත ළමුන් වෙනුවෙන් ආයතනය මගින් ලබා දෙන අධ්‍යාපන, සෞඛ්‍ය හා අනෙකුත් සේවාවන් පිළිබඳ තොරතුරු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමත්, ළමයින්ට ඔවුනගේ එදිනෙදා කටයුතු අපහසුවකින් තොරව කරගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ආයතන මගින් සිදු කරන ආකාරය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමත් මෙම කොටස යටතේ සිදු කෙරේ.

වගුව 3.4 ළමුන් සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ සේවාවන් සැපයීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| පහසුකම/ සේවාව | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| **පාසල් යායුතු වයසේ පසුවන එහෙත් පාසල් නොයන ළමයින් සඳහා නොවිධිමත් අධ්‍යාපන පහසුකම් සැපයීම** | | |
| ආයතනය තුළ මෙන් ම ආයතනයෙන් පරිබාහිර ස්ථානවල දී ද පහසුකම් සපයයි | 1 | 3.2 |
| ආයතනය තුළ පමණක් පහසුකම් සපයයි | 8 | 25.8 |
| පහසුකම් සපයන්නේ නැත | 8 | 25.8 |
| එවැනි ළමයින් නැත | 14 | 45.2 |
| **පාසල් යන ළමයින් පාසල් අධ්‍යාපනයට අමතර ව පාසල් විෂය නිර්දේශයට සමගාමී අමතර පංති සඳහා සහභාගීවීම** | | |
| ආයතනය තුළ මෙන් ම ආයතනයෙන් පරිබාහිර ස්ථානවල දී ද සහභාගි වෙයි | 6 | 19.4 |
| ආයතනය තුළ පමණක් සහභාගි වෙයි | 20 | 64.5 |
| ආයතනයෙන් පරිබාහිර ස්ථානවල පමණක් සහභාගි වෙයි | 1 | 3.2 |
| සහභාගි වන්නේ නැත | 1 | 3.2 |
| ආයතනය තුළ පාසල් යන ළමයින් නැත | 3 | 9.7 |
| **ළමයින් වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීවීම** | | |
| ආයතනය තුළ මෙන් ම ආයතනයෙන් පරිබාහිර ස්ථානවල දී ද සහභාගි වෙයි | 2 | 6.5 |
| ආයතනය තුළ පමණක් | 4 | 12.9 |
| සහභාගි වන්නේ නැත | 22 | 71.0 |
| ආයතනය තුළ වෘත්තීය පුහුණුව ලබා දීමට සුදුසු වයසේ පසුවන ළමයින් නැත | 3 | 9.7 |
| **එකතුව** | **31** | **100** |

ළමයකු ආයතනගත කළ ද ළමයාගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට එය බාධාවක් නොවිය යුතුය. යම් ආකාරයකින් ආයතනගත කිරීම ළමයාගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි යම් බලපෑමක් ඇති කරන්නේ නම් එමගින් ළමයාගේ අධ්‍යාපන අයිතිය උල්ලංඝණය වනවා පමණක් නොව සමාජයීය වශයෙන් ඉතා අහිතකර බලපෑමක් ඇතිවිය හැකිය. එම නිසා ආයතනගත කරන ළමුන් වෙනුවෙන් විධිමත් පාසල් අධ්‍යාපනය අඛණ්ඩව ලබාදීම, පාසල් නොයන ළමුන් සඳහා නොවිධිමත් අධ්‍යාපන අවස්ථා ලබාදීම මෙන්ම වෘත්තීය අධ්‍යාපන අවස්ථා ලබාදීම ද අඛණ්ඩව සිදුකිරීම වැදගත් වේ.

දකුණු පළාත තුළ පාසල් යා යුතු වයසේ පසුවන එහෙත් පාසල් නොයන ළමයින් සිටින ආයතන 17ක් වාර්තා වී ඇත. එම ආයතන අතරින් ආයතන 9ක සිටින ළමයින් සඳහා ආයතනය තුළ හෝ ආයතනයෙන් පරිබාහිර ස්ථානයක නොවිධිමත් අධ්‍යාපන පහසුකම් සපයනු ලබන අතර ආයතන 8ක සිටින ළමයින් සඳහා නොවිධිමත් අධ්‍යාපන පහසුකම් සැපයීමක් සිදු නොකරන බව වාර්තා වී ඇත.

පාසල් යන ළමුන්ට පාසල් අධ්‍යාපනයට සමගාමීව අමතර පන්ති සඳහා සහභාගිවීමට අවස්ථාවක් ලබා

දීම තුළින් ඔවුන්ගේ විෂය දැනුම වර්ධනය කරගැනීමට අවස්ථාවක් සැලසෙනු ඇත. දකුණු පළාත තුළ පිහිටි ආයතන අතරින් ආයතන 27ක සිටින ළමයින් ආයතනය තුළ සහ/ හෝ ආයතනයෙන් පරිබාහිර ස්ථානවල පාසල් විෂය නිර්දේශයට සමගාමීව පවත්වනු ලබන අමතර පංති සඳහා ද සහභාගී කරවනු ලැබේ. ආයතනගත කර සිටින ළමයින් සඳහා අධ්‍යාපනය ලබා දීම ගැන සැලකීමේදී මෙය ඉතා සාධනීය තත්ත්වයක් ලෙස හඳුනාගත හැකි ය. අමතර අධ්‍යාපන පහසුකම් ලබා නොදෙන එක් ආයතනයක් වාර්තා වී ඇති අතර එම ආයතනයේ සිටින ළමුන් සඳහා ද මේ සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වාදීම කාලෝචිත බව පෙනී යයි.


ආයතනගත කර සිටින ළමුන්ට කිසියම් වෘත්තියක නිරතවීම සඳහා අවශ්‍ය මූලික පුහුණුව ලබා දී තිබීම ඉතා වැදගත් වේ. දකුණු පළාත තුළ අවුරුදු 16 හෝ ඊට වැඩි ළමුන් සිටින ආයතන 28ක් වාර්තා වී ඇති අතර ඒ අතරින් වෘත්තීය අධ්‍යාපනය ලබා දීම සිදු කරනු ලබන්නේ ආයතන 06ක සිටින ළමුන් සඳහා පමණක් බව වාර්තා වී ඇත. ආයතන 22ක, එනම් වෘත්තීය අධ්‍යාපනය ලබා දීමට සුදුසු වයසේ පසුවන ළමයින් සිටින ආයතනවලින් 79% පමණ සිටින ළමුන් සඳහා වෘත්තීය අධ්‍යාපන අවස්ථා ලබා දීම කෙරෙහි අවධානය යොමු කිරීමක් දක්නට නොලැබේ.

විධිමත්/ නොවිධිමත් අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව තුළින් ළමයකු තුළ අධ්‍යාපන සහ වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීමත්, පොතපත පරිශීලනය සඳහා අවස්ථාව සළසා දීම තුළින් චින්තන ශක්තිය වර්ධනය කිරීමත් කළ හැකි වේ. විශේෂයෙන් ආයතනගත ළමයින් සඳහා පොත්පත්/ පත්තර සැපයීම තුළින් ළමයින්ට සිය විවේක කාලය ඵලදායීව සිය දැනුම වර්ධනය සඳහා යොදවා ගත හැකි වේ. එම නිසා ළමුන් වෙනුවෙන් පුවත්පත්/ සඟරා මිල දී ගැනීම හා පුස්තකාල පහසුකම් ලබා දීම ළමා රැකවරණ මධ්‍යස්ථාන මගින් සිදුකළ යුතු ම කාර්යයන් ලෙස පෙන්වා දිය හැකි ය.

වගුව 3.5 ආයතන වර්ගය හා ළමයින්ගේ පරිශීලනය සඳහා පුවත්පත් සහ සඟරා මිල දී ගැනීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව

| ආයතන වර්ගය | එකතුව | දිනපතා මිලදී ගනී | සතියකට වරක් හෝ මිලදී ගනී | මිලදී ගන්නේ නැත |
|---|---|---|---|---|
| රැඳවුම් නිවාසය | 2 | 1 | 1 | - |
| සහතික කළ පාසල | 2 | - | 1 | 1 |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 1 | - | - | 1 |
| නිවර්තන ළමා නිවාසය | 1 | 1 | - | - |
| ස්වේච්ඡා ළමා නිවාසය | 24 | 4 | 15 | 5 |
| වෙනත් | 1 | - | - | 1 |
| **එකතුව** | **31** | **6** | **17** | **8** |

රූප සටහන 3.3
ළමුන්ගේ පරිශීලනය සඳහා පුවත්පත් සහ සඟරා මිල දී ගැනීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථානවල ප්‍රතිශත ව්‍යාප්තිය




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථාන ළමුන්ගේ පරිශීලනය වෙනුවෙන් පුවත්පත්/ සඟරා මිලදී ගැනීම පිළිබඳව විමසා බැලීමේදී මුළු ආයතනවලින් 74%ක් පමණ අවම වශයෙන් සතියකට වරක් හෝ පුවත්පත්/සඟරා මිලදී ගනු ලබන අතර ආයතන 8ක් කිසිසේත්ම පුවත්පත්/ සඟරා මිලදී ගනු නොලබන බව වාර්තා වී ඇත. එසේ වුව ද වයස අවුරුදු 5ට වැඩි ළමුන් රඳවා ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන අතරින් 1/4ක පමණ පුවත්පත්/ සඟරා මිලදීගැනීමක් සිදු නොවීම කිසිසේත් යහපත් තත්ත්වයක් නොවේ. ළමුන්ගේ වයස් මට්ටමට සුදුසු වන පරිදි එදිනෙදා ලෝකයේ වෙනස්වීම ග්‍රහණය කරදීම සඳහාත්, අධ්‍යාපන කටයුතුවලට අත්වැලක් සැපයීම සඳහාත් සෑම ළමා රැකවරණ මධ්‍යස්ථානයක්ම ළමයින් වෙනුවෙන් පුවත්පත්/ සඟරා මිලදී ගැනීම ඉතා වැදගත් වේ.

වගුව 3.6 ආයතන වර්ගය හා ළමුන් සඳහා ආයතනය තුළ පුස්තකාල පහසුකම් ලබා දී තිබීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව

| ආයතන වර්ගය | එකතුව | ආයතනය තුළ පුස්තකාල පහසුකම් ලබා දී ඇත | ආයතනය තුළ පුස්තකාල පහසුකම් ලබා දී නැත |
|---|---|---|---|
| රැඳවුම් නිවාසය | 2 | 2 | - |
| සහතික කළ පාසල | 2 | 2 | - |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 1 | 1 | - |
| නිවර්තන ළමා නිවාසය | 1 | 1 | - |
| ස්වේච්ඡා ළමා නිවාසය | 24 | 23 | 1 |
| වෙනත් | 1 | 1 | - |
| **එකතුව** | **31** | **30** | **1** |

ආයතනගත ළමයින් වෙනුවෙන් ආයතනය තුළ පුස්තකාල පහසුකම් ලබාදීම (වියිමත් පොත් එකතුවක් පවත්වාගෙන යාම) සලකා බැලීමේදී දකුණු පළාත තුළ පිහිටි ආයතන 31 අතරින් ආයතන 30ක් තුළම ළමයින් වෙනුවෙන් මෙම පහසුකම සලසා ඇති බව පෙනී යයි. මෙම පහසුකම ලබා දී නොමැති එකම ස්වේච්ඡා ළමා නිවාසය ද පුස්තකාල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු වේ.

ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ ළමයින්ගේ සෞඛ්‍ය අවශ්‍යතා සම්පූර්ණ කිරීම ඉහළ අවධානයකින් සිදුකළ යුතු තවත් වැදගත් සේවාවකි. විශේෂයෙන් ම බොහෝ විට තමුන්ගේ සමීප සමාජයෙන් වෙන් වී පොදු නීති රීති පද්ධතියකින් ආවරණය වූ සමූහ වාසස්ථානයක ජීවත්වන ළාබාල පිරිසක් සඳහා කායික සහ මානසික සෞඛ්‍ය යන අංශ දෙකම ආවරණය වන පරිදි සෞඛ්‍ය පහසුකම් සැපයීම සිදු කළ යුතු ය. ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා වන ප්‍රමිතීන්හි සඳහන් වන ආකාරයට ළමයින්ගේ වෛද්‍ය අවශ්‍යතාවන් ආයතනයට පැමිණ පරීක්ෂා කිරීමටත්, වෛද්‍ය මධ්‍යස්ථානයකට ළමයින් කැඳවාගෙන ගොස් ප්‍රතිකාර ලබා ගැනීමටත් හැකි වන පරිදි ආයතනයේ පරිපාලනය විසින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ පුද්ගලික වෛද්‍යවරයකු සමග සාකච්ඡා කොට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුව ඇත.

වගුව 3.7 ළමුන් සඳහා සෞඛ්‍ය පහසුකම් සැපයීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| පහසුකම/ සේවාව | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| **ළමයින් සඳහා සෞඛ්‍ය පහසුකම් සැපයීම** | | |
| ආයතනය තුළ මෙන් ම ආයතනයෙන් පරිබාහිර ස්ථානවල දී ද සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකු/ වෛද්‍යවරුන් විසින් සිදු කරයි | 22 | 71.0 |
| ආයතනයෙන් පරිබාහිර ස්ථානවල පමණක් සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකු/ වෛද්‍යවරුන් විසින් සිදු කරයි | 9 | 29.0 |
| **ළමයින් උපදේශන (counseling) වැඩසටහන් සඳහා සහභාගී කරවීම** | | |
| ආයතනය තුළ මෙන් ම ආයතනයෙන් පරිබාහිර ස්ථානවල දී ද සහභාගි කරවයි | 4 | 12.9 |
| ආයතනය තුළ පමණක් සහභාගි කරවයි | 22 | 71 |
| ආයතනයෙන් පරිබාහිර ස්ථානවල පමණක් සහභාගි කරවයි | 1 | 3.2 |
| සහභාගි කරවන්නේ නැත | 4 | 12.9 |
| **එකතුව** | **31** | **100** |

ආයතනගත ළමුන් වෙත සපයනු ලබන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ ලබාගත් තොරතුරු අනුව දකුණු පළාත තුළ පිහිටි ආයතන 100% ක්ම යම් ක්‍රමවේදයක් ඔස්සේ එම පහසුකම් ලබා දීමට කටයුතු කර ඇති බව පැහැදිළි වේ. එනම් ආයතනයෙන් බාහිර ව පමණක් වෛද්‍ය පහසුකම් සැපයීම ආයතන 9ක් මගින් සිදු කරනු ලබන අතර ආයතනය තුළ සහ අවශ්‍යතාවය මත ඉන් පරිබාහිරව වෛද්‍ය පහසුකම් සැපයීම ආයතන 22ක් මගින් සිදු කරයි.

ළමයින්ගේ මානසික සෞඛ්‍ය සඳහා වැදගත්වන උපදේශන වැඩසටහන් සඳහා ළමයින් යොමු කිරීම සලකා බැලූ විට මුළු ආයතන සංඛ්‍යාවෙන් 87% ක පමණ සිටින ළමයින් සඳහා ආයතනය තුළ, ආයතනයෙන් පරිබාහිරව හෝ මෙම ක්‍රම දෙකටම හෝ උපදේශනය සඳහා ළමයින් යොමු කරන බව වාර්තා වී ඇත. එසේ වුව ද ආයතන 4ක ළමුන් උපදේශන වැඩසටහන් සඳහා යොමු කරවීම සිදු නොවන බව වාර්තා වී ඇත. රජයේ භාරගැනීමේ ළමා

නිවාසය හැරුණු විට සෙසු ආයතනවල ජීවත්වන ළමුන් සඳහා කාලසටහන්ගත උපදේශන සැළැස්මක් පවත්වා ගැනීම අවශ්‍යතාවයක් බව පෙනී යයි.

දකුණු පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ ළමයින්ගේ පොදු කටයුතු වෙනුවෙන් ඉඩ පහසුකම් වෙන් කර ඇති ආකාරය පිළිබඳව තොරතුරු වගුව 3.8 මගින් ඉදිරිපත් කර ඇත.

### වගුව 3.8 ළමුන්ගේ පරිශීලනය/ ක්‍රියාකාරකම් සඳහා විශේෂ ස්ථාන වෙන්කර ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන

| ස්ථානය | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| ළමයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහා (දේශන ශාලා, පංති කාමර, පුස්තකාල වැනි) කාමර වෙන් කර ඇති | 28 | 90.3 |
| ශරීර සුවතා/ ව්‍යායාම කටයුතු සඳහා කාමර වෙන් කර ඇති | 8 | 25.8 |
| ළමයින් සඳහා ගෘහස්ථ ක්‍රීඩා පහසුකම් සපයා ඇති | 6 | 19.4 |
| ළමයින් සඳහා එළමහන් ක්‍රීඩා පිටියක් සපයා ඇති | 20 | 64.5 |
| කුඩා ළමයින්ගේ විනෝදාස්වාදය/ ක්‍රියාකාරකම් සඳහා ක්‍රීඩා පහසුකම් සහිත එළිමහන් උද්‍යානයක්/ උද්‍යාන ඇති | 22 | 71.0 |
| **මුළු ආයතන සංඛ්‍යාව** | **31** | **-** |

සටහන: සෑම ආයතනයක් සඳහා එක් එක් ස්ථානය වෙන් වෙන්ව සලකන බැවින් ආයතන සංඛ්‍යාවේ එකතුව මුළු ආයතන සංඛ්‍යාවට සමාන නොවේ

වගුව 3.8 ට අනුව මුළු ආයතනවලින් 90% කට වැඩි සංඛ්‍යාවක අධ්‍යාපන කටයුතු සඳහා වෙන් කළ ස්ථානයක්/ ස්ථාන පවත්වාගෙන යනු ලබන බව වාර්තා වීම ඉතා යහපත් තත්ත්වයක් ලෙස සඳහන් කළ හැකිය. ක්‍රීඩා හා ව්‍යායාම කටයුතු වෙනුවෙන් පහසුකම් සැපයීම පිළිබඳව සලකා බැලීමේදී එය සතුටුදායක තත්ත්වයක් නොවන බව ලැබී ඇති දත්ත අනුව පැහැදිලි වේ. ආයතනවලින් 35%කට ආසන්න සංඛ්‍යාවක ළමයින්ගේ ක්‍රීඩා කටයුතු/ ක්‍රියාකාරකම් වෙනුවෙන් එළිමහන් ක්‍රීඩා පිටියක් නොමැති බව වාර්තා කර ඇත. ආයතන පරිශ්‍රය තුළ ක්‍රීඩා පිටියක් නොමැති අවස්ථාවන්හිදී පිටස්තරව ඇති පොදු හෝ පාසල් ක්‍රීඩාංගනයක් ප්‍රයෝජනයට ගැනීමට විධිවිධාන සලසා තිබීම මෙහි දී වැදගත් වේ.

ළමයින්ගේ කායික හා මානසික ක්‍රියාකාරීත්වය යහපත් මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා හොඳ නින්දක් ලැබීම අත්‍යවශ්‍ය සාධකයක් වේ. ඒ සඳහා ළමා රැකවරණ මධ්‍යස්ථානයක සෑම ළමයෙක් සඳහාම එම ළමයාගේ වයස අනුව ඇඳක් හෝ තොටිල්ලක් සහ සෑම ඇඳකටම මදුරු දැලක් ලබා දී තිබිය යුතු බව ළමා රැකවරණ මධස්ථාන සඳහා වන ප්‍රමිතීන්හි ද සඳහන්ව ඇත.

වගුව 3.9 අනුව බලන විට දකුණු පළාතේ ළමා රැකවරණ මධ්‍යස්ථාන 31 අතරින් 24ක් තුළම සෑම ළමයෙක් වෙනුවෙන්ම ඇඳක් වෙන් කර ඇති බව වාර්තා වී ඇති අතර ආයතන 5ක ළමයින් සංඛ්‍යාවට ප්‍රරමාණවත් වන සේ ඇඳන් සංඛ්‍යාවක් නොමැති බව වාර්තා වී තිබීම සලකා බැලිය යුතු තත්ත්වයකි.

### වගුව 3.9 ළමුන් සඳහා වෙන් කර ඇති ඇඳන් සංඛ්‍යාවේ ප්‍රමාණවත්භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| ඇඳන් සංඛ්‍යාවේ ප්‍රමාණවත්භාවය | වෙන් කළ ඇඳන් | |
|---|---|---|
| | සංඛ්‍යාව | % |
| සෑම ළමයෙක් සඳහාම ඇඳක් වෙන් කර ඇත | 24 | 77.4 |
| ළමයින් සඳහා ප්‍රමාණවත් ඇඳන් සංඛ්‍යාවක් නැත | 5 | 16.1 |
| ඇඳන් සංඛ්‍යාව සඳහන් කර නැත | 2 | 6.5 |
| **එකතුව** | **31** | **100** |

අනාථ, අත්හල, අසරණ ළමයකු වීම නිසා හෝ ළමා වින්දිතයකු, සැකකරුවකු, වරදකරුවකු වශයෙන් හෝ වෙනත් හේතුවක් මත ආයතනගත වන ළමුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් කටයුතු කර ඔවුන් සමාජගත කිරීමේ වගකීම එකී ආයතන විසින් දරනු ලබන අතර රඳවා ගන්නා ළමුන් සඳහා යෝග්‍ය පරිසරයක් ආයතනය තුළ පැවතීම ඒ සඳහා අවශ්‍යයෙන් ම විය යුත්තක් වේ. ඒ අනුව යම් හෙයකින් ආයතනයක ඇති පහසුකම් ඉක්මවා

අමතර ළමුන් ආයතනය තුළ නේවාසික කිරීමට සිදුවුවහොත් එය ඔවුන්ගේ මූලික සුභසාධන අවශ්‍යතා සම්බන්ධයෙන් ගැටළුවකි. ඒ නිසා මෙම සංගණනයේ දී අතිරික්ත ළමුන් සංඛ්‍යාවක් රඳවා සිටින ආයතන හඳුනාගැනීමට අවශ්‍ය තොරතුරු රැස් කළ අතර වගුව 3.10 මගින් එම තොරතුරු ඉදිරිපත් කර ඇත.

### වගුව 3.10 අතිරික්ත ළමුන් සංඛ්‍යාවක් රඳවා සිටින ළමා රැකවරණ මධ්‍යස්ථාන ආයතන වර්ගය අනුව

| ආයතන වර්ගය | මුළු ආයතන සංඛ්‍යාව | අතිරික්ත ළමයින් සංඛ්‍යාවක් සිටින ආයතන | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | % |
| රැඳවුම් නිවාසය | 2 | 1 | 50.0 |
| සහතික කළ පාසල | 2 | 1 | 50.0 |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 1 | 1 | 100.0 |
| නිවර්තන ළමා නිවාසය | 1 | 1 | 100.0 |
| ස්වේච්ඡා ළමා නිවාසය | 24 | 1 | 4.2 |
| වෙනත් | 1 | - | - |
| **එකතුව** | **31** | **5** | **16.1** |

ඉහත වගුව අනුව පෙනී යන්නේ මෙම පළාතේ ළමා රැකවරණ මධ්‍යස්ථාන 31 අතරින් ආයතන 5ක් තුළ සංගණනය පවත්වන අවස්ථාව වන විට අතිරික්ත ළමුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇති බවයි. මෙම ආයතන 5 තුළ රාජ්‍ය අංශය මගින් පවත්වාගෙන යන ආයතන 4ක් තිබීම විශේෂත්වයකි. එම නිසා මේ පිළිබඳව අවධානය යොමු කර මෙම ආයතන තුළ ළමයින් සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් ලබා දීම වෙනුවෙන් සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුව ඇත. එසේම ස්වේච්ඡා ළමා නිවාසවල අතිරික්ත ළමුන් වාර්තා වන අවස්ථාවන්හිදී එම ළමුන් සඳහා විකල්ප ආයතන හඳුන්වා දීමට හෝ කටයුතු කළ යුතු වේ.

ආයතනගත ළමයින් සඳහා වැසිකිළි පහසුකම් සැපයීමේදී නිර්දේශය වන්නේ උපරිම වශයෙන් ළමයින් 8 දෙනෙකු සඳහා එක් වැසිකිළියක්වත් වන සේ ආයතනය තුළ වැසිකිළි පහසුකම් ලබා දිය යුතු බවයි. ආයතනගත ළමුන් සඳහා වැසිකිළි පහසුකම් සපයා දී ඇති ආකාරය වගුව 3.11 මගින් ඉදිරිපත් කර ඇත.

### වගුව 3.11 ළමුන් සඳහා වෙන් කරන ලද වැසිකිළිවල ප්‍රමාණවත්භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| වැසිකිළිවල ප්‍රමාණවත්භාවය | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| එක් ළමයෙක් සඳහා එක් වැසිකිළියක් බැගින් ඇත | 2 | 6.5 |
| ළමයින් දෙදෙනෙක් සඳහා එක් වැසිකිළියක් බැගින් ඇත | 7 | 22.6 |
| ළමයින් 3 – 4 සඳහා එක් වැසිකිළියක් බැගින් ඇත | 12 | 38.7 |
| ළමයින් 5 - 6 සඳහා එක් වැසිකිළියක් බැගින් ඇත | 5 | 16.1 |
| ළමයින් 7 - 8 සඳහා එක් වැසිකිළියක් බැගින් ඇත | 2 | 6.5 |
| ළමයින් 9 - 10 සඳහා එක් වැසිකිළියක් බැගින් ඇත | 2 | 6.5 |
| ළමයින් 11 - 20 සඳහා එක් වැසිකිළියක් බැගින් ඇත | 1 | 3.2 |
| **එකතුව** | **31** | **100** |


ළමයින් සඳහා වැසිකිළි පහසුකම් සැපයීම සලකා බැලූ විට පෙනී යන්නේ සමස්තයක් වශයෙන් දකුණු පළාතේ ආයතන තුළ වැසිකිළි පහසුකම් සැපයීම ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන ගිය ද ආයතන 3ක පමණක් ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සැපයීමක් සිදු නොවන බවයි. විශේෂයෙන්ම එක් ආයතනයක ළමුන් 11 - 20 සඳහා එක් වැසිකිළියක් පමණක් වෙන් කර ඇති බව වාර්තාවීම ඉතා ඉක්මනින් අවධානය යොමු කළ යුතු කරුණකි.

ළමයින්ගේ සෞඛ්‍ය සම්පන්න පැවැත්මක් වෙනුවෙන් ජල පහසුකම් සපයා ගැනීමේ දී අවධානය යොමු කර ඇති ආකාරය පිළිබඳ දළ අදහසක් ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු ද සංගණනය මගින් රැස් කරන ලදී.

### වගුව 3.12 බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| ප්‍රධාන නල ජලය | 21 | 67.7 |
| ආරක්ෂිත ළිඳ | 9 | 29.0 |
| නල ළිඳ | 1 | 3.2 |
| **එකතුව** | **31** | **100** |

රූප සටහන 3.4
බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

පළාත තුළ ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන අතරින් 97% ක පමණ ප්‍රතිශතයක් ප්‍රධාන නල ජලය හෝ ආරක්ෂිත ළිඳ මාර්ගයෙන් ජල පහසුකම ලබාගෙන තිබීම විශේෂත්වයකි.

## 3.3 ආයතනික වත්කම්

ප්‍රධාන වශයෙන් ළමයින්ගේ සුභසාධනය සඳහා ප්‍රයෝජනවත් වන ආයතනය සතු මෝටර් වාහන හිමිකාරීත්වය හා ඉඩම් අයිතිය පිළිබඳ තොරතුරු ආයතනික වත්කම් යටතේ රැස් කරන ලදී.

ළමා රැකවරණ මධ්‍යස්ථාන සතුව මෝටර් වාහන හිමිකාරීත්වයක් පැවතීම ළමයින්ගේ සුභසාධනය සඳහා ධනාත්මකව බලපායි. එසේම ආයතනගත ළමයින් සඳහා සුරක්ෂිතව ප්‍රවාහන පහසුකම් සැපයීමේ අවස්ථාව ලැබීම තුළින් ආයතනයෙන් පිටතදී ළමයින්ගේ ආරක්ෂාව තහවුරුකර ගැනීමට මහඟු අවස්ථාවක් ලැබේ. වගුව 3.13 මගින් දකුණු පළාතේ ඇති ආයතන සතු මෝටර් වාහන හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.


දකුණු පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථාන අතරින් 42% (13) කට පමණ මෝටර් වාහන හිමිකාරීත්වයක් නොමැති බව වාර්තා වීම සලකා බැලිය යුතු කරුණක් වේ. ඉතිරි ආයතන 18 සඳහා අවම වශයෙන් එක් වාහනයක් හෝ ඇති අතර, වාහන 2 පමණක් ඇති ආයතන 2ක් ද වාහන 3ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇති ආයතන 3ක් ද ඒ අතර වේ. එසේම වාහන 1ක් පමණක් ඇති ආයතන 13 වාර්තා වී ඇති අතර ඒ අතරින් ආයතන 11 ක් තුළ ඇත්තේ වෑන් රථයක් හෝ ත්‍රීරෝද රථයකි.

### වගුව 3.13 මෝටර් වාහන හිමිකාරිත්වය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| මෝටර් වාහන වර්ගය | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| බස් රථ | 3 | 9.7 |
| වෑන් රථ | 8 | 25.8 |
| ත්‍රීරෝද රථ | 10 | 32.3 |
| ට්‍රැක්ටර්/අත් ට්‍රැක්ටර් | 1 | 3.2 |
| මෝටර් සයිකල් | 2 | 6.5 |
| ලොරි රථ | 1 | 3.2 |
| මෝටර් වාහන නැත | 13 | 41.9 |
| **මුළු ආයතන සංඛ්‍යාව** | **31** | **-** |

සටහන: ඇතැම් ආයතනවල වර්ග කිහිපයක වාහන ඇති බැවින් ආයතන සංඛ්‍යාවේ එකතුව මුළු ආයතන සංඛ්‍යාවට සමාන නොවේ.

රූප සටහන 3.5
මෝටර් වාහන හිමිකාරිත්වය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව


ළමා රැකවරණ මධ්‍යස්ථානවලට අයත් භූමි ප්‍රමාණය කොපමණ ද යන්න විමසා බැලීම සඳහා අවශ්‍ය තොරතුරු ද මෙම සංගණනයේදී රැස් කරන ලදී.

දකුණු පළාත තුළ ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන සලකා බැලීමේදී මුළු ආයතන සංඛ්‍යාවෙන් 64%කට වැඩි සංඛ්‍යාවක් අක්කර 1 හෝ ඊට වැඩි භූමි ප්‍රමාණයකට හිමිකම් කියන බව වාර්තා වී තිබීම සාධනීය තත්ත්වයක් ලෙස සඳහන් කළ හැකිය.

### වගුව 3.14 ආයතනයට අයත් මුළු භූමි ප්‍රමාණය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| භූමි ප්‍රමාණය | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| පර්චස් 20 - 39 | 3 | 9.7 |
| පර්චස් 40 -79 | 5 | 16.1 |
| පර්චස් 80 -119 | 2 | 6.5 |
| අක්කර 1 සිට අක්කර 2ට අඩු | 5 | 16.1 |
| අක්කර 2 සිට අක්කර 3ට අඩු | 5 | 16.1 |
| අක්කර 3 සිට අක්කර 5ට අඩු | 1 | 3.2 |
| අක්කර 5 සිට අක්කර 10ට අඩු | 5 | 16.1 |
| අක්කර 10 හෝ ඊට වැඩි | 4 | 12.9 |
| සඳහන් කර නැත | 1 | 3.2 |
| **එකතුව** | **31** | **100** |

රූප සටහන 3.6
ආයතනයට අයත් මුළු භූමි ප්‍රමාණය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

## 3.4 ආයතනික කමිටු රැස්වීම්

ආයතනගත ළමුන් පිළිබඳ සමාලෝචනය කිරීම ඒ ඒ ආයතනවල පිහිටුවා ඇති කමිටු හරහා සිදු කරනු ලබන්නකි. ස්ථාපන කමිටු (Placement Committees), බලපත්‍ර කමිටු (Warrant Committees), විෂය කමිටු (Case Committees) වශයෙන් එක් එක් ආයතන වර්ගයට අදාළ කමිටු අදාළ කාලසීමා තුළ දී පැවැත්වීම ළමයා පිළිබඳ අවශ්‍ය තීන්දු තීරණ ගැනීම සඳහා ඉතා වැදගත් වේ.එම නිසා එක් එක් වර්ගයේ ආයතන මගින් අදාළ කමිටු රැස්වීම් පවත්වනු ලබන ආකාරය පිළිබඳ තොරතුරු මෙම සංගණනය මගින් එක් රැස් කරන ලදී.

### වගුව 3.15 ආයතන වර්ගය හා ස්ථාපන කමිටු/ බලපත්‍ර කමිටු/ විෂය කමිටු රැස්වීම් පැවැත්වීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| ආයතන වර්ගය | මුළු ආයතන සංඛ්‍යාව | කමිටු රැස්වීම් පවත්වනු ලබන ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| රැඳවුම් නිවාසය | 2 | - |
| සහතික කළ පාසල | 2 | 2 |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 1 | 1 |
| නිවර්තන ළමා නිවාසය | 1 | 1 |
| ස්වේච්ඡා ළමා නිවාසය | 24 | 24 |
| වෙනත් | 1 | - |
| **එකතුව** | **31** | **28** |

### වගුව 3.16 2019 වසර තුළ පවත්වා ඇති ස්ථාපන කමිටු/ බලපත්‍ර කමිටු/ විෂය කමිටු රැස්වීම් සංඛ්‍යාව අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන

| පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| රැස්වීම් 1 | 21 | 75.0 |
| රැස්වීම් 2 | 2 | 7.1 |
| රැස්වීම් 3 | 3 | 10.7 |
| රැස්වීම් පවත්වා නැත | 2 | 7.1 |
| **එකතුව** | **28** | **100** |

කමිටු රැස්වීම් පැවැත්වීම පිළිබඳ රැස්කරන ලද තොරතුරු අනුව කමිටු රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාවයක් නොමැති රැඳවුම් නිවාස 2 හි හැරුණු විට ඉතිරි ආයතන 29 අතරින් ආයතන 28ක් තුළම කමිටු රැස්වීම් වාර පැවැත්වෙන බව වාර්තා වී ඇති බව වගුව 3.15 මගින් පැහැදිලි වේ. එසේම කමිටු රැස්වීම් පවත්වනු ලබන ආයතන අතරින් ආයතන 2ක් හැරුණු විට අනෙකුත් ආයතනවල අවම වශයෙන් එක් කමිටු රැස්වීමක් හෝ 2019 වර්ෂය තුළ පවත්වා ඇති බව වගුව 3.16 අනුව පැහැදිලි වේ. කෙසේ වුව ද මෙම ආයතන තුළ කමිටු රැස්වීම් විධිමත් ව සිදු නො වන බවක් සංගණන දත්ත තුළ සමස්තයක් ලෙස නිරීක්ෂණය වේ.

# 4 වන පරිච්ඡේදය
# ළමා රැකවරණ මධ්‍යස්ථානගත ළමුන් පිළිබඳ තොරතුරු

දකුණු පළාත තුළ පිහිටුවා ඇති ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ රැකවරණය ලබමින් සිටින ළමුන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම මෙම පරිච්ඡේදය මගින් සිදු කරනු ලැබේ. මෙහිදී ළමයා පිළිබඳ මූලික තොරතුරු, ළමයා ආයතනගත කිරීමට අදාළ තොරතුරු, අධ්‍යාපනය හා සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, දෙමාපියන් හා භාරකරුවන් පිළිබඳ තොරතුරු, සහෝදර සහෝදරියන් පිළිබඳ තොරතුරු හා සමාජගත කිරීමට අදාළ තොරතුරු විමසා බලනු ලැබේ.

## 4.1 ළමුන් පිළිබඳ මූලික තොරතුරු

ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ රැකවරණය ලබමින් සිටින ළමුන් සඳහා විකල්ප රැකවරණ ක්‍රම හඳුනාගැනීමේ අරමුණින් දත්ත එක්රැස් කිරීමේදී ළමයාගේ මූලික ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු සඳහා වැඩි ප්‍රමුඛතාවයක් හිමි වේ.

වගුව 4.1 දිස්ත්‍රික්කය, ආයතන වර්ගය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්


| දිස්ත්‍රික්කය හා ආයතන වර්ගය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **දකුණු පළාත** | **921** | **100** | **324** | **100** | **597** | **100** |
| රැඳවුම් නිවාසය | 31 | 3.4 | 8 | 2.5 | 23 | 3.9 |
| සහතික කළ පාසල | 115 | 12.5 | 50 | 15.4 | 65 | 10.9 |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 79 | 8.6 | 45 | 13.9 | 34 | 5.7 |
| නිවර්තන ළමා නිවාසය | 93 | 10.1 | 47 | 14.5 | 46 | 7.7 |
| ස්වේච්ඡා ළමා නිවාසය | 583 | 63.3 | 160 | 49.4 | 423 | 70.9 |
| වෙනත් | 20 | 2.2 | 14 | 4.3 | 6 | 1.0 |
| **ගාල්ල** | **725** | **100** | **270** | **100** | **455** | **100** |
| රැඳවුම් නිවාසය | 31 | 4.3 | 8 | 3.0 | 23 | 5.1 |
| සහතික කළ පාසල | 115 | 15.9 | 50 | 18.5 | 65 | 14.3 |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 79 | 10.9 | 45 | 16.7 | 34 | 7.5 |
| නිවර්තන ළමා නිවාසය | 93 | 12.8 | 47 | 17.4 | 46 | 10.1 |
| ස්වේච්ඡා ළමා නිවාසය | 407 | 56.1 | 120 | 44.4 | 287 | 63.1 |
| **මාතර** | **97** | **100** | **15** | **100** | **82** | **100** |
| ස්වේච්ඡා ළමා නිවාසය | 97 | 100.0 | 15 | 100.0 | 82 | 100.0 |
| **හම්බන්තොට** | **99** | **100** | **39** | **100** | **60** | **100** |
| ස්වේච්ඡා ළමා නිවාසය | 79 | 79.8 | 25 | 64.1 | 54 | 90.0 |
| වෙනත් | 20 | 20.2 | 14 | 35.9 | 6 | 10.0 |

දකුණු පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ සංගණනය පවත්වන අවස්ථාව වන විට ළමුන් 921 දෙනෙක් නේවාසිකව රැකවරණය ලබමින් සිටි බව සංගණන දත්ත මගින් අනාවරණය වේ. දකුණු පළාත තුළ දිස්ත්‍රික්ක අතර ආයතනගත ළමුන්ගේ ව්‍යාප්තිය පිළිබඳ සලකා බැලීමේදී වැඩිම ළමුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ වැඩිම ආයතන සංඛ්‍යාවක් පිහිටි ගාල්ල දිස්ත්‍රික්කය තුළිනි. එය දකුණු පළාතේ ආයතනගත ළමුන්ගෙන් 79 % ක් පමණ වේ. එසේම මාතර දිස්ත්‍රික්කය තුළ 10% ක් ද, හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ 11% ද ලෙස ආයතනගත ළමුන් ව්‍යාප්තව ඇත.

ආයතන වර්ගය අනුව ළමුන්ගේ ව්‍යාප්තිය පිළිබඳව සැලකීමේදී වැඩිම ආයතන සංඛ්‍යාව වාර්තා වන ස්වේච්ඡා ළමා නිවාස තුළින් 63% (583) කට වැඩි ළමුන් ප්‍රතිශතයක් වාර්තා වන අතර අනෙකුත් වර්ගවලට අයත් ආයතනවලින් වාර්තා වන්නේ 37% (338) කට අඩු ළමයින් ප්‍රතිශතයකි.

දකුණු පළාත තුළ ආයතනගත ළමුන්ගේ ව්‍යාප්තිය ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව සැලකීමේදී 35%ක් පිරිමි ළමුන් ද, 65%ක් ගැහැණු ළමුන්ද ලෙස ව්‍යාප්තව ඇති බව දත්ත මගින් පැහැදිලි වේ. ආයතන වර්ගය අනුව සැලකීමේදී ස්වේච්ඡා ළමා නිවාස, සහතික කළ පාසල් හා රැඳවුම් නිවාස තුළින් වැඩි වශයෙන් ගැහැණු ළමුන් ද, රජයේ භාරගැනීමේ ළමා නිවාසය හා නිවර්තන ළමා නිවාසය තුළින් වැඩි වශයෙන් පිරිමි ළමුන් ද වාර්තා වන බව පෙනේ. රූප සටහන 4.1 මගින් දක්වා ඇති පරිදි සියලුම දිස්ත්‍රික්ක තුළ ගැහැණු ළමයින්ගේ ව්‍යාප්තිය පිරිමි ළමුන්ට සාපේක්ෂව ඉහළ අගයක් පෙන්නුම් කරනු ලබයි.

රූප සටහන 4.1
දිස්ත්‍රික්කය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්





මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

වගුව 4.2 දිස්ත්‍රික්කය, වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්

| දිස්ත්‍රික්කය හා වයස | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **දකුණු පළාත** | **921** | **100** | **324** | **100** | **597** | **100** |
| <1 | 9 | 1.0 | 3 | 0.9 | 6 | 1.0 |
| 1 | 14 | 1.5 | 8 | 2.5 | 6 | 1.0 |
| 2 | 8 | 0.9 | 5 | 1.5 | 3 | 0.5 |
| 3 | 15 | 1.6 | 9 | 2.8 | 6 | 1.0 |
| 4 | 22 | 2.4 | 11 | 3.4 | 11 | 1.8 |
| 5 | 22 | 2.4 | 13 | 4.0 | 9 | 1.5 |
| 6 | 21 | 2.3 | 8 | 2.5 | 13 | 2.2 |
| 7 | 41 | 4.5 | 20 | 6.2 | 21 | 3.5 |
| 8 | 36 | 3.9 | 12 | 3.7 | 24 | 4.0 |
| 9 | 38 | 4.1 | 14 | 4.3 | 24 | 4.0 |
| 10-14 | 345 | 37.5 | 124 | 38.3 | 221 | 37.0 |
| 15-17 | 308 | 33.4 | 87 | 26.9 | 221 | 37.0 |
| 18+ | 42 | 4.6 | 10 | 3.1 | 32 | 5.4 |
| **ගාල්ල** | **725** | **100** | **270** | **100** | **455** | **100** |
| <1 | 9 | 1.2 | 3 | 1.1 | 6 | 1.3 |
| 1 | 14 | 1.9 | 8 | 3.0 | 6 | 1.3 |
| 2 | 8 | 1.1 | 5 | 1.9 | 3 | 0.7 |
| 3 | 15 | 2.1 | 9 | 3.3 | 6 | 1.3 |
| 4 | 21 | 2.9 | 10 | 3.7 | 11 | 2.4 |
| 5 | 18 | 2.5 | 12 | 4.4 | 6 | 1.3 |
| 6 | 10 | 1.4 | 4 | 1.5 | 6 | 1.3 |
| 7 | 27 | 3.7 | 11 | 4.1 | 16 | 3.5 |
| 8 | 30 | 4.1 | 10 | 3.7 | 20 | 4.4 |
| 9 | 26 | 3.6 | 11 | 4.1 | 15 | 3.3 |
| 10-14 | 255 | 35.2 | 101 | 37.4 | 154 | 33.8 |
| 15-17 | 259 | 35.7 | 79 | 29.3 | 180 | 39.6 |
| 18+ | 33 | 4.6 | 7 | 2.6 | 26 | 5.7 |
| **මාතර** | **97** | **100** | **15** | **100** | **82** | **100** |
| <1 | - | - | - | - | - | - |
| 1 | - | - | - | - | - | - |
| 2 | - | - | - | - | - | - |
| 3 | - | - | - | - | - | - |
| 4 | - | - | - | - | - | - |
| 5 | 2 | 2.1 | - | - | 2 | 2.4 |
| 6 | 6 | 6.2 | 3 | 20.0 | 3 | 3.7 |
| 7 | 4 | 4.1 | 1 | 6.7 | 3 | 3.7 |
| 8 | 1 | 1.0 | - | - | 1 | 1.2 |
| 9 | 8 | 8.2 | 2 | 13.3 | 6 | 7.3 |
| 10-14 | 40 | 41.2 | 5 | 33.3 | 35 | 42.7 |
| 15-17 | 30 | 30.9 | 3 | 20.0 | 27 | 32.9 |
| 18+ | 6 | 6.2 | 1 | 6.7 | 5 | 6.1 |
| **හම්බන්තොට** | **99** | **100** | **39** | **100** | **60** | **100** |
| <1 | - | - | - | - | - | - |
| 1 | - | - | - | - | - | - |
| 2 | - | - | - | - | - | - |
| 3 | - | - | - | - | - | - |
| 4 | 1 | 1.0 | 1 | 2.6 | - | - |
| 5 | 2 | 2.0 | 1 | 2.6 | 1 | 1.7 |
| 6 | 5 | 5.1 | 1 | 2.6 | 4 | 6.7 |
| 7 | 10 | 10.1 | 8 | 20.5 | 2 | 3.3 |
| 8 | 5 | 5.1 | 2 | 5.1 | 3 | 5.0 |
| 9 | 4 | 4.0 | 1 | 2.6 | 3 | 5.0 |
| 10-14 | 50 | 50.5 | 18 | 46.2 | 32 | 53.3 |
| 15-17 | 19 | 19.2 | 5 | 12.8 | 14 | 23.3 |
| 18+ | 3 | 3.0 | 2 | 5.1 | 1 | 1.7 |

රූප සටහන 4.2 :
වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්





මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ ආයතනගත ළමුන්ගේ ව්‍යාප්තිය වයස අනුව සැලකීමේදී අවුරුදු 10-14 වයස් කාණ්ඩයෙන් 37% (345)ක තරම් ඉහළ ප්‍රතිශතයක් වාර්තා වී ඇති බව පෙනේ. එසේම අවුරුදු 15-17 වයස් කාණ්ඩයෙන් 33% (308)ක්ද, අවුරුදු 0-9 වයස් කාණ්ඩයෙන් 25% (226)ක්ද වාර්තා වී ඇත. රට තුළ පවත්නා නීතිමය රාමුව තුළ අවුරුදු 18 හෝ ඊට වැඩි ළමුන් ආයතනගතව සිටිය නොහැකි වුව ද දකුණු පළාත තුළ ආයතනගත ළමුන් අතරින් 42 දෙනෙක් වයස අවුරුදු 18 හෝ ඊට වැඩි වයසේ පසුවන බව වාර්තා වී ඇත.

### වගුව 4.3 ජාතිය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්

| ජාතිය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| සිංහල | 759 | 82.4 | 254 | 78.4 | 505 | 84.6 |
| ශ්‍රී ලංකා දෙමළ | 98 | 10.6 | 39 | 12.0 | 59 | 9.9 |
| ඉන්දියානු දෙමළ | 27 | 2.9 | 10 | 3.1 | 17 | 2.8 |
| ශ්‍රී ලංකා යෝනක | 8 | 0.9 | 5 | 1.5 | 3 | 0.5 |
| වෙනත් | 2 | 0.2 | 1 | 0.3 | 1 | 0.2 |
| ජන වර්ගය නොදනී | 27 | 2.9 | 15 | 4.6 | 12 | 2.0 |
| **එකතුව** | **921** | **100** | **324** | **100** | **597** | **100** |

රූප සටහන 4.3
ජාතිය අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

ජාතිය අනුව ආයතනගත ළමුන්ගේ ව්‍යාප්තිය පිළිබඳව විමසා බැලීමේදී දකුණු පළාත තුළ සිංහල ළමුන් 82.4%ක තරම් ඉහළ ප්‍රතිශතයක් වාර්තා වී ඇති බව පෙනේ. ආයතනගත ළමුන්ගේ ජාතිය හා ස්ත්‍රී/ පුරුෂ භාවය සැලකීමේදී ශ්‍රී ලංකා යෝනක හැර අනෙකුත් සියලුම ජාතීන් තුළ පුරුෂ නියෝජනයට සාපේක්ෂව ස්ත්‍රී නියෝජනය ඉහළ අගයක් පෙන්නුම් කරනු ලබයි.

### වගුව 4.4 ආගම හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්

| ආගම | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| බෞද්ධ | 823 | 89.4 | 283 | 87.3 | 540 | 90.5 |
| හින්දු | 74 | 8.0 | 31 | 9.6 | 43 | 7.2 |
| ඉස්ලාම් | 6 | 0.7 | 4 | 1.2 | 2 | 0.3 |
| රෝමානු කතෝලික | 3 | 0.3 | 1 | 0.3 | 2 | 0.3 |
| වෙනත් ක්‍රිස්තියානි | 13 | 1.4 | 4 | 1.2 | 9 | 1.5 |
| වෙනත් | 1 | 0.1 | 1 | 0.3 | - | - |
| සඳහන් නොකළ | 1 | 0.1 | - | - | 1 | 0.2 |
| **එකතුව** | **921** | **100** | **324** | **100** | **597** | **100** |

ආයතනගත ළමුන්ගේ ව්‍යාප්තිය ආගම අනුව සැලකීමේදී 89%ක් බෞද්ධ ළමුන් ද, 8%ක් හින්දු ළමුන් ද, 0.7%ක් ඉස්ලාම් ළමුන් ද හා 1.7%ක් රෝමානු කතෝලික/ වෙනත් ක්‍රිස්තියානි ළමුන් ද වශයෙන් වාර්තා වී ඇත.

### වගුව 4.5 දිස්ත්‍රික්කය හා ළමයා උපදින විට මව බාලවයස්කාරියක් ද යන වග අනුව ආයතනගත ළමුන්

| දිස්ත්‍රික්කය | එකතුව | | මව බාලවයස්කාරියකි | | මව බාලවයස්කාරියක් නොවේ | | මව බාලවයස්කාරියක් ද යන්න නොදනී | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ගාල්ල | 725 | 100 | 58 | 8.0 | 555 | 76.6 | 112 | 15.4 |
| මාතර | 97 | 100 | 6 | 6.2 | 74 | 76.3 | 17 | 17.5 |
| හම්බන්තොට | 99 | 100 | 9 | 9.1 | 74 | 74.7 | 16 | 16.2 |
| **එකතුව** | **921** | **100** | **73** | **7.9** | **703** | **76.3** | **145** | **15.7** |

ආයතනගත කර සිටින ළමයා උපදින අවස්ථාව වන විට මව බාල වයස්කාරියක් වූයේ ද යන්න විමසා බැලීම සමාජ විද්‍යාත්මකව ඉතා වැදගත් කරුණක් වන අතර ප්‍රතිපත්ති සම්පාදනයේදී හා සැලසුම් සකස් කිරීමේදී ළමා මව්වරු කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍යයෙන්ම සිදු කළ යුත්තක් බැවින් සංගණනය මගින් ආයතනගත ළමයාගේ මව බාල වයස්කාරියක් ද යන්න හඳුනාගැනීමට උත්සාහ දරා ඇත.ඒ අනුව දකුණු පළාත තුළ ආයතනගත කර සිටින ළමයින් අතරින් 7.9%ක්, එනම් ළමුන් 73ක් උපදින විට මව බාල වයස්කාරියක් බව සංගණන තොරතුරු මගින් නිශ්චිතව තහවුරු වී ඇත. කෙසේ වුවද ළමුන් 145කගේ මවගේ වයස (ළමයා උපදින විට) නිශ්චිතව තහවුරු කර නොමැත.

### වගුව 4.6 ආයතන වර්ගය හා උපත ලියාපදිංචියේ ස්වභාවය අනුව ආයතනගත ළමුන්

| ආයතන වර්ගය | එකතුව | | ලියාපදිංචි කළ | | ලියාපදිංචි නොකළ | | නොදනී | | සඳහන් නොකළ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| රැඳවුම් නිවාසය | 31 | 100 | 14 | 45.2 | - | - | 17 | 54.8 | 1 | 2.5 |
| සහතික කළ පාසල | 115 | 100 | 104 | 90.4 | 4 | 3.5 | 7 | 6.1 | - | - |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 79 | 100 | 56 | 70.9 | 23 | 29.1 | - | - | 1 | 1.0 |
| නිවර්තන ළමා නිවාසය | 93 | 100 | 85 | 91.4 | 4 | 4.3 | 4 | 4.3 | - | - |
| ස්වේච්ඡා ළමා නිවාසය | 583 | 100 | 545 | 93.5 | 16 | 2.7 | 22 | 3.8 | - | - |
| වෙනත් | 20 | 100 | 18 | 90.0 | 1 | 5.0 | 1 | 5.0 | 3 | 0.1 |
| **එකතුව** | **921** | **100** | **822** | **89.3** | **48** | **5.2** | **51** | **5.5** | **5** | **0.2** |

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් 921 දෙනා අතරින් ළමුන් 48 (5.2%) කගේ උපත ලියාපදිංචි කර නොමැති බව වාර්තා වී ඇති අතර ළමයින් 51කගේ උපත ලියාපදිංචි කර ඇත්ද යන්න නොදන්නා බව වාර්තා වී ඇත. ළමුන් 822 දෙනෙකුගේ පමණක් උපත ලියාපදිංචි කර ඇති බව වාර්තා වී ඇත. ආයතන වර්ගය අනුව උපත ලියාපදිංචිය සැලකීමේ දී ලියාපදිංචි කළ උපත් අවම අගයක් වාර්තා වන්නේ රැඳවුම් නිවාස තුළින් වන අතර රැඳවුම් නිවාසවල සිටින ළමුන්ගෙන් 55%ක පමණ උපත ලියාපදිංචි කර ඇත්ද යන්න නොදන්නා බව වාර්තා වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ඉතා කෙටි කාල පරිච්ඡේද සඳහා ළමුන් රැඳවුම් නිවාසවලට ඇතුළත් කරන බැවින් එම ළමුන් පිළිබඳ ආයතනය සතුව ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම විය හැකි බව සඳහන් කළ හැකි ය. රජයේ භාරගැනීමේ ළමා නිවාසය තුළ ද උපත් ලියාපදිංචිය අවම අගයක් පෙන්නුම් කරනු ලැබුව ද එයට හේතුව එම ආයතනයේ සිටින ළදරු වයසේ පසුවන ළමුන්ගේ උපත් ලියාපදිංචිය ඒ වන තුරු සිදු කර නොතිබීම විය හැකිය. සමස්තයක් ලෙස අනෙකුත් සියලු ආයතන වර්ග තුළ උපත් ලියාපදිංචිය 90%කට වැඩි අගයක් වාර්තා වී ඇත.

### වගුව 4.7 ආයතන වර්ගය හා උපත ලියාපදිංචි කළ ලියවිල්ල අනුව උපත ලියාපදිංචි කරන ලද ආයතනගත ළමුන්

| ආයතන වර්ගය | එකතුව | | උපත ලියාපදිංචි නොකළ/නොදනී/ සඳහන් නොකළ | | උපත ලියාපදිංචි කළ ලියවිල්ල | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | උප්පැන්න සහතිකය | | අනුමාන වයස් සහතිකය | | සඳහන් නොකළ | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| රැඳවුම් නිවාසය | 31 | 100 | 17 | 54.8 | 13 | 41.9 | - | - | 1 | 3.2 |
| සහතික කළ පාසල | 115 | 100 | 11 | 9.6 | 100 | 87.0 | 4 | 3.5 | - | - |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 79 | 100 | 23 | 29.1 | 54 | 68.4 | 2 | 2.5 | - | - |
| නිවර්තන ළමා නිවාසය | 93 | 100 | 8 | 8.6 | 65 | 69.9 | 20 | 21.5 | - | - |
| ස්වේච්ඡා ළමා නිවාසය | 583 | 100 | 38 | 6.5 | 502 | 86.1 | 43 | 7.4 | - | - |
| වෙනත් | 20 | 100 | 2 | 10.0 | 13 | 65.0 | 5 | 25.0 | - | - |
| **එකතුව** | **921** | **100** | **99** | **10.7** | **747** | **81.1** | **74** | **8.0** | **1** | **0.1** |

දකුණු පළාත තුළ ආයතනගතව සිටින උපත ලියාපදිංචි කර ඇති ළමුන් 822 දෙනා අතරින් 747 දෙනෙක්ගේ උපත උප්පැන්න සහතිකය මගින් ද, 74 දෙනෙක්ගේ උපත අනුමාන වයස් සහතිකය මගින් ද ලියාපදිංචි කර ඇත. එක් ළමයකුගේ පමණක් උපත ලියාපදිංචි කරන ලද ලියවිල්ල පිළිබඳව සඳහන් කර නොමැත.

## 4.2 ළමුන් ආයතනගත කිරීම පිළිබඳ තොරතුරු

ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ රැකවරණය ලබමින් සිටින ළමුන් සඳහා විකල්ප රැකවරණ ක්‍රම හඳුනාගැනීමේදී ආයතනගතව සිටින ළමයාගේ පවුල් පරිසරය, භාරකරුවන්, සහෝදර/සහෝදරියන් පිළිබඳවත්, ළමයා ආයතනික රැකවරණයට පත්කිරීමට බලපාන ලද හේතු පිළිබඳවත් තොරතුරු ලබා ගැනීම බෙහෙවින් උපකාරී වේ.

වගුව 4.8 වර්තමාන ආයතනයට ඇතුළත් කරන විට ළමයාගේ වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්

| වයස | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| <1 | 43 | 4.7 | 24 | 7.4 | 19 | 3.2 |
| 1 | 10 | 1.1 | 8 | 2.5 | 2 | 0.3 |
| 2-4 | 116 | 12.6 | 48 | 14.8 | 68 | 11.4 |
| 5-9 | 321 | 34.9 | 115 | 35.5 | 206 | 34.5 |
| 10-14 | 330 | 35.8 | 100 | 30.9 | 230 | 38.5 |
| 15-17 | 98 | 10.6 | 26 | 8.0 | 72 | 12.1 |
| 18 හෝ ඊට වැඩි | 2 | 0.2 | 2 | 0.6 | - | - |
| සඳහන් නොකළ | 1 | 0.1 | 1 | 0.3 | - | - |
| **එකතුව** | **921** | **100** | **324** | **100** | **597** | **100** |

සංගණන අවස්ථාව වන විට ළමයා ජීවත්ව සිටි ආයතනයට ඇතුළත් කරන විට ළමයාගේ වයස පිළිබඳව තොරතුරු මෙම සංගණනය මගින් එක්රැස් කරන ලදී. ඒ අනුව දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන්ගෙන් වැඩි පිරිසක් (53%) අවුරුදු 10ට අඩු වයසේදී අදාළ ආයතනවලට ඇතුළත් කර ඇති බව පැහැදිලි වේ. එසේම මෙම ළමුන්ගෙන් 36%ක් පමණ අවුරුදු 10-14 දී අදාළ ආයතනවලට ඇතුළත් කර ඇති බව වාර්තා වී ඇත.

වගුව 4.9 මුල්වරට ආයතනගත කරන විට ළමයාගේ වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්


| වයස | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| <1 | 62 | 6.7 | 33 | 10.2 | 29 | 4.9 |
| 1 | 19 | 2.1 | 11 | 3.4 | 8 | 1.3 |
| 2-4 | 124 | 13.5 | 52 | 16.0 | 72 | 12.1 |
| 5-9 | 285 | 30.9 | 90 | 27.8 | 195 | 32.7 |
| 10-14 | 285 | 30.9 | 81 | 25.0 | 204 | 34.2 |
| 15-17 | 65 | 7.1 | 20 | 6.2 | 45 | 7.5 |
| 18 හෝ ඊට වැඩි | 1 | 0.1 | 1 | 0.3 | - | - |
| සඳහන් නොකළ | 80 | 8.7 | 36 | 11.1 | 44 | 7.4 |
| **එකතුව** | **921** | **100** | **324** | **100** | **597** | **100** |

ළමයා මුල්වරට ආයතනගත කරන විට ළමයාගේ වයස පිළිබඳව අවධානය යොමු කිරීමේදී ළමුන්ගෙන් 53%ක් පමණ අවුරුදු 10ට අඩු වයස් කාණ්ඩය තුළදී ආයතනගත කර ඇත. මුල්වරට ආයතනගත කරන විට වයස කොපමණ ද යන්න වාර්තා නොකරන ලද ළමුන් සංඛ්‍යාව 80ක් ලෙස මෙම සංගණනයේදී වාර්තා විය.

වගුව 4.10 ආයතනගත කරන ලද වර්ෂය අනුව ආයතනගත ළමුන්

| වර්ෂය | ආයතනගත ළමුන් | |
|---|---|---|
| | සංඛ්‍යාව | % |
| 2000 - 2004 | 8 | 0.9 |
| 2005 - 2009 | 83 | 9.0 |
| 2010 - 2014 | 163 | 17.7 |
| 2015 - 2017 | 244 | 26.5 |
| 2018 | 151 | 16.4 |
| 2019 | 192 | 20.8 |
| වර්ෂය සඳහන් නොකළ | 80 | 8.7 |
| **එකතුව** | **921** | **100** |

රූප සටහන 4.4
ආයතනගත කරන ලද වර්ෂය අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාතේ පිහිටි ආයතන වල සිටින ළමුන් කොපමණ කලක සිට ආයතනික ජීවිතයක් ගත කරන්නේ ද යන්න පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ළමයින් 8 දෙනෙකු අවුරුදු 15–19 අතර කාලයක් ආයතනගතව ජීවත්වන බවත්, ළමයින් 83 දෙනෙකු, එනම් මුළු ළමුන්ගෙන් 9%ක් පමණ වර්ෂ10-14 අතර කාලයක් ආයතනගතව ජීවත්වන බවත් වාර්තා වී ඇත. කෙසේ වුව ද අවුරුදු 5ට අඩු කාල පරිච්ඡේදයක් ආයතනගතව දිවි ගෙවන ළමුන්, දකුණු පළාතේ ආයතනගත ළමුන්ගෙන් 64%ක් පමණ වේ.

### වගුව 4.11 ආයතනගත වන අවස්ථාව වන විට ළමයා පදිංචිව සිටි ස්ථානය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්

| පදිංචිව සිටි ස්ථානය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| මව/ පියා/ භාරකරුට අයත් නිවස/ උරුම වූ නිවස | 605 | 65.7 | 200 | 61.7 | 405 | 67.8 |
| මව/ පියා/ භාරකරුට අයත් නොවූ නිවස | 121 | 13.1 | 35 | 10.8 | 86 | 14.4 |
| පදික වේදිකාව | 44 | 4.8 | 18 | 5.6 | 26 | 4.4 |
| රෝහල | 17 | 1.8 | 9 | 2.8 | 8 | 1.3 |
| ආගමික ස්ථානය | 10 | 1.1 | 8 | 2.5 | 2 | 0.3 |
| වෙනත් ළමා නිවාසයක්/ වෙනත් රැකවරණ මධ්‍යස්ථානයක් | 41 | 4.5 | 15 | 4.6 | 26 | 4.4 |
| වෙනත් | 9 | 1.0 | 5 | 1.5 | 4 | 0.7 |
| නොදනී | 74 | 8.0 | 34 | 10.5 | 40 | 6.7 |
| **එකතුව** | **921** | **100** | **324** | **100** | **597** | **100** |


ආයතනගත කරන අවස්ථාව වන විට ළමයාගේ පසුබිම් තොරතුරු වශයෙන් ළමයා පදිංචි ව සිටි ස්ථානය පිළිබඳව අවධානය යොමු කර බැලීමේ දී පෙනී යන්නේ දකුණු පළාත තුළ ආයතනගත ළමුන්ගෙන් අඩකට වැඩි පිරිසක් (605) ආයතනගත වීමට ප්‍රථම මව/ පියා/ භාරකරුට අයත් නිවස හෝ ඔවුන්ගෙන් උරුම වූ නිවසක පදිංචි ව සිට ඇති බවත්, 121 දෙනෙක් මව/ පියා/ භාරකරුට අයත් නොවූ නමුත් යම් ආකාරයකින් හෝ පදිංචිය තහවුරු කළ හැකි ස්ථානයක පදිංචිව සිට ඇති බවත් ය. පදික වේදිකා, රෝහල, ආගමික ස්ථාන හෝ වෙනත් ස්ථානයක සිට ආයතනගත වී ඇති පිරිස 121 දෙනෙක් පමණ වේ.

### වගුව 4.12 ආයතනගත වන අවස්ථාව වන විට ළමයා ජීවත්ව සිටියේ කා සමග ද යන්න හා ළමයාගේ ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්

| ළමයා ජීවත්ව සිටියේ | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| මව/ පියා/ දෙමව්පියන් සමග | 636 | 69.1 | 219 | 67.6 | 417 | 69.8 |
| ඥාති වන භාරකරුවකු/ රැකබලාගන්නෙකු සමග | 139 | 15.1 | 46 | 14.2 | 93 | 15.6 |
| ඥාති නොවන භාරකරුවකු/ රැකබලාගන්නෙකු සමග | 46 | 5.0 | 7 | 2.2 | 39 | 6.5 |
| ඥාතීන් නොවන වෙනත් පාර්ශ්වයක් සමග | 37 | 4.0 | 23 | 7.1 | 14 | 2.3 |
| නොදනී | 63 | 6.8 | 29 | 9.0 | 34 | 5.7 |
| **එකතුව** | **921** | **100** | **324** | **100** | **597** | **100** |

දකුණු පළාත තුළ ආයතනගත ළමුන් අතරින් 636 දෙනෙක් ආයතනගත කරන අවස්ථාව වන විට තම මව්පියන් දෙනොම හෝ එක් අයකු සමග ජීවත්ව සිට ඇති බවත්, 185 දෙනෙක් ඥාති වන හෝ ඥාති නොවන භාරකරුවකු යටතේ ජීවත්ව ඇති බවත් වාර්තා වී ඇත. මෙම ළමුන්ගෙන් 37 දෙනෙක් පමණ ආයතනගත කරන විට ජීවත්ව සිට ඇත්තේ රෝහල් කාර්ය මණ්ඩලය, පූජා/ පූජක පක්ෂය, ආරක්ෂක නිලධාරීන් වැනි පාර්ශ්වයක් සමග වීමත්, තවත් 63කගේ පමණ භාරකාරීත්වය පිළිබඳ තොරතුරු නොලැබීයාමත් අවධානය යොමු කළ යුතු කරුණු වේ.


රූප සටහන 4.5
ආයතනගත වන අවස්ථාව වන විට ළමයා ජීවත්ව සිටි කා සමග ද යන්න අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ ආයතනගත කර සිටින ළමුන් ආයතනගත කළ ක්‍රමවේදය පිළිබඳව අවධානය යොමු කිරීමේදී මුළු ළමුන්ගෙන් 2/3කට ආසන්න පිරිසක් (592 දෙනෙක්) අධිකරණමය ක්‍රියාමාර්ගයක් හරහා ආයතනගත කිරීම සිදුකර ඇති බව පෙන්වා දිය හැකි ය. පරිවාස විෂය සම්බන්ධව ඇති නීති රීති අණපනත් තුළ ළමයෙක් දිගුකාලීනව ආයතනගත කිරීම සෘජුව භාරකරුවන් මගින් සිදු කිරීමට හැකි වුව ද කෙටි කාල සීමාවක් තුළ පරිවාස කොමසාරිස්ගේ අනුමැතිය ඒ සඳහා ලබා ගත යුතුය. කෙසේ නමුත් දකුණු පළාත තුළ ළමුන් 9 දෙනෙක් සෘජුව භාරකරුවන් මගින් ආයතනගත කර තිබීමත් විමසා බැලිය යුතු තත්ත්වයක් ලෙස පෙනී යයි.

රූප සටහන 4.6
ආයතනගත වූ ආකාරය අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

වගුව 4.13 ආයතනගත වූ ආකාරය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්


| ආයතනගත වූ ආකාරය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| අධිකරණය මගින් | 592 | 64.3 | 211 | 65.1 | 381 | 63.8 |
| පළාත් පරිවාස කොමසාරිස් අනුමැතිය මත | 318 | 34.5 | 110 | 34.0 | 208 | 34.8 |
| සෘජුව භාරකරුවන් මගින් | 9 | 1.0 | 2 | 0.6 | 7 | 1.2 |
| වෙනත් පාර්ශ්වයක් (භාරකරු නොවන) | 1 | 0.1 | 1 | 0.3 | - | - |
| නොදනී | 1 | 0.1 | - | - | 1 | 0.2 |
| **එකතුව** | **921** | **100** | **324** | **100** | **597** | **100** |

වගුව 4.14 දිස්ත්‍රික්කය, ආයතනගතවීමට හේතුව හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්

| ආයතනගත වීමට හේතුව | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **දකුණු පළාත** | **921** | **100** | **324** | **100** | **597** | **100** |
| අනාථ ළමයකු වීම | 5 | 0.5 | 2 | 0.6 | 3 | 0.5 |
| අත්හල ළමයකු වීම | 104 | 11.3 | 45 | 13.9 | 59 | 9.9 |
| අසරණ ළමයකු වීම | 524 | 56.9 | 180 | 55.6 | 344 | 57.6 |
| ළමා වින්දිතයෙකු වීම | 204 | 22.1 | 24 | 7.4 | 180 | 30.2 |
| ළමා සැකකරුවකු වීම | 18 | 2.0 | 16 | 4.9 | 2 | 0.3 |
| ළමා වරදකරුවකු වීම | 45 | 4.9 | 44 | 13.6 | 1 | 0.2 |
| වෙනත් | 21 | 2.3 | 13 | 4.0 | 8 | 1.3 |

| ආයතනගත වීමට හේතුව | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **ගාල්ල** | **725** | **100** | **270** | **100** | **455** | **100** |
| අනාථ ළමයකු වීම | 2 | 0.3 | 2 | 0.7 | - | - |
| අත්හල ළමයකු වීම | 84 | 11.6 | 38 | 14.1 | 46 | 10.1 |
| අසරණ ළමයකු වීම | 408 | 56.3 | 151 | 55.9 | 257 | 56.5 |
| ළමා වින්දිතයෙකු වීම | 166 | 22.9 | 20 | 7.4 | 146 | 32.1 |
| ළමා සැකකරුවකු වීම | 17 | 2.3 | 15 | 5.6 | 2 | 0.4 |
| ළමා වරදකරුවකු වීම | 45 | 6.2 | 44 | 16.3 | 1 | 0.2 |
| වෙනත් | 3 | 0.4 | - | - | 3 | 0.7 |
| **මාතර** | **97** | **100** | **15** | **100** | **82** | **100** |
| අනාථ ළමයකු වීම | 2 | 2.1 | - | - | 2 | 2.4 |
| අත්හල ළමයකු වීම | 12 | 12.4 | 4 | 26.7 | 8 | 9.8 |
| අසරණ ළමයකු වීම | 62 | 63.9 | 10 | 66.7 | 52 | 63.4 |
| ළමා වින්දිතයෙකු වීම | 19 | 19.6 | - | - | 19 | 23.2 |
| ළමා සැකකරුවකු වීම | 1 | 1.0 | 1 | 6.7 | - | - |
| වෙනත් | 1 | 1.0 | - | - | 1 | 1.2 |
| **හම්බන්තොට** | **99** | **100** | **39** | **100** | **60** | **100** |
| අනාථ ළමයකු වීම | 1 | 1.0 | 4 | 1.0 | 1 | 1.7 |
| අත්හල ළමයකු වීම | 8 | 8.1 | 3 | 7.7 | 5 | 8.3 |
| අසරණ ළමයකු වීම | 54 | 54.5 | 19 | 48.7 | 35 | 58.3 |
| ළමා වින්දිතයෙකු වීම | 19 | 19.2 | 4 | 10.3 | 15 | 25.0 |
| වෙනත් | 17 | 17.2 | 13 | 33.3 | 4 | 6.7 |

රූප සටහන 4.7
ආයතනගත වීමට හේතුව අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

ආයතනගත වීම සඳහා බලපාන ලද ප්‍රධාන හේතුව පිළිබඳව අවධානය යොමු කිරීමේදී දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ආයතනගත වී ඇත්තේ කිසියම් ආකාරයකින් අසරණභාවයට පත්වීම හේතුවෙන් බව සංගණන දත්ත වලින් අනාවරණය වී ඇත. එය මුළු ළමුන් සංඛ්‍යාවෙන් 57%ක් (524) වන අතර ගැහැණු ළමුන් සඳහා 57.6% ද, පිරිමි ළමුන් සඳහා 55.6% ද ලෙස වාර්තා වී ඇත. මීළඟට වැඩිම සංඛ්‍යාවක් ආයතනගත කර ඇත්තේ වින්දිතභාවයට පත්වීම හේතුවෙනි. එම සංඛ්‍යාව මුළු ළමුන්ගෙන් 22% (204) වන අතර මෙ අතරින් 88% (180) පමණ ගැහැණු ළමුන් වේ. එසේම මෙම දත්ත දෙස බැලීමේදී ආයතනගත කර ඇති ගැහැණු ළමයින් අතරින් 1/3කට ආසන්න සංඛ්‍යාවක් කිසියම් ආකාරයකින් වින්දිතභාවයට පත්ව තිබීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. ළමයා වරදකරුවකු වීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනගත කර ඇත්තේ ළමුන් 45 දෙනෙක් පමණක් වන අතර මෙ අතරින් 44 දෙනෙක්ම පිරිමි ළමයින් වීම විශේෂත්වයකි.

## වගුව 4.15 දිස්ත්‍රික්කය, ආයතනගත වීමට හේතුව හා වයස් කාණ්ඩය අනුව ආයතනගත ළමුන්

| ආයතනගත වීමට හේතුව | එකතුව | | 0-4 | | 5-9 | | 10-14 | | 15-17 | | 18 හෝ ඊට වැඩි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **දකුණු පළාත** | **921** | **100** | **68** | **100** | **158** | **100** | **345** | **100** | **308** | **100** | **42** | **100** |
| අනාථ ළමයකු වීම | 5 | 0.5 | - | - | - | - | 2 | 0.6 | 1 | 0.3 | 2 | 4.8 |
| අත්හල ළමයකු වීම | 104 | 11.3 | 26 | 38.2 | 29 | 18.4 | 29 | 8.4 | 16 | 5.2 | 4 | 9.5 |
| අසරණ ළමයකු වීම | 524 | 56.9 | 40 | 58.8 | 110 | 69.6 | 221 | 64.1 | 127 | 41.2 | 26 | 61.9 |
| ළමා වින්දිතයෙකු වීම | 204 | 22.1 | 2 | 2.9 | 10 | 6.3 | 64 | 18.6 | 120 | 39.0 | 8 | 19.0 |
| ළමා සැකකරුවකු වීම | 18 | 2.0 | - | - | 1 | 0.6 | 8 | 2.3 | 8 | 2.6 | 1 | 2.4 |
| ළමා වරදකරුවකු වීම | 45 | 4.9 | - | - | - | - | 11 | 3.2 | 34 | 11.0 | - | - |
| වෙනත් | 21 | 2.3 | - | - | 8 | 5.1 | 10 | 2.9 | 2 | 0.6 | 1 | 2.4 |
| **ගාල්ල** | **725** | **100** | **67** | **100** | **111** | **100** | **255** | **100** | **259** | **100** | **33** | **100** |
| අනාථ ළමයකු වීම | 2 | 0.3 | - | - | - | - | - | - | - | - | 2 | 6.1 |
| අත්හල ළමයකු වීම | 84 | 11.6 | 26 | 38.8 | 18 | 16.2 | 26 | 10.2 | 12 | 4.6 | 2 | 6.1 |
| අසරණ ළමයකු වීම | 408 | 56.3 | 39 | 58.2 | 86 | 77.5 | 166 | 65.1 | 96 | 37.1 | 21 | 63.6 |
| ළමා වින්දිතයෙකු වීම | 166 | 22.9 | 2 | 3.0 | 6 | 5.4 | 43 | 16.9 | 108 | 41.7 | 7 | 21.2 |
| ළමා සැකකරුවකු වීම | 17 | 2.3 | - | - | 1 | 0.9 | 7 | 2.7 | 8 | 3.1 | 1 | 3.0 |
| ළමා වරදකරුවකු වීම | 45 | 6.2 | - | - | - | - | 11 | 4.3 | 34 | 13.1 | - | - |
| වෙනත් | 3 | 0.4 | - | - | - | - | 2 | 0.8 | 1 | 0.4 | - | - |
| **මාතර** | **97** | **100** | **-** | **-** | **21** | **100** | **40** | **100** | **30** | **100** | **6** | **100** |
| අනාථ ළමයකු වීම | 2 | 2.1 | - | - | - | - | 1 | 2.5 | 1 | 3.3 | - | - |
| අත්හල ළමයකු වීම | 12 | 12.4 | - | - | 8 | 38.1 | 1 | 2.5 | 2 | 6.7 | 1 | 16.7 |
| අසරණ ළමයකු වීම | 62 | 63.9 | - | - | 12 | 57.1 | 26 | 65.0 | 20 | 66.7 | 4 | 66.7 |
| ළමා වින්දිතයෙකු වීම | 19 | 19.6 | - | - | 1 | 4.8 | 10 | 25.0 | 7 | 23.3 | 1 | 16.7 |
| ළමා සැකකරුවකු වීම | 1 | 1.0 | - | - | - | - | 1 | 2.5 | - | - | - | - |
| වෙනත් | 1 | 1.0 | - | - | - | - | 1 | 2.5 | - | - | - | - |
| **හම්බන්තොට** | **99** | **100** | **1** | **100** | **26** | **100** | **50** | **100** | **19** | **100** | **3** | **100** |
| අනාථ ළමයකු වීම | 1 | 1.0 | - | - | - | - | 1 | 2.0 | - | - | - | - |
| අත්හල ළමයකු වීම | 8 | 8.1 | - | - | 3 | 11.5 | 2 | 4.0 | 2 | 10.5 | 1 | 33.3 |
| අසරණ ළමයකු වීම | 54 | 54.5 | 1 | 1.0 | 12 | 46.2 | 29 | 58.0 | 11 | 57.9 | 1 | 33.3 |
| ළමා වින්දිතයෙකු වීම | 19 | 19.2 | - | - | 3 | 11.5 | 11 | 22.0 | 5 | 26.3 | - | - |
| වෙනත් | 17 | 17.2 | - | - | 8 | 30.8 | 7 | 14.0 | 1 | 5.3 | 1 | 33.3 |

***අසරණ ළමුන්***

දෙමව්පියන් දෙදෙනාම ජීවත්වන්නේ නම් ඔවුන් දෙදෙනාටම හෝ එක් පාර්ශ්වයක් පමණක් ජීවත්වන්නේ නම් එම ජීවත්වන තැනැත්තාට ආර්ථික, සෞඛ්‍ය හෝ වෙනයම් හේතුවක් මත ළමයා රැකබලාගැනීමට නොහැකි නම් එවැනි ළමුන් අසරණ ළමුන් ලෙස හඳුනාගත හැකි ය. ළමයකු මෙසේ අසරණභාවයට පත්ව ඇති අවස්ථාවක එම ළමයාට රැකවරණය සැලසීමට සුදුසු පුද්ගලයකු හඳුනාගැනීමට නොහැකි නම් එවැනි ළමයින් සඳහා ආයතනගත රැකවරණය ලබා දීමට පියවර ගනු ලැබේ. ආයතනගතව සිටින ඕනෑම ළමයෙක් කිසියම් අවස්ථාවක මොන යම් හෝ හේතුවක් මත අසරණභාවයට පත් වී ඇත්නම් එවැනි ළමයින්ගේ අසරණභාවයට හේතු මෙම සංගණනය මගින් රැස්කරගන්නා ලදී.

සංගණනය මගින් රැස් කරගන්නා ලද තොරතුරු අනුව දකුණු පළාත තුළ අසරණභාවය ප්‍රධාන හේතුව ලෙස සලකා ආයතනගත කරන ලද ළමුන් සංඛ්‍යාව 524 ලෙස වාර්තා වුව ද, ළමුන් 622 දෙනෙක් කිසියම් හේතුවක් මත කවදා හෝ අසරණභාවයට පත් වූ ළමුන් ලෙස හඳුනාගෙන ඇත. එම සංඛ්‍යාව පිරිමි ළමුන් 33% ද, ගැහැණු ළමුන් 67% ද ලෙස ව්‍යාප්තව ඇත.

මෙම ළමුන්ගේ අසරණභාවයට පත්වීමට බලපාන ලද හේතු විමසා බැලීමේ දී වැඩිම ළමුන් සංඛ්‍යාවක් අසරණභාවයට පත්වීමට හේතු වී ඇත්තේ “මව හෝ පියා විසින් අතහැර දමා තිබීම හා අනෙක් තැනැත්තාට දෙමව්පියෙකු ලෙස කටයුතු කිරීමට නොහැකිවීම” වන අතර එය අසරණභාවයට පත් වූ ළමයින්ගෙන් 1/3කට වැඩි පිරිසකට බලපා ඇත. එසේම “දෙමව්පියන් වෙන්ව ජීවත්වීම සහ ළමයාගේ භාරකාරීත්වය දරන්නාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම” සහ “මව හෝ පියා මියයාම හා ජීවත්වන තැනැත්තාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම/ ළමයා රැකබලා ගැනීමට නොහැකිවීම” ද ළමුන්ගේ අසරණභාවය සඳහා වැඩි බලපෑමක් එල්ල කර ඇති හේතු ලෙස හඳුනාගෙන ඇත.

වගුව 4.16 කවදා හෝ අසරණභාවයට පත් ආයතනගත ළමුන් දිස්ත්‍රික්කය, අසරණභාවයට හේතුව/ හේතු හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව

| හේතුව | දකුණු පළාත | | | | | | ගාල්ල දිස්ත්‍රික්කය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| දෙමව්පියන් මහජන සහනාධාර මත යැපීම/ දෙමව්පියන්ට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම/ දෙමාපියන් දෙදෙනාටම දෙමාපියන් ලෙස කටයුතු කළ නොහැකිවීම | 63 | 10.0 | 21 | 10.0 | 42 | 10.0 | 56 | 12.0 | 19 | 11.0 | 37 | 12.0 |
| මව හෝ පියා මියයාම. ජීවත්වන තැනැත්තාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම/ ළමයා රැකබලා ගැනීමට නොහැකිවීම | 91 | 15.0 | 24 | 12.0 | 67 | 16.0 | 68 | 14.0 | 18 | 11.0 | 50 | 16.0 |
| මව හෝ පියා වෛද්‍ය නිගමනය අනුව ආදායම් ඉපයීමක් කළ නොහැකි තත්ත්වයක පසුවීම හා අනෙක් තැනැත්තාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිවීම/ දෙමාපියන් දෙදෙනා ම ආබාධිත වීම | 15 | 2.4 | 6 | 2.9 | 9 | 2.2 | 12 | 2.5 | 4 | 2.4 | 8 | 2.5 |
| මව හෝ පියා බන්ධනාගාරගතව සිටීම සහ අනෙක් තැනැත්තාට දෙමාපියකු ලෙස කටයුතු කළ නොහැකි වීම/ දෙදෙනාම බන්ධනාගාරගත වීම | 46 | 7.4 | 21 | 10.0 | 25 | 6.0 | 33 | 6.8 | 15 | 9.0 | 18 | 5.7 |
| දෙමව්පියන් වෙන්ව ජීවත්වීම. ළමයාගේ භාරකාරත්වය දරන්නාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිවීම | 145 | 23.0 | 47 | 23.0 | 98 | 24.0 | 108 | 22.0 | 42 | 25.0 | 66 | 21.0 |
| මව හෝ පියා විසින් අත්හැර දමා තිබීම හා අනෙක් තැනැත්තාට දෙමව්පියෙකු ලෙස කටයුතු කිරීමට නොහැකිවීම | 218 | 35.0 | 84 | 41.0 | 134 | 32.0 | 177 | 37.0 | 70 | 42.0 | 107 | 34.0 |
| මව හෝ පියා මියගිය අනෙක් තැනැත්තා විසින් අත්හැර දමා තිබීම | 23 | 3.7 | 8 | 3.9 | 15 | 3.6 | 20 | 4.1 | 5 | 3.0 | 15 | 4.7 |
| පවුල තුළ ළමයා අනාරක්ෂිත වීම | 42 | 6.8 | 14 | 6.8 | 28 | 6.7 | 37 | 7.6 | 13 | 7.8 | 24 | 7.6 |
| වෙනත් | 42 | 6.8 | 9 | 4.3 | 33 | 8.0 | 33 | 6.8 | 7 | 4.2 | 26 | 8.2 |
| කවදා හෝ අසරණභාවයට පත් වූ මුළු ළමයින් සංඛ්‍යාව | 622 | - | 207 | - | 415 | - | 484 | - | 167 | - | 317 | - |

| හේතුව | මාතර දිස්ත්‍රික්කය | | | | | | හම්බන්තොට දිස්ත්‍රික්කය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| දෙමව්පියන් මහජන සහනාධාර මත යැපීම/ දෙමව්පියන්ට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම/ දෙමාපියන් දෙදෙනාටම දෙමාපියන් ලෙස කටයුතු කළ නොහැකිවීම | 2 | 2.9 | - | - | 2 | 3.4 | 5 | 7.2 | 2 | 6.9 | 3 | 7.5 |
| මව හෝ පියා මියයාම. ජීවත්වන තැනැත්තාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම/ ළමයා රැකබලා ගැනීමට නොහැකිවීම | 13 | 19.0 | 3 | 27.0 | 10 | 17.0 | 10 | 15.0 | 3 | 10.0 | 7 | 18.0 |
| මව හෝ පියා වෛද්‍ය නිගමනය අනුව ආදායම් ඉපයීමක් කළ නොහැකි තත්ත්වයක පසුවීම හා අනෙක් තැනැත්තාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිවීම/ දෙමාපියන් දෙදෙනා ම ආබාධිත වීම | 1 | 1.4 | - | - | 1 | 1.7 | 2 | 2.9 | 2 | 6.9 | - | - |
| මව හෝ පියා බන්ධනාගාරගතව සිටීම සහ අනෙක් තැනැත්තාට දෙමාපියකු ලෙස කටයුතු කළ නොහැකි වීම/ දෙදෙනාම බන්ධනාගාරගත වීම | 7 | 10.0 | 1 | 9.1 | 6 | 10.0 | 6 | 8.7 | 5 | 17.0 | 1 | 2.5 |
| දෙමව්පියන් වෙන්ව ජීවත්වීම. ළමයාගේ භාරකාරත්වය දරන්නාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිවීම | 20 | 29.0 | - | - | 20 | 35.0 | 17 | 25.0 | 5 | 17.0 | 12 | 30.0 |
| මව හෝ පියා විසින් අත්හැර දමා තිබීම හා අනෙක් තැනැත්තාට දෙමව්පියෙකු ලෙස කටයුතු කිරීමට නොහැකිවීම | 19 | 28.0 | 5 | 46.0 | 14 | 24.0 | 22 | 32.0 | 9 | 31.0 | 13 | 33.0 |
| මව හෝ පියා මියගිය අනෙක් තැනැත්තා විසින් අත්හැර දමා තිබීම | - | - | - | - | - | - | 3 | 4.3 | 3 | 10.0 | - | - |
| පවුල තුළ ළමයා අනාරක්ෂිත වීම | 4 | 5.8 | 1 | 9.1 | 3 | 5.2 | 1 | 1.4 | - | - | 1 | 2.5 |
| වෙනත් | 5 | 7.2 | 1 | 9.1 | 4 | 6.9 | 4 | 5.8 | 1 | 3.4 | 3 | 7.5 |
| කවදා හෝ අසරණභාවයට පත් වූ මුළු ළමයින් සංඛ්‍යාව | 69 | - | 11 | - | 58 | - | 69 | - | 29 | - | 40 | - |

සටහන: අසරණභාවයට පත් ඇතැම් ළමයින්ට ඒ සඳහා එක් හේතුවකට වඩා බලපා ඇති බැවින් එකතුව සමාන නොවේ.

වගුව 4.17 කවදා හෝ අසරණභාවයට පත් ආයතනගත ළමුන් අසරණභාවයට හේතුව/ හේතු හා වයස් කාණ්ඩය අනුව

| හේතුව | එකතුව | | 0-4 | | 5-9 | | 10-14 | | 15-17 | | 18 හෝ ඊට වැඩි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| දෙමව්පියන් මහජන සහනාධාර මත යැපීම/ දෙමව්පියන්ට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම/ දෙමාපියන් දෙදෙනාටම දෙමාපියන් ලෙස කටයුතු කළ නොහැකිවීම | 63 | 10.1 | 4 | 9.8 | 13 | 10.4 | 26 | 9.8 | 13 | 8.0 | 7 | 10.9 |
| මව හෝ පියා මියයාම. ජීවත්වන තැනැත්තාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම/ ළමයා රැකබලා ගැනීමට නොහැකිවීම | 91 | 14.6 | 4 | 9.8 | 12 | 9.6 | 38 | 14.4 | 30 | 18.5 | 7 | 35.8 |
| මව හෝ පියා වෛද්‍ය නිගමනය අනුව ආදායම් ඉපයීමක් කළ නොහැකි තත්ත්වයක පසුවීම හා අනෙක් තැනැත්තාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිවීම/ දෙමාපියන් දෙදෙනා ම ආබාධිත වීම | 15 | 2.4 | - | - | 5 | 4.0 | 5 | 1.9 | 4 | 2.5 | 1 | 2.4 |
| මව හෝ පියා බන්ධනාගාරගතව සිටීම සහ අනෙක් තැනැත්තාට දෙමාපියකු ලෙස කටයුතු කළ නොහැකි වීම/ දෙදෙනාම බන්ධනාගාරගත වීම | 46 | 7.4 | 5 | 12.2 | 12 | 9.6 | 15 | 5.7 | 11 | 6.8 | 3 | 3.6 |
| දෙමව්පියන් වෙන්ව ජීවත්වීම. ළමයාගේ භාරකාරත්වය දරන්නාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිවීම | 145 | 23.3 | 2 | 4.9 | 37 | 29.6 | 66 | 25.0 | 34 | 21.0 | 6 | 18.8 |
| මව හෝ පියා විසින් අත්හැර දමා තිබීම හා අනෙක් තැනැත්තාට දෙමව්පියෙකු ලෙස කටයුතු කිරීමට නොහැකිවීම | 218 | 35.0 | 15 | 36.6 | 47 | 37.6 | 98 | 37.1 | 49 | 30.2 | 9 | 23.6 |
| මව හෝ පියා මියගිය අනෙක් තැනැත්තා විසින් අත්හැර දමා තිබීම | 23 | 3.7 | 2 | 4.9 | 1 | 0.8 | 11 | 4.2 | 8 | 4.9 | 1 | 4.8 |
| පවුල තුළ ළමයා අනාරක්ෂිත වීම | 42 | 6.8 | 2 | 4.9 | 11 | 8.8 | 18 | 6.8 | 8 | 4.9 | 3 | 3.0 |
| වෙනත් | 42 | 6.8 | 7 | 17.1 | 8 | 6.4 | 12 | 4.5 | 13 | 8.0 | 2 | 3.6 |
| **කවදා හෝ අසරණභාවයට පත් වූ මුළු ළමයින් සංඛ්‍යාව** | **622** | **-** | **41** | **-** | **125** | **-** | **264** | **-** | **162** | **-** | **30** | **-** |

සටහන: අසරණභාවයට පත් ඇතැම් ළමයින්ට ඒ සඳහා එක් හේතුවකට වඩා බලපා ඇති බැවින් එකතුව සමාන නොවේ

***ළමා වින්දිතයන්***

වින්දිත ළමයෙක් යනුවෙන් අදහස් කරනුයේ යම් ආකාරයක ශාරීරික, මානසික හෝ ලිංගික අපයෝජනයක් හෝ අපහරණයක් හෝ බාහිර හේතුවක් හෝ සිදුවීමක් මත පීඩාවට ලක් වූ ළමයෙක් වේ.

වින්දිතභාවය හේතුවෙන් ආයතනගත කරන ලද ළමුන් පිළිබඳව මෙන් ම ආයතනගතව සිටින සියලු ම ළමුන් කිසියම් අවස්ථාවක මොන යම් හෝ හේතුවක් මත වින්දිතභාවයට පත් වී ඇත් ද යන්න පිළිබඳ ව ද සංගණනය මගින් තොරතුරු රැස්කරගන්නා ලදී.

වගුව **4.18** කවදා හෝ වින්දිතභාවයට පත් ආයතනගත ළමුන් දිස්ත්‍රික්කය, වින්දිතභාවයට හේතුව/ හේතු හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව

| හේතුව | දකුණු පළාත | | | | | | ගාල්ල දිස්ත්‍රික්කය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ශාරීරික/ මානසික/ ලිංගික අපයෝජනයට ලක්වීම | 180 | 53.0 | 12 | 15.0 | 168 | 65.0 | 147 | 56.0 | 10 | 16.0 | 137 | 69.0 |
| කෲරත්වයට භාජනය වීම | 28 | 8.3 | 9 | 11.0 | 19 | 7.3 | 28 | 11.0 | 9 | 14.0 | 19 | 9.6 |
| බලහත්කාරයෙන් ළමා ශ්‍රමිකයෙක් ලෙස සේවයේ යොදවා ගැනීම | 4 | 1.2 | - | - | 4 | 1.5 | 3 | 1.1 | - | - | 3 | 1.5 |
| කුට්ටනය/ ළමා ගණිකා සේවයේ යෙදවීම | 1 | 0.3 | - | - | 1 | 0.4 | 1 | 0.4 | - | - | 1 | 0.5 |
| වීදියක ජීවත් වීම/ සිහමන් යැදීම | 15 | 4.4 | 6 | 7.6 | 9 | 3.5 | 9 | 3.4 | 4 | 6.3 | 5 | 2.5 |
| ස්වාභාවික හේතූන් නිසා විපතට පත්වීම | 2 | 0.6 | 2 | 2.5 | - | - | 2 | 0.8 | 2 | 3.2 | - | - |
| පැහැර ගැනීමට/ අපහරණයට ලක්වීම | 44 | 13.0 | - | - | 44 | 17.0 | 44 | 17.0 | - | - | 44 | 22.0 |
| දෙමව්පියන් මියයාම/ ඔත්පල වීම මත ළමා වින්දිතයෙකු ලෙස අධිකරණයට ඉදිරිපත් කොට රඳවා තබා ගැනීම | 4 | 1.2 | - | - | 4 | 1.5 | 1 | 0.4 | - | - | 1 | 0.5 |
| අතරමං වීම | 37 | 11.0 | 19 | 24.0 | 18 | 6.9 | 30 | 12.0 | 19 | 30.0 | 11 | 5.6 |
| නොසලකා හැරීමට ලක්වීම | 129 | 38.0 | 59 | 75.0 | 70 | 27.0 | 88 | 34.0 | 44 | 70.0 | 44 | 22.0 |
| දෙමව්පියන් විසින් අතරමංකර යෑම නිසා අධිකරණයට ඉදිරිපත් කොට රඳවා තබා ගැනීම | 27 | 8.0 | 10 | 13.0 | 17 | 6.5 | 19 | 7.3 | 8 | 13.0 | 11 | 5.6 |
| කවදා හෝ වින්දිතභාවයට පත් වූ මුළු ළමයින් සංඛ්‍යාව | 339 | - | 79 | - | 260 | - | 261 | - | 63 | - | 198 | - |

| හේතුව | මාතර දිස්ත්‍රික්කය | | | | | | හම්බන්තොට දිස්ත්‍රික්කය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ශාරීරික/ මානසික/ ලිංගික අපයෝජනයට ලක්වීම | 18 | 35.0 | - | - | 18 | 40.0 | 15 | 58.0 | 2 | 22.0 | 13 | 77.0 |
| කෲරත්වයට භාජනය වීම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| බලහත්කාරයෙන් ළමා ශ්‍රමිකයෙක් ලෙස සේවයේ යොදවා ගැනීම | 1 | 1.9 | - | - | 1 | 2.2 | - | - | - | - | - | - |
| කුට්ටනය/ ළමා ගණිකා සේවයේ යෙදවීම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වීදියක ජීවත් වීම/ සිහමන් යැදීම | 2 | 3.8 | - | - | 2 | 4.4 | 4 | 15.0 | 2 | 22.0 | 2 | 12.0 |
| ස්වාභාවික හේතූන් නිසා විපතට පත්වීම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| පැහැර ගැනීමට/ අපහරණයට ලක්වීම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| දෙමව්පියන් මියයාම/ ඔත්පල වීම මත ළමා වින්දිතයෙකු ලෙස අධිකරණයට ඉදිරිපත් කොට රඳවා තබා ගැනීම | 3 | 5.8 | - | - | 3 | 6.7 | - | - | - | - | - | - |
| අතරමං වීම | 7 | 14.0 | - | - | 7 | 16.0 | - | - | - | - | - | - |
| නොසලකා හැරීමට ලක්වීම | 31 | 60.0 | 7 | 100.0 | 24 | 53.0 | 10 | 39.0 | 8 | 89.0 | 2 | 12.0 |
| දෙමව්පියන් විසින් අතරමංකර යෑම නිසා අධිකරණයට ඉදිරිපත් කොට රඳවා තබා ගැනීම | 7 | 14.0 | 2 | 29.0 | 5 | 11.0 | 1 | 3.8 | - | - | 1 | 5.9 |
| කවදා හෝ වින්දිතභාවයට පත් වූ මුළු ළමයින් සංඛ්‍යාව | 52 | - | 7 | - | 45 | - | 26 | - | 9 | - | 17 | - |

සටහන: වින්දිතභාවයට පත් ඇතැම් ළමයින්ට ඒ සඳහා එක් හේතුවකට වඩා බලපා ඇති බැවින් එකතුව සමාන නොවේ

දකුණු පළාත තුළ වින්දිතභාවය ප්‍රධාන හේතුව ලෙස සලකා ආයතනගත කරන ලද ළමුන් සංඛ්‍යාව 204 ලෙස වාර්තා වුව ද ළමුන් 339 දෙනෙක් කිසියම් හේතුවක් මත කවදා හෝ වින්දිතභාවයට පත් වූ ළමුන් ලෙස හඳුනාගෙන ඇත. කවදා හෝ වින්දිතභාවයට පත් වූ ළමුන්ගෙන් 77% ගැහැණු ළමයින් වීම සැලකිල්ලට භාජනය විය යුතු කරුණකි.

මෙම ළමුන් වින්දිතභාවයට පත්වීමට බලපාන ලද හේතු විමසා බැලීමේ දී වැඩිම ළමුන් සංඛ්‍යාවක් වින්දිතභාවයට පත්වීමට බලපා ඇත්තේ ශාරීරික/ මානසික/ ලිංගික අපයෝජනයට ලක්වීම ලෙස හඳුනාගෙන ඇති අතර නොසලකා හැරීමට ලක්වීම ද වින්දිතභාවයට පත්වීම සඳහා ඒ හා ආසන්න බලපෑමක් එල්ල කර ඇති බව හඳුනාගෙන ඇත. කවදා හෝ වින්දිතභාවයට පත් වූ ගැහැණු ළමුන් අතරින් 65%ක් පමණ වින්දිතභාවයට පත්වීමට ශාරීරික/ මානසික/ ලිංගික අපයෝජනයට ලක්වීම බලපා ඇති අතර නොසලකා හැරීමට ලක්වීම ද ගැහැණු ළමුන්ගෙන් 1/4කට වඩා බලපා ඇත. පිරිමි ළමුන් පිළිබඳව අවධානය යොමු කිරීමේදී වැඩිම පිරිසකට වින්දිතභාවයට පත්වීමට බලපා ඇත්තේ නොසලකා හැරීමට ලක්වීම යි. එය කවදා හෝ වින්දිතභාවයට පත්වූ පිරිමි ළමයින්ගෙන් 3/4කට ආසන්න පිරිසකට බලපා ඇත.

වගුව 4.19 කවදා හෝ වින්දිතභාවයට පත් ආයතනගත ළමුන් වින්දිතභාවයට හේතුව/ හේතු හා වයස් කාණ්ඩය අනුව

| හේතුව | එකතුව | | 0-4 | | 5-9 | | 10-14 | | 15-17 | | 18 හෝ ඊට වැඩි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ශාරීරික/ මානසික/ ලිංගික අපයෝජනයට ලක්වීම | 180 | 53.1 | 1 | 20.0 | 7 | 20.6 | 55 | 44.4 | 109 | 67.3 | 8 | 57.1 |
| කෲරත්වයට භාජනය වීම | 28 | 8.3 | 3 | 60.0 | 4 | 11.8 | 11 | 8.9 | 9 | 5.6 | 1 | 7.1 |
| බලහත්කාරයෙන් ළමා ශ්‍රමිකයෙක් ලෙස සේවයේ යොදවා ගැනීම | 4 | 1.2 | - | - | 1 | 2.9 | - | - | 3 | 1.9 | - | - |
| කුට්ටනය/ ළමා ගණිකා සේවයේ යෙදවීම | 1 | 0.3 | - | - | - | - | - | - | 1 | 0.6 | - | - |
| වීදියක ජීවත් වීම/ සිඟමන් යැදීම | 15 | 4.4 | 1 | 20.0 | 2 | 5.9 | 7 | 5.6 | 4 | 2.5 | 1 | 7.1 |
| ස්වාභාවික හේතූන් නිසා විපතට පත්වීම | 2 | 0.6 | - | - | - | - | - | - | 1 | 0.6 | 1 | 7.1 |
| පැහැර ගැනීමට/ අපහරණයට ලක්වීම | 44 | 13.0 | - | - | - | - | 8 | 6.5 | 36 | 22.2 | - | - |
| දෙමව්පියන් මියයාම/ ඔත්පල වීම මත ළමා වින්දිතයෙකු ලෙස අධිකරණයට ඉදිරිපත් කොට රඳවා තබා ගැනීම | 4 | 1.2 | - | - | - | - | 2 | 1.6 | 2 | 1.2 | - | - |
| අතරමං වීම | 37 | 10.9 | - | - | 8 | 23.5 | 16 | 12.9 | 12 | 7.4 | 1 | 7.1 |
| නොසලකා හැරීමට ලක්වීම | 129 | 38.1 | - | - | 20 | 58.8 | 56 | 45.2 | 50 | 30.9 | 3 | 21.4 |
| දෙමව්පියන් විසින් අතරමංකර යෑම නිසා අධිකරණයට ඉදිරිපත් කොට රඳවා තබා ගැනීම | 27 | 8.0 | - | - | 6 | 17.6 | 15 | 12.1 | 5 | 3.1 | 1 | 7.1 |
| **කවදා හෝ වින්දිතභාවයට පත් වූ මුළු ළමයින් සංඛ්‍යාව** | **339** | **-** | **5** | **-** | **34** | **-** | **124** | **-** | **162** | **-** | **14** | **-** |

සටහන: වින්දිතභාවයට පත් ඇතැම් ළමයින්ට ඒ සඳහා එක් හේතුවකට වඩා බලපා ඇති බැවින් එකතුව සමාන නොවේ

***ළමා සැකකරුවන්/ වැරදිකරුවන්***

සැකකරුවෙකු යන්නෙන් යම් වරදක් කර ඇති බවට අනුමාන කරන ළමයෙක් අදහස් වන අතර වරදකරුවෙකු යන්නෙන් අදහස් වන්නේ යම් වරදක් කර ඇති බවට අධිකරණය මගින් තීන්දු කර ඇති ළමයෙක් වේ.

සැකකරුවන් හෝ වරදකරුවන් වන ළමුන් ආයතනගත කිරීමේ අභිප්‍රාය වන්නේ විශෝධනය කිරීම වේ. යම් සමාජ විරෝධී ක්‍රියාවක් හෝ වරදක් සඳහා පෙළඹී ඇති ළමුන් ආයතනගත විශෝධනයක් තුළින් යහපත් ව සමාජගත කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කරදීම මෙමගින් අපේක්ෂා කෙරේ. මෙම සංගණනය මගින් ළමා සැකකරුවන් හෝ වරදකරුවන් ලෙස ආයතනගත කර සිටින ළමුන් විසින් සිදු කරන ලද හෝ සිදු කළායයි සැක කරන වරද කුමක් ද යන්න පිළිබඳව තොරතුරු එක්රැස් කරන ලදී.

**වගුව 4.20 සැකකරුවන්/වරදකරුවන් ලෙස ආයතනගතව සිටින ළමුන් දිස්ත්‍රික්කය, සැකකරුවකු/වරදකරුවකු වීමට හේතුව/ හේතු හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව**

| හේතුව | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **දකුණු පළාත (සැකකරුවන්/ වරදකරුවන් වන මුළු ළමයින් සංඛ්‍යාව)** | **63** | **-** | **60** | **-** | **3** | **-** |
| සොරකම, මංකොල්ල කෑම, ගෙවල් බිඳීම | 24 | 38.1 | 23 | 38.3 | 1 | 33.3 |
| අන් අයට ශාරීරික හානි සිදුකිරීම | 5 | 7.9 | 5 | 8.3 | - | - |
| මත් ද්‍රව්‍ය ළඟ තබා ගැනීම, විකිණීම, භාවිතය | 9 | 14.3 | 9 | 15.0 | - | - |
| ස්ත්‍රී දූෂණය කිරීම/ ලිංගික අපයෝජනයට ලක් කිරීම | 8 | 12.7 | 7 | 11.7 | 1 | 33.3 |
| අයාලේ යාම | 6 | 9.5 | 6 | 10.0 | - | - |
| පාලනය කර ගත නොහැකි වීම (පාලන අතික්‍රාන්තිය) | 17 | 27.0 | 16 | 26.7 | 1 | 33.3 |
| සඳහන් නොකළ | 1 | 1.6 | 1 | 1.7 | - | - |
| **ගාල්ල (සැකකරුවන්/ වරදකරුවන් වන මුළු ළමයින් සංඛ්‍යාව)** | **62** | **-** | **59** | **-** | **3** | **-** |
| සොරකම, මංකොල්ල කෑම, ගෙවල් බිඳීම | 23 | 37.1 | 22 | 37.3 | 1 | 33.3 |
| අන් අයට ශාරීරික හානි සිදුකිරීම | 5 | 8.1 | 5 | 8.5 | - | - |
| මත් ද්‍රව්‍ය ළඟ තබා ගැනීම, විකිණීම, භාවිතය | 9 | 14.5 | 9 | 15.3 | - | - |
| ස්ත්‍රී දූෂණය කිරීම/ ලිංගික අපයෝජනයට ලක් කිරීම | 8 | 12.9 | 7 | 11.9 | 1 | 33.3 |
| අයාලේ යාම | 6 | 9.7 | 6 | 10.2 | - | - |
| පාලනය කර ගත නොහැකි වීම (පාලන අතික්‍රාන්තිය) | 17 | 27.4 | 16 | 27.1 | 1 | 33.3 |
| සඳහන් නොකළ | 1 | 1.6 | 1 | 1.7 | - | - |
| **මාතර (සැකකරුවන්/ වරදකරුවන් වන මුළු ළමයින් සංඛ්‍යාව)** | **1** | **-** | **1** | **-** | **-** | **-** |
| සොරකම, මංකොල්ල කෑම, ගෙවල් බිඳීම | 1 | 100.0 | 1 | 100.0 | - | - |
| **හම්බන්තොට (සැකකරුවන්/ වරදකරුවන් වන මුළු ළමයින් නැත)** | **-** | **-** | **-** | **-** | **-** | **-** |

සටහන: සැකකරුවන්/ වරදකරුවන් වන ඇතැම් ළමයින්ට ඒ සඳහා එක් හේතුවකට වඩා බලපා ඇති බැවින් එකතුව සමාන නොවේ

සැකකරුවන් හෝ වරදකරුවන් ලෙස දකුණු පළාත තුළ නිවාසගත කර ඇති ළමුන් සංඛ්‍යාව 63 දෙනෙකි. මෙම සංඛ්‍යාව දකුණු පළාත තුළ ආයතනගත කරන ලද මුළු ළමුන් සංඛ්‍යාව හා සැසඳීමේදී 7%ක් පමණ වේ. මෙම ළමුන්ගෙන් වැඩිම පිරිසක් සොරකම, මංකොල්ල කෑම, ගෙවල් බිඳීම යන හේතූන් සඳහා සැකකරුවන්/ වරදකරුවන් වන අතර මේ අතරින් 96%ක් පමණ පිරිමි ළමුන් බව වාර්තා වී ඇත.

**වගුව 4.21 සැකකරුවන්/ වරදකරුවන් ලෙස ආයතනගතව සිටින ළමුන් සැකකරුවකු/ වරදකරුවකු වීමට හේතුව/ හේතු හා වයස් කාණ්ඩය අනුව**

| සැකකරුවන්/ වරදකරුවන් වීමට හේතුව | එකතුව | | 8-12 | | 13-17 | | 18 හෝ ඊට වැඩි | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| සොරකම, මංකොල්ල කෑම, ගෙවල් බිඳීම | 24 | 38.1 | 3 | 60.0 | 21 | 36.8 | - | - |
| අන් අයට ශාරීරික හානි සිදුකිරීම | 5 | 7.9 | - | - | 5 | 8.8 | - | - |
| මත් ද්‍රව්‍ය ළඟ තබා ගැනීම, විකිණීම, භාවිතය | 9 | 14.3 | 1 | 20.0 | 8 | 14.0 | - | - |
| ස්ත්‍රී දූෂණය කිරීම/ ලිංගික අපයෝජනයට ලක් කිරීම | 8 | 12.7 | - | - | 7 | 12.3 | 1 | 100 |
| අයාලේ යාම | 6 | 9.5 | 2 | 40.0 | 4 | 7.0 | - | - |
| පාලනය කර ගත නොහැකි වීම (පාලන අතික්‍රාන්තිය) | 17 | 27.0 | 2 | 40.0 | 15 | 26.3 | - | - |
| සඳහන් නොකළ | 1 | 1.6 | - | - | 1 | 1.8 | - | - |
| **සැකකරුවන්/ වරදකරුවන් වන මුළු ළමයින් සංඛ්‍යාව** | **63** | **-** | **5** | **-** | **57** | **-** | **1** | **-** |

සටහන: සැකකරුවන්/ වරදකරුවන් වන ඇතැම් ළමයින්ට ඒ සඳහා එක් හේතුවකට වඩා බලපා ඇති බැවින් සැකකරුවන්/ වරදකරුවන් වන මුළු ළමයින් සංඛ්‍යාව එකතුවට සමාන නොවේ

සැකකරුවන්/ වරදකරුවන් වන ළමුන්ගෙන් 58 දෙනෙක් ම වයස අවුරුදු 13 හෝ ඊට වැඩි වේ.

### 4.3 අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු

කුමන තත්ත්වයක් යටතේ වුව ද ළමයකුගේ අධ්‍යාපන අයිතිය අඛණ්ඩව සුරක්ෂිත විය යුතුව ඇති අතර යම් ආකාරයකින් ළමයාට අධ්‍යාපන අයිතිය අහිමි වුවහොත් ඒ තුළින් අනාගතයේ ඉතා බරපතල සමාජ ආර්ථික ගැටළු නිර්මාණය වීමේ පසුබිමක් ඇති විය හැකිය. එම නිසා ආයතනගත ළමුන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු කරගෙනයාම පිළිබඳව තොරතුරු ලබා ගැනීමත්, ළමයින් සමාජගත කිරීමේදී වැදගත් වන වෘත්තීය අධ්‍යාපනය සඳහා ආයතනගත ළමුන්ට අවස්ථාව ලබා දීම පිළිබඳව තොරතුරු ලබා ගැනීමත් මෙම සංගණනයේදී සිදු කරන ලදී.

#### *වර්තමාන අධ්‍යාපන කටයුත්ත*


කිසියම් අධ්‍යාපන කටයුත්තක නිරතවීම ලෙස සලකා බලනු ලබන්නේ පෙර පාසල් අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනය, විශ්ව විද්‍යාල අධ්‍යාපනය, වෘත්තීය/ කාර්මික අධ්‍යාපනය හෝ වෙනත් පිළිගත් අධ්‍යාපන කටයුත්තක නිරතවීම වේ. සාමාන්‍යයෙන් අවුරුදු 3 හා ඊට වැඩි ළමුන් කිසියම් අධ්‍යාපන කටයුත්තක නියැලිය යුතු ළමුන් ලෙස සැලකෙන අතර දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් අතරින් 890 දෙනෙක් මෙම වයස් කාණ්ඩය තුළ පසු වේ. මේ අතරින් 793 දෙනෙක් (89%) කිසියම් අධ්‍යාපන කටයුත්තක නිරත වන බව වාර්තා වී ඇති අතර අධ්‍යාපන කටයුත්තක නිරත නොවන්නේ 97 දෙනෙක් පමණි.

ළමුන් අධ්‍යාපන කටයුත්තක නිරතවීම ආයතන වර්ගය අනුව සලකා බැලීමේදී ස්වේච්ඡා ළමා නිවාස හා රජයේ භාරගැනීමේ ළමා නිවාසය තුළ සිටින ළමුන්ගෙන් 95% පමණ කිසියම් අධ්‍යාපන කටයුත්තක නිරත වී සිටින බව වාර්තා වී ඇති අතර රැඳවුම් නිවාස තුළ සිටින ළමුන් අධ්‍යාපන කටයුත්තක නිරතවීම තරමක් අඩු ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. විශේෂයෙන්ම රැඳවුම් නිවාස තුළ සිටින ළමුන් අතිශය තාවකාලිකව මෙම ස්ථානවල රඳවා සිටින බැවින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුත්ත වාර්තාවීමේදී තොරතුරු නොමැති කම හේතුවෙන් කිසියම් ගැටලුවක් සිදුවිය හැකි බව ද මෙහිදී පෙන්වා දිය යුතු ය.

වගුව 4.22 දිස්ත්‍රික්කය, ආයතන වර්ගය හා අධ්‍යාපන කටයුත්තක නිරතවීම අනුව අවුරුදු 3 හා ඊට වැඩි ආයතනගත ළමුන්

| ආයතන වර්ගය | එකතුව | | අධ්‍යාපන කටයුත්තක නිරතවන | | අධ්‍යාපන කටයුත්තක නිරත නොවන | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **දකුණු පළාත** | **890** | **100** | **793** | **89.1** | **97** | **10.9** |
| රැඳවුම් නිවාසය | 31 | 100 | 10 | 32.3 | 21 | 67.7 |
| සහතික කළ පාසල | 115 | 100 | 103 | 89.6 | 12 | 10.4 |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 48 | 100 | 46 | 95.8 | 2 | 4.2 |
| නිවර්තන ළමා නිවාසය | 93 | 100 | 79 | 84.9 | 14 | 15.1 |
| ස්වේච්ඡා ළමා නිවාසය | 583 | 100 | 555 | 95.2 | 28 | 4.8 |
| වෙනත් | 20 | 100 | - | - | 20 | 100.0 |
| **ගාල්ල** | **694** | **100** | **623** | **89.8** | **71** | **10.2** |
| රැඳවුම් නිවාසය | 31 | 100 | 10 | 32.3 | 21 | 67.7 |
| සහතික කළ පාසල | 115 | 100 | 103 | 89.6 | 12 | 10.4 |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 48 | 100 | 46 | 95.8 | 2 | 4.2 |
| නිවර්තන ළමා නිවාසය | 93 | 100 | 79 | 84.9 | 14 | 15.1 |
| ස්වේච්ඡා ළමා නිවාසය | 407 | 100 | 385 | 94.6 | 22 | 5.4 |
| **මාතර** | **97** | **100** | **94** | **96.9** | **3** | **3.1** |
| ස්වේච්ඡා ළමා නිවාසය | 97 | 100 | 94 | 96.9 | 3 | 3.1 |
| **හම්බන්තොට** | **99** | **100** | **76** | **76.8** | **23** | **23.2** |
| ස්වේච්ඡා ළමා නිවාසය | 79 | 100 | 76 | 96.2 | 3 | 3.8 |
| වෙනත් | 20 | 100 | - | - | 20 | 100.0 |

රූප සටහන 4.8
ආයතන වර්ගය හා අධ්‍යාපන කටයුත්තක නිරතවීම අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

**වගුව 4.23 ස්ත්‍රී/ පුරුෂ භාවය, වයස් කාණ්ඩය, අධ්‍යාපන කටයුත්තක නිරතවීම අනුව අවුරුදු 3 හා ඊට වැඩි ආයතනගත ළමුන්**

| වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය | එකතුව | | අධ්‍යාපන කටයුත්තක නිරතවන | | අධ්‍යාපන කටයුත්තක නිරත නොවන | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **පුරුෂ** | **308** | **100** | **264** | **85.7** | **44** | **14.3** |
| 3-4 | 20 | 100 | 19 | 95.0 | 1 | 5.0 |
| 5-9 | 67 | 100 | 56 | 83.6 | 11 | 16.4 |
| 10-14 | 124 | 100 | 106 | 85.5 | 18 | 14.5 |
| 15-17 | 87 | 100 | 75 | 86.2 | 12 | 13.8 |
| 18 හෝ ඊට වැඩි | 10 | 100 | 8 | 80.0 | 2 | 20.0 |
| **ස්ත්‍රී** | **582** | **100** | **529** | **90.9** | **53** | **9.1** |
| 3-4 | 17 | 100 | 15 | 88.2 | 2 | 11.8 |
| 5-9 | 91 | 100 | 83 | 91.2 | 8 | 8.8 |
| 10-14 | 221 | 100 | 206 | 93.2 | 15 | 6.8 |
| 15-17 | 221 | 100 | 198 | 89.6 | 23 | 10.4 |
| 18 හෝ ඊට වැඩි | 32 | 100 | 27 | 84.4 | 5 | 15.6 |
| **එකතුව** | **890** | **100** | **793** | **89.1** | **97** | **10.9** |
| 3-4 | 37 | 100 | 34 | 91.9 | 3 | 8.1 |
| 5-9 | 158 | 100 | 139 | 88.0 | 19 | 12.0 |
| 10-14 | 345 | 100 | 312 | 90.4 | 33 | 9.6 |
| 15-17 | 308 | 100 | 273 | 88.6 | 35 | 11.4 |
| 18 හෝ ඊට වැඩි | 42 | 100 | 35 | 83.3 | 7 | 16.7 |

ආයතනගත ළමුන් අධ්‍යාපන කටයුත්තක නිරතවීම වයස් කාණ්ඩ අනුව සැලකීමේදී අනිවාර්ය අධ්‍යාපනය ලැබිය යුතු වයස් කාණ්ඩයේ පසුවන ළමුන්ගෙන් 89%කට වැඩි ප්‍රතිශතයක් කුමන හෝ අධ්‍යාපන කටයුත්තක නිරත වන බව නිරීක්ෂණය වේ.

**වගුව 4.24 දැනට නිරත වන අධ්‍යාපන කටයුත්ත හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව අවුරුදු 3 හා ඊට වැඩි ආයතනගත ළමුන්**

| දැනට නිරත වන අධ්‍යාපන කටයුත්ත | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පෙර පාසල් අධ්‍යාපනය | 53 | 6.7 | 32 | 12.1 | 21 | 4.0 |
| පාසල් අධ්‍යාපනය | 654 | 82.5 | 186 | 70.5 | 468 | 88.5 |
| විශ්ව විද්‍යාල අධ්‍යාපනය | 1 | 0.1 | - | - | 1 | 0.2 |
| වෘත්තීය/ කාර්මික අධ්‍යාපනය (NVQ සහතික) | 40 | 5.0 | 23 | 8.7 | 17 | 3.2 |
| වෘත්තීය/ කාර්මික අධ්‍යාපනය (NVQ සහතික නොවන) | 39 | 4.9 | 23 | 8.7 | 16 | 3.0 |
| වෙනත් අධ්‍යාපන කටයුතු | 5 | 0.6 | - | - | 5 | 0.9 |
| සඳහන් නොකළ | 1 | 0.1 | - | - | 1 | 0.2 |
| **එකතුව** | **793** | **100** | **264** | **100** | **529** | **100** |

දකුණු පළාත තුළ ආයතනගතව සිටින කිසියම් අධ්‍යාපන කටයුත්තක නිරතවන ළමුන්ගෙන් 82% (654) පමණ පාසල් අධ්‍යාපනය ලබන බවත් 9.9% (79) පමණ වෘත්තීය/ කාර්මික අධ්‍යාපන කටයුතුවල නිරතවී සිටින බවත් වාර්තා වී ඇත. මේ අතර විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන ළමයකු වාර්තාවීම ද සැලකිය යුතු වැදගත් කරුණකි.

**වගුව 4.25 දැනට අධ්‍යාපනය නොලබන අවුරුදු 3 හා ඊට වැඩි ආයතනගත ළමුන් එයට හේතුව හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව**

| හේතුව | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටීම | 1 | 1.0 | - | - | 1 | 1.9 |
| ඉගෙනුම් දුර්වලතා | 14 | 14.4 | 4 | 9.1 | 10 | 18.9 |
| රෝගී/ ආබාධිත තත්ත්ව | 24 | 24.7 | 17 | 38.6 | 7 | 13.2 |
| පාසලකට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප කිරීම | 4 | 4.1 | 3 | 6.8 | 1 | 1.9 |
| නීතිමය හේතු | 23 | 23.7 | 8 | 18.2 | 15 | 28.3 |
| පාසැල්/ පෙර පාසල් අධ්‍යාපනය ලබා දීමට බලාපොරොත්තුවෙන් සිටීම | 11 | 11.3 | 4 | 9.1 | 7 | 13.2 |
| අ.පො.ස. සා.පෙළ/ උ.පෙළ විභාගය අසමත් වීම, අධ්‍යාපනය අවසන් කර තිබීම | 1 | 1.0 | 1 | 2.3 | - | - |
| නවක යොමුවීමක් | 10 | 10.3 | 6 | 13.6 | 4 | 7.5 |
| රැකියාවක නිරත වීම | 1 | 1.0 | - | - | 1 | 1.9 |
| ලේඛන අඩුපාඩු | 2 | 2.1 | - | - | 2 | 3.8 |
| වෙනත් | 6 | 6.2 | 1 | 2.3 | 5 | 9.4 |
| **එකතුව** | **97** | **100** | **44** | **100** | **53** | **100** |

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමයින් අතරින් 97 දෙනෙක් කිසියම් අධ්‍යාපන කටයුත්තක නිරත නොවන බව වාර්තා වී ඇති අතර ඒ අතරින් බහුතරය (55%) ගැහැණු ළමයින් වේ. මෙම පිරිස අධ්‍යාපන කටයුත්තක නිරත නොවීමට බලපාන ලද හේතු විමසා බැලීමේදී වැඩිම පිරිසක් රෝගී/ ආබාධිත තත්ත්වයන් හා නීතිමය හේතු නිසා අධ්‍යාපන කටයුතු කරගෙන යා නොහැකි තත්ත්වයට පත්ව ඇති බව වාර්තා වී ඇත. එසේම ළමයින් 4 දෙනෙක් පාසලකට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප කර ඇති බව සංගණනයේදී වාර්තා වී ඇත. මෙවැනි අවස්ථා සඳහා විකල්ප සකස් කිරීම වෙනුවෙන් වගකිව යුතු පාර්ශ්වයන් කඩිනම් අවධානය යොමු කළ යුතුව ඇත. තව ද ඉගෙනුම් දුර්වලතා හේතුවෙන් ළමයින් 14 දෙනෙකුගේ අධ්‍යාපන අවස්ථා අහිමි වී ඇති බව ද වාර්තා වී ඇත. ඉගෙනුම් දුර්වලතා ළමයාගේ අධ්‍යාපන අවස්ථා අහිමිවීමට හේතුවක් නොකරගත යුතු අතර එම ළමයින් සඳහා ද විකල්ප අවස්ථාවන් හෝ හඳුන්වා දී ඔවුන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කරදිය යුතු වේ.

***ලබා ඇති ඉහළම අධ්‍යාපනය හා සාක්ෂරතාවය***

මෙම සංගණනයේදි අවුරුදු 6 හා ඊට ඉහළ වයසේ පසුවන ළමුන් ලබා ගෙන ඇති ඉහළම අධ්‍යාපන තත්ත්වය හා ඔවුන්ගේ සාක්ෂරතාවය පිළිබඳව තොරතුරු එක්රැස් කරගන්නා ලදී.

දකුණු පළාත තුළ ආයතනගත ළමුන් අතරින් 23 දෙනෙක් අ. පො. ස. (සා/පෙළ) හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකමක් ලබාගෙන ඇති අතර ඒ අතරින් අ. පො. ස. (උ/පෙළ) සමත් ළමුන් 4 දෙනෙක් වාර්තා වීම ධනාත්මක තත්ත්වයක් ලෙස සඳහන් කළ හැකිය.

**වගුව 4.26 ලබා ඇති ඉහළ ම අධ්‍යාපන සුදුසුකම හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව අවුරුදු 6 හා ඊට වැඩි ආයතනගත ළමුන්**

| ඉහළ ම අධ්‍යාපන සුදුසුකම | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කිසිදා පාසල් ගොස් නැත | 28 | 100 | 15 | 53.6 | 13 | 46.4 |
| දැනට 1 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි | 28 | 100 | 11 | 39.3 | 17 | 60.7 |
| 1 ශ්‍රේණිය සමත් | 32 | 100 | 16 | 50.0 | 16 | 50.0 |
| 2 ශ්‍රේණිය සමත් | 47 | 100 | 12 | 25.5 | 35 | 74.5 |
| 3 ශ්‍රේණිය සමත් | 49 | 100 | 19 | 38.8 | 30 | 61.2 |
| 4 ශ්‍රේණිය සමත් | 54 | 100 | 22 | 40.7 | 32 | 59.3 |
| 5 ශ්‍රේණිය සමත් | 76 | 100 | 33 | 43.4 | 43 | 56.6 |
| 6 ශ්‍රේණිය සමත් | 70 | 100 | 23 | 32.9 | 47 | 67.1 |
| 7 ශ්‍රේණිය සමත් | 90 | 100 | 31 | 34.4 | 59 | 65.6 |
| 8 ශ්‍රේණිය සමත් | 121 | 100 | 36 | 29.8 | 85 | 70.2 |
| 9 ශ්‍රේණිය සමත් | 97 | 100 | 25 | 25.8 | 72 | 74.2 |
| 10 ශ්‍රේණිය සමත් | 110 | 100 | 22 | 20.0 | 88 | 80.0 |
| අ.පො.ස. (සා/පෙළ) සමත් | 19 | 100 | 4 | 21.1 | 15 | 78.9 |
| අ.පො.ස. (උ/පෙළ) සමත් | 4 | 100 | - | - | 4 | 100.0 |
| සඳහන් නොකළ | 6 | 100 | 6 | 100 | - | - |
| **එකතුව** | **831** | **100** | **275** | **33.1** | **556** | **66.9** |

### වගුව 4.27 ස්ත්‍රී/ පුරුෂ භාවය, වයස් කාණ්ඩය හා සාක්ෂරතාවය අනුව අවුරුදු 6 හා ඊට වැඩි ආයතනගත ළමුන්

| ස්ත්‍රී/ පුරුෂ භාවය හා වයස් කාණ්ඩය | එකතුව | | කියවීමට හා ලිවීමට හැකි ය | | කියවීමට හා ලිවීමට නොහැකි ය | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **පුරුෂ** | **275** | **100** | **247** | **89.8** | **28** | **10.2** |
| 6-7 | 28 | 100 | 16 | 57.1 | 12 | 42.9 |
| 8-10 | 43 | 100 | 38 | 88.4 | 5 | 11.6 |
| 11-14 | 107 | 100 | 98 | 91.6 | 9 | 8.4 |
| 15-17 | 87 | 100 | 86 | 98.9 | 1 | 1.1 |
| 18 හෝ ඊට වැඩි | 10 | 100 | 9 | 90.0 | 1 | 10.0 |
| **ස්ත්‍රී** | **556** | **100** | **508** | **91.4** | **48** | **8.6** |
| 6-7 | 34 | 100 | 22 | 64.7 | 12 | 35.3 |
| 8-10 | 81 | 100 | 68 | 84.0 | 13 | 16.0 |
| 11-14 | 188 | 100 | 176 | 93.6 | 12 | 6.4 |
| 15-17 | 221 | 100 | 211 | 95.5 | 10 | 4.5 |
| 18 හෝ ඊට වැඩි | 32 | 100 | 31 | 96.9 | 1 | 3.1 |
| **එකතුව** | **831** | **100** | **755** | **90.9** | **76** | **9.1** |
| 6-7 | 62 | 100 | 38 | 61.3 | 24 | 38.7 |
| 8-10 | 124 | 100 | 106 | 85.5 | 18 | 14.5 |
| 11-14 | 295 | 100 | 274 | 92.9 | 21 | 7.1 |
| 15-17 | 308 | 100 | 297 | 96.4 | 11 | 3.6 |
| 18 හෝ ඊට වැඩි | 42 | 100 | 40 | 95.2 | 2 | 4.8 |

ආයතනගතව සිටින අවුරුදු 6 හෝ ඊට ඉහළ ළමුන්ගේ සාක්ෂරතාවය පිළිබඳව විමසා බැලීමේදී එම ළමුන්ගෙන් 90.9%කට තමා භාවිතා කරන භාෂාවෙන් කිසියම් දෙයක් ලිවීමටත්, කියවා තේරුම් ගැනීමටත් හැකියාව ඇති බව වාර්තා වී ඇත. මෙම ප්‍රතිශතය ගැහැණු ළමුන් සඳහා 91.4% වන විට පිරිමි ළමුන් සඳහා 89.8% ලෙස වාර්තා වී ඇත. තව ද වයස් කාණ්ඩ අනුව සැලකීමේදී අවුරුදු 14ට වැඩි ළමයින් අතර 95% හෝ ඊට ඉහළ සාක්ෂරතාවයක් පෙන්නුම් කරනු ලැබේ.

*වෘත්තීය අධ්‍යාපනය*

වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම තුළින් ළමයකුගේ අනාගතය සැලසුම් කිරීමේදී යම් ආකාරයක පිටිවහලක් ලබා ගත හැකි වේ. විශේෂයෙන්ම ආයතනගත ළමයකු නැවත සමාජගත කිරීම සඳහා අවස්ථාවන් හඳුනාගැනීමේදී ඔහු/ ඇය වෘත්තීය සුදුසුකමක් ලබා ඇත්නම් එයට අදාළ වන සේ රැකියා අවස්ථාවන් සොයාබලා එමගින් ළමයා සමාජගත කිරීමට අවස්ථාව සලසාගත හැකි ය. එසේ වෘත්තීය අධ්‍යාපනයක් ලබා තිබීම තුළින් ළමයෙකුට අනාගතයේදී තමාගේම ආර්ථික කටයුත්තක් හෝ ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට ද හැකියාවක් ඇත. එම නිසා මෙම සංගණනයේදි අවුරුදු 16 හා ඊට වැඩි ළමුන් වෘත්තීය පුහුණුවක් ලබා ඇත් ද යන්න පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලදී.

දකුණු පළාත තුළ ආයතනගත ළමුන් අතරින් අවුරුදු 16 හෝ ඊට වැඩි ළමුන් 214 දෙනෙක් සිටින බව වාර්තා වී ඇති අතර ඒ අතරින් කිසියම් වෘත්තීය සුදුසුකමක් ලබාගෙන ඇති පිරිස 15% (33) පමණක් බව වාර්තා වී ඇත. ආයතනගත ළමුන් අතර වෘත්තීය සුදුසුකම් ලබා ඇති ළමුන් සංඛ්‍යාව අඩු අගයක් ගැනීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ අවුරුදු 16 හෝ ඊට වැඩි ළමුන් අතරින් වැඩි ප්‍රතිශතයක් (69%) පාසල් හෝ උසස් අධ්‍යාපන කටයුතුවල නියැලී සිටීමත්, 19% පමණ පිරිසක් ඒ වන විටත් වෘත්තීය පුහුණු පාඨමාලා හදාරමින් සිටීමත් වේ.

### වගුව 4.28 ආයතනගතව සිටින පිළිගත් වෘත්තීය සුදුසුකමක් සහිත අවුරුදු 16 හා ඊට වැඩි ළමුන් ස්ත්‍රී/ පුරුෂ භාවය හා වයස අනුව

| ස්ත්‍රී/ පුරුෂ භාවය හා වයස | මුළු ළමයින් සංඛ්‍යාව | පිළිගත් වෘත්තීය සුදුසුකමක් සහිත ළමයින් | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | % |
| **පුරුෂ** | **63** | **8** | **12.7** |
| 16 | 39 | 5 | 7.9 |
| 17 | 14 | 2 | 3.2 |
| 18 හෝ ඊට වැඩි | 10 | 1 | 1.6 |
| **ස්ත්‍රී** | **151** | **25** | **16.6** |
| 16 | 73 | 11 | 7.3 |
| 17 | 46 | 6 | 4.0 |
| 18 හෝ ඊට වැඩි | 32 | 8 | 5.3 |
| **එකතුව** | **214** | **33** | **15.4** |
| 16 | 112 | 16 | 7.5 |
| 17 | 60 | 8 | 3.7 |
| 18 හෝ ඊට වැඩි | 42 | 9 | 4.2 |

## 4.4 ළමයාගේ චර්යා රටාවන්, රෝගී සහ ආබාධිත තත්ත්වයන් පිළිබඳ තොරතුරු

ආයතනගතව සිටින ළමයෙක් සාමාන්‍ය හැසිරීම් රටාවකින් යුතුව කල් ගෙවන්නේද යන්න හෝ විශේෂිත හැසිරීම් රටාවක් පෙන්වන්නේ ද යන්න විමසා බැලීම තුළින් ආයතනික පරිසරය තුළ ළමයාගේ මානසික තත්ත්වය පිළිබඳව දළ අවබෝධයක් ලබාගත හැකි වේ. ළමයාගේ කායික/මානසික නිරෝගීතාවය ළමයා සමාජගත කිරීමේදී ද තීරකයක් වන බැවින් මෙම සංගණනයේදී ළමයාගේ චර්යා රටාවන්, රෝගී සහ ආබාධිත තත්ත්වයන් පිළිබඳ තොරතුරු එක්රැස් කරන ලදී.

### වගුව 4.29 සාමාන්‍ය නිරීක්ෂණය අනුව ළමයාගේ හැසිරීම් රටාව හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ආයතනගත ළමුන්

| ළමයාගේ හැසිරීම් රටාව | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| සාමාන්‍ය හැසිරීම් රටාවකින් යුක්ත වේ | 804 | 87.3 | 273 | 84.3 | 531 | 88.9 |
| හුදකලා බවින් යුතුව කල් ගත කරයි/ එසේ කිරීමට රුචි බවක් පෙන්වයි | 27 | 2.9 | 11 | 3.4 | 16 | 2.7 |
| තමන් විසින් ම දරුණු කැපුම් සිදුකර ගෙන ඇත/ එසේ කිරීමට උත්සාහ දරා ඇත | 3 | 0.3 | - | - | 3 | 0.5 |
| තමන්ගේ ජීවිතයට හානි සිදුකර ගැනීමට උත්සාහ දරා ඇත | 3 | 0.3 | 1 | 0.3 | 2 | 0.3 |
| කාර්ය මණ්ඩලය/ වෙනත් දරුවන් වෙත නිතර පරුෂ වචනයෙන් බැනවදී | 14 | 1.5 | 5 | 1.5 | 9 | 1.5 |
| වෙනත් දරුවන් හට පහර දී ඇත/ එසේ කිරීමට උත්සාහ දරා ඇත | 40 | 4.3 | 19 | 5.9 | 21 | 3.5 |
| කාර්ය මණ්ඩලය වෙත පහර දී ඇත/ එසේ කිරීමට උත්සාහ දරා ඇත | 6 | 0.7 | 3 | 0.9 | 3 | 0.5 |
| පලායාමට උත්සාහ දරා ඇත | 8 | 0.9 | 4 | 1.2 | 4 | 0.7 |
| අධි ලිංගික/ සම ලිංගික ක්‍රියාකාරීත්වයකින් යුක්ත ය | 7 | 0.8 | 2 | 0.6 | 5 | 0.8 |
| වෙනත් | 41 | 4.5 | 17 | 5.2 | 24 | 4.0 |
| **එකතුව** | **921** | **-** | **324** | **-** | **597** | **-** |

සටහන: ඇතැම් ළමයින් තුළින් හැසිරීම් රටා එකකට වැඩි සංඛ්‍යාවක් පෙන්නුම් කරන බැවින් එකතුව සමාන නොවේ

දකුණු පළාත තුළ ආයතනගත ළමුන්ගේ හැසිරීම් රටාව නිරීක්ෂණය කිරීමේදී එම ළමුන් අතරින් 804 (87%) සාමාන්‍ය හැසිරීම් රටාවක් පෙන්වන බව වාර්තා වී ඇත. හැසිරීමේ ගැටලු ඇති බවට වාර්තා වී ඇත්තේ සුළුතරයක් වන ළමුන් 117 දෙනෙකු සම්බන්ධයෙන් පමණි. මුළු ළමුන්ගෙන් 40 දෙනෙක් පමණක් ආයතනයේ සිටින අනෙකුත් ළමුන් සමග ගැටුම් ඇති කරගෙන ඇති හෝ එසේ කිරීමට උත්සාහ දරා ඇති ළමුන් බවට ආයතනයේ පරිපාලනය විසින් හඳුනාගෙන ඇත. තමන්ගේ ජීවිතයට හානි සිදු කර ගැනීමට උත්සාහ දරන ලද ළමුන් 3 දෙනෙක් වාර්තාවීමත් ඒ අතරින් දෙදෙනෙක් ගැහැණු ළමුන් වීමත් කඩිනමින් අවධානය යොමු කළ යුතු ගැටලුවක් ලෙස හඳුනාගත හැකි ය. එසේම අධි ලිංගික/ සම ලිංගික ක්‍රියාකාරීත්වයකින් යුක්ත ළමුන් 7 දෙනෙකු හඳුනාගෙන ඇත. මෙසේ විවිධ චර්යා ගැටලු ඇති බවට හඳුනාගත් ළමුන් සම්බන්ධයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සුදුසු පියවර ගත යුතු වේ.

### වගුව 4.30 දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ආයතනගත ළමුන් වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව

| වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය | මුළු ළමයින් සංඛ්‍යාව | දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ළමයින් | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | % |
| **පුරුෂ** | **324** | **45** | **13.9** |
| 0-4 | 36 | 5 | 13.9 |
| 5-9 | 67 | 14 | 20.9 |
| 10-14 | 124 | 13 | 10.5 |
| 15-17 | 87 | 11 | 12.6 |
| 18 හෝ ඊට වැඩි | 10 | 2 | 20.0 |
| **ස්ත්‍රී** | **597** | **36** | **6.0** |
| 0-4 | 32 | 4 | 12.5 |
| 5-9 | 91 | 7 | 7.7 |
| 10-14 | 221 | 15 | 6.8 |
| 15-17 | 221 | 10 | 4.5 |
| 18 හෝ ඊට වැඩි | 32 | - | - |
| **එකතුව** | **921** | **81** | **8.8** |
| 0-4 | 68 | 9 | 13.2 |
| 5-9 | 158 | 21 | 13.3 |
| 10-14 | 345 | 28 | 8.1 |
| 15-17 | 308 | 21 | 6.8 |
| 18 හෝ ඊට වැඩි | 42 | 2 | 4.8 |

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් අතරින් 81 දෙනෙක්, එනම් මුළු ළමයින්ගෙන් 9% ක් පමණ දිගුකාලීනව කිසියම් රෝගයකින් හෝ ආබාධිත තත්ත්වයකින් පෙළෙමින් සිටින බව සංගණන තොරතුරු මගින් අනාවරණය වී ඇත. දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ළමුන් වයස් කාණ්ඩ අනුව සලකා බැලීමේදී අවුරුදු 10ට අඩු වයස් කාණ්ඩයේ ළමයින් අතරින් 13%ක් පමණ දිගු කාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන බව දැකිය හැකිය.

දකුණු පළාත තුළ දිගුකාලීනව කිසියම් රෝගයකින් හෝ ආබාධිත තත්ත්වයකින් පෙළෙමින් සිටින ළමුන් අතරින් වැඩි පිරිසක් මානසික රෝගී තත්ත්වයෙන් පෙලෙන බව වාර්තා වී ඇති අතර එම සංඛ්‍යාව රෝගයකින්/ ආබාධිත තත්ත්වයකින් පෙළෙමින් සිටින මුළු ළමයින්ගෙන් 59% පමණ වේ. මීට අමතරව කථන ආබාධ හා අපස්මාරය/ ස්නායු ආබාධ ද වැඩි වශයෙන් වාර්තා වී ඇත.

**වගුව 4.31 දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ආයතනගත ළමුන් රෝගය/ ආබාධය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව**

| රෝගය/ ආබාධය | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| හෘදය ආශ්‍රිත රෝග | 1 | 1 | - |
| ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග | 3 | - | 3 |
| දෘශ්‍ය ආබාධ | 7 | 4 | 3 |
| මානසික රෝගී තත්ත්ව | 48 | 29 | 19 |
| ශ්‍රව්‍ය ආබාධ | 6 | 4 | 2 |
| කථන ආබාධ | 16 | 8 | 8 |
| ඔටිසම් | 1 | 1 | - |
| පිළිකා | 1 | - | 1 |
| අපස්මාරය/ ස්නායු ආබාධ | 11 | 7 | 4 |
| අත්පා ආබාධ | 3 | 2 | 1 |
| වෙනත් | 6 | 4 | 2 |
| **දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන මුළු ළමුන් සංඛ්‍යාව** | **81** | **45** | **36** |

සටහන: ඇතැම් ළමයින් එක් රෝගයකට/ ආබාධයකට වැඩි සංඛ්‍යාවකින් පෙළෙන බැවින් දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන මුළු ළමුන් සංඛ්‍යාවේ එකතුවට සමාන නොවේ

**වගුව 4.32 දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ආයතනගත ළමුන් රෝගය/ ආබාධය හා වයස් කාණ්ඩය අනුව**

| රෝගය/ ආබාධය | එකතුව | 0-4 | 5-9 | 10-14 | 15-17 | 18 හෝ ඊට වැඩි |
|---|---|---|---|---|---|---|
| හෘදය ආශ්‍රිත රෝග | 1 | - | 1 | - | - | - |
| ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග | 3 | 2 | - | 1 | - | - |
| දෘශ්‍ය ආබාධ | 7 | 1 | 3 | 1 | 2 | - |
| මානසික රෝගී තත්ත්ව | 48 | 3 | 10 | 21 | 13 | 1 |
| ශ්‍රව්‍ය ආබාධ | 6 | - | 2 | 3 | 1 | - |
| කථන ආබාධ | 16 | 1 | 12 | 2 | 1 | - |
| ඔටිසම් | 1 | - | - | 1 | - | - |
| පිළිකා | 1 | - | - | - | 1 | - |
| අපස්මාරය/ ස්නායු ආබාධ | 11 | 4 | - | 4 | 2 | 1 |
| අත්පා ආබාධ | 3 | - | 1 | 1 | 1 | - |
| වෙනත් | 6 | 1 | 2 | 1 | 2 | - |
| **දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන මුළු ළමුන් සංඛ්‍යාව** | **81** | **9** | **21** | **28** | **21** | **2** |

සටහන: ඇතැම් ළමයි රෝගී/ ආබාධිත තත්ත්ව කිහිපයකින් පෙලෙමින් සිටින බැවින් දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන මුළු ළමුන් සංඛ්‍යාවේ එකතුවට සමාන නොවේ

වගුව 4.33 දිගුකාලීන රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන සහ ඒ සඳහා ප්‍රතිකාර ලබා ගන්නා ආයතනගත ළමුන් ස්ත්‍රී/ පුරුෂ භාවය හා වයස් කාණ්ඩය අනුව

| වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය | රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ළමයින් සංඛ්‍යාව | ප්‍රතිකාර ලබා ගන්නා ළමයින් | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | % |
| **පුරුෂ** | **45** | **41** | **91.1** |
| 0-4 | 5 | 4 | 80.0 |
| 5-9 | 14 | 13 | 92.9 |
| 10-14 | 13 | 12 | 92.3 |
| 15-17 | 11 | 10 | 90.9 |
| 18 හෝ ඊට වැඩි | 2 | 2 | 100.0 |
| **ස්ත්‍රී** | **36** | **27** | **75.0** |
| 0-4 | 4 | 4 | 100.0 |
| 5-9 | 7 | 5 | 71.4 |
| 10-14 | 15 | 11 | 73.3 |
| 15-17 | 10 | 7 | 70.0 |
| **එකතුව** | **81** | **68** | **84.0** |
| 0-4 | 9 | 8 | 88.9 |
| 5-9 | 21 | 18 | 85.7 |
| 10-14 | 28 | 23 | 82.1 |
| 15-17 | 21 | 17 | 81.0 |
| 18 හෝ ඊට වැඩි | 2 | 2 | 100.0 |

දකුණු පළාත තුළ ආයතනගතව සිටින කිසියම් රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙන ළමයින්ගෙන් 84% පමණ එම රෝගී/ ආබාධිත තත්ත්ව සඳහා අඛණ්ඩව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගනිමින් සිටින බව වාර්තා වී ඇත. ගැහැණු ළමුන්ට සාපේක්ෂව පිරිමි ළමුන් අතර අඛණ්ඩව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ වැඩි නැඹුරුතාවයක් පෙන්නුම් කර ඇත.

## 4.5 ළමුන්ගේ දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ තොරතුරු

ආයතනගතව සිටින ළමුන්ගේ පවුල් පසුබිම පිළිබඳව සොයාබැලීමේදී ඔවුන්ගේ දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම ඉතා වැදගත් වේ. එසේම මෙම තොරතුරු ළමයින් සමාජගත කිරීමේදී ද ප්‍රයෝජනවත් විය හැකි ය. එනම් දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ එක්රැස් කරගනු ලබන තොරතුරුවලට අනුව එම ළමයින් නැවත අදාළ භාරකරුවන් වෙත යොමු කිරීමේ හැකියාවක් ඇත් ද යන්න විමසා බැලිය හැකි අතර එසේ නොමැති නම් වෙනත් විකල්ප රැකවරණ අවස්ථාවන් සඳහා යොමු කිරීම පිළිබඳ සලකා බැලීමට යොමු විය හැකිය. මේ සඳහා මෙම සංගණනයේදී ළමයා ආයතනගත කරන අවස්ථාව වන විට හා සංගණන අවස්ථාව වන විට ළමයාගේ දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ තොරතුරු වෙන වෙනම රැස් කරගන්නා ලදී.

### 4.5.1 ළමුන් ආයතනගත කරන අවස්ථාව වන විට දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ තොරතුරු

මේ යටතේ ළමයා ආයතනගත කරන අවස්ථාව වන විට ළමයාගේ භාරකරු වූයේ කවුද යන වග, දෙමව්පියන් ජීවත්වූයේ ද යන වග, දෙමව්පියන්/ භාරකරුවන් බන්ධනාගාරගත වී/ විදේශගත වී සිටියේද යන වග, දෙමව්පියන්ට/ භාරකරුවන්ට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබුනේද යන වග, හා ඔවුන් ආදායමක් ඉපැයිය නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවූයේද යන වග යනාදී තොරතුරු එක්රැස් කරන ලදී.


වගුව 4.34 දිස්ත්‍රික්කය හා ආයතනගත කරන අවස්ථාව වන විට භාරකාරිත්වයේ ස්වභාවය අනුව ආයතනගත ළමුන්

| දිස්ත්‍රික්කය හා භාරකරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **දකුණු පළාත** | **921** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම | 89 | 9.7 |
| පියා පමණක් | 172 | 18.7 |
| මව පමණක් | 339 | 36.8 |
| වෙනත් පුද්ගලයෙක් | 143 | 15.5 |
| භාරකරුවෙක් නැත | 125 | 13.6 |
| භාරකරු පිළිබඳව නොදනී | 25 | 2.7 |
| සඳහන් නොකළ | 28 | 3.0 |
| **ගාල්ල** | **725** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම | 77 | 10.6 |
| පියා පමණක් | 140 | 19.3 |
| මව පමණක් | 258 | 35.6 |
| වෙනත් පුද්ගලයෙක් | 111 | 15.3 |
| භාරකරුවෙක් නැත | 97 | 13.4 |
| භාරකරු පිළිබඳව නොදනී | 19 | 2.6 |
| සඳහන් නොකළ | 23 | 3.2 |

| දිස්ත්‍රික්කය හා භාරකරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **මාතර** | **97** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම | 4 | 4.1 |
| පියා පමණක් | 19 | 19.6 |
| මව පමණක් | 43 | 44.3 |
| වෙනත් පුද්ගලයෙක් | 11 | 11.3 |
| භාරකරුවෙක් නැත | 10 | 10.3 |
| භාරකරු පිළිබඳව නොදනී | 6 | 6.2 |
| සඳහන් නොකළ | 4 | 4.1 |
| **හම්බන්තොට** | **99** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම | 8 | 8.1 |
| පියා පමණක් | 13 | 13.1 |
| මව පමණක් | 38 | 38.4 |
| වෙනත් පුද්ගලයෙක් | 21 | 21.2 |
| භාරකරුවෙක් නැත | 18 | 18.2 |
| සඳහන් නොකළ | 1 | 1.0 |

රූප සටහන 4.9

ආයතනගත කරන අවස්ථාව වන විට භාරකාරිත්වයේ ස්වභාවය අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ ආයතනගත කර සිටින ළමුන් ආයතනගත කරන අවස්ථාව වන විට භාරකාරිත්වය පිළිබඳව විමසා බැලීමේදී මුළු ළමයින්ගෙන් 2/3කගේ පමණ භාරකාරිත්වය හිමිව ඇත්තේ දෙමව්පියන් දෙදෙනාටම හෝ දෙමව්පියන්ගෙන් එක් අයකු වෙත වීම සලකා බැලිය යුතු තත්ත්වයක් ලෙස සඳහන් කල හැකි ය.මෙමගින් ගම්‍ය වන්නේ ළමුන් ආයතනගත කිරීම සඳහා දෙමව්පිය රැකවරණය අහිමිවීමට වඩා වෙනත් සාධක බලපා ඇති බවයි. මෙම ළමුන් අතරින් 13.6%, එනම් 125 දෙනෙක් කිසිදු භාරකරුවෙකු නොමැතිව ආයතනගත කර තිබීම හා ළමයින් 25 දෙනෙකුගේ භාරකරුවන් පිළිබඳ තොරතුරු වාර්තා නොවීමත් නිරීක්ෂණය විය.

වගුව 4.35 දිස්ත්‍රික්කය, ආයතනගත කරන අවස්ථාව වන විට දෙමව්පියන් ජීවත්වූයේ ද යන්න හා ස්ත්‍රී/පුරුෂ භාවයට අනුව ආයතනගත ළමුන්


| දෙමව්පියන් ජීවත්වූයේ ද යන වග | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **දකුණු පළාත** | **921** | **100** | **324** | **100** | **597** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම ජීවත්ව සිට ඇත | 534 | 58.0 | 197 | 60.8 | 337 | 56.4 |
| පියා පමණක් ජීවත්ව සිට ඇත | 87 | 9.4 | 20 | 6.2 | 67 | 11.2 |
| මව පමණක් ජීවත්ව සිට ඇත | 230 | 25.0 | 76 | 23.5 | 154 | 25.8 |
| දෙමව්පියන් දෙදෙනාම මියගොස් ඇත | 7 | 0.8 | 3 | 0.9 | 4 | 0.7 |
| පියා මියගොස් ඇත, මව පිළිබඳව නොදනී | 1 | 0.1 | - | - | 1 | 0.2 |
| මව මියගොස් ඇත, පියා පිළිබඳව නොදනී | 4 | 0.4 | 1 | 0.3 | 3 | 0.5 |
| දෙමව්පියන් දෙදෙනාම පිළිබඳව නොදනී | 58 | 6.3 | 27 | 8.3 | 31 | 5.2 |
| **ගාල්ල** | **725** | **100** | **270** | **100** | **455** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම ජීවත්ව සිට ඇත | 422 | 58.2 | 167 | 61.9 | 255 | 56.0 |
| පියා පමණක් ජීවත්ව සිට ඇත | 69 | 9.5 | 15 | 5.6 | 54 | 11.9 |
| මව පමණක් ජීවත්ව සිට ඇත | 185 | 25.5 | 63 | 23.3 | 122 | 26.8 |
| දෙමව්පියන් දෙදෙනාම මියගොස් ඇත | 4 | 0.6 | 3 | 1.1 | 1 | 0.2 |
| පියා මියගොස් ඇත, මව පිළිබඳව නොදනී | 1 | 0.1 | - | - | 1 | 0.2 |
| මව මියගොස් ඇත, පියා පිළිබඳව නොදනී | 2 | 0.3 | - | - | 2 | 0.4 |
| දෙමව්පියන් දෙදෙනාම පිළිබඳව නොදනී | 42 | 5.8 | 22 | 8.1 | 20 | 4.4 |
| **මාතර** | **97** | **100** | **15** | **100** | **82** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම ජීවත්ව සිට ඇත | 51 | 52.6 | 2 | 13.3 | 49 | 59.8 |
| පියා පමණක් ජීවත්ව සිට ඇත | 12 | 12.4 | 5 | 33.3 | 7 | 8.5 |
| මව පමණක් ජීවත්ව සිට ඇත | 20 | 20.6 | 6 | 40.0 | 14 | 17.1 |
| දෙමව්පියන් දෙදෙනාම මියගොස් ඇත | 3 | 3.1 | - | - | 3 | 3.7 |
| දෙමව්පියන් දෙදෙනාම පිළිබඳව නොදනී | 11 | 11.3 | 2 | 13.3 | 9 | 11.0 |
| **හම්බන්තොට** | **99** | **100** | **39** | **100** | **60** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම ජීවත්ව සිට ඇත | 61 | 61.6 | 28 | 71.8 | 33 | 55.0 |
| පියා පමණක් ජීවත්ව සිට ඇත | 6 | 6.1 | - | - | 6 | 10.0 |
| මව පමණක් ජීවත්ව සිට ඇත | 25 | 25.3 | 7 | 17.9 | 18 | 30.0 |
| මව මියගොස් ඇත, පියා පිළිබඳව නොදනී | 2 | 2.0 | 1 | 2.6 | 1 | 1.7 |
| දෙමව්පියන් දෙදෙනාම පිළිබඳව නොදනී | 5 | 5.1 | 3 | 7.7 | 2 | 3.3 |

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් 921 දෙනා අතරින් 92% (851) දෙනෙකුගේ පමණ ආයතනගත වන අවස්ථාව වන විට දෙමව්පියන් දෙදෙනාම හෝ දෙමව්පියන්ගෙන් එක් අයකු ජීවත්ව සිට ඇති බව වාර්තා වී ඇත. මේ ළමුන්ගෙන් අඩකට මදක් වැඩි පිරිසකගේ දෙමව්පියන් දෙදෙනාම ජීවත්ව සිට ඇති බවත්, 1/4කගේ පමණ මව පමණක් ජීවත්ව සිට ඇති බවත් වාර්තා වී ඇත.

මෙසේ දෙමව්පියන් ජීවත්ව සිටියදී වුව ද ළමුන් ආයතනගත කිරීමට සිදුව තිබීම අවධානය යොමු කළ යුතු කරුණක් වේ. මෙම ළමුන්ගෙන් 7 දෙනෙකුගේ දෙමව්පියන් දෙදෙනාම මිය ගොස් ඇති බව වාර්තා වී ඇති අතර ළමුන් 58 දෙනෙකුගේ දෙමව්පියන් දෙදෙනාම පිළිබඳව විස්තර නොදන්නා බව වාර්තා වී ඇත.

රූප සටහන 4.10

ආයතනගත කරන අවස්ථාව වන විට දෙමව්පියන් ජීවත්වූයේ ද යන්න අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

## වගුව 4.36 ආයතනගත කරන අවස්ථාව වන විට පියාගේ තොරතුරු අනුව ආයතනගත ළමුන්

| පියා පිළිබඳව තොරතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **පියාගේ විවාහක තත්ත්වය** | | |
| අවිවාහක | 31 | 5.0 |
| ළමයාගේ මව සමග විවාහක | 268 | 43.2 |
| ළමයාගේ මව නොවන වෙනත් අයෙකු සමග විවාහක | 42 | 6.8 |
| වැන්දඹු/ දික්කසාද වූ/ වෙන් වූ | 162 | 26.1 |
| නොදනී | 118 | 19.0 |
| **පියා බන්ධනාගාරගත වී සිටි/ විදේශගත වී සිටි අයෙක් ද යන වග** | | |
| බන්ධනාගාරගත වී සිටි අයෙක් | 67 | 10.8 |
| විදේශගත වී සිටි අයෙක් | 7 | 1.1 |
| බන්ධනාගාරගත වී හෝ විදේශගත වී සිටි අයෙක් නොවේ | 397 | 63.9 |
| ඒ පිළිබඳව නොදනී | 150 | 24.2 |
| **පියාට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබුණේ ද යන වග** | | |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබුණි | 176 | 28.3 |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් නොතිබුණි | 182 | 29.3 |
| නොදනී | 263 | 42.4 |
| **පියාගේ සෞඛ්‍ය තත්ත්වය** | | |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවිය | 29 | 4.7 |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයක් නොතිබුණි | 328 | 52.8 |
| නොදනී | 264 | 42.5 |
| **එකතුව** | **621** | **100** |

## වගුව 4.37 ආයතනගත කරන අවස්ථාව වන විට මවගේ තොරතුරු අනුව ආයතනගත ළමුන්

| මව පිළිබඳව තොරතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **මවගේ විවාහක තත්ත්වය** | | |
| අවිවාහක | 99 | 13.0 |
| ළමයාගේ පියා සමග විවාහක | 268 | 35.1 |
| ළමයාගේ පියා නොවන වෙනත් අයෙකු සමග විවාහක | 101 | 13.2 |
| වැන්දඹු/ දික්කසාද වූ/ වෙන් වූ | 158 | 20.7 |
| නොදනී | 138 | 18.1 |
| **මව බන්ධනාගාරගත වී සිටි/ විදේශගත වී සිටි අයෙක් ද යන වග** | | |
| බන්ධනාගාරගත වී සිටි අයෙක් | 16 | 2.1 |
| විදේශගත වී සිටි අයෙක් | 48 | 6.3 |
| බන්ධනාගාරගත වී හෝ විදේශගත වී සිටි අයෙක් නොවේ | 556 | 72.8 |
| ඒ පිළිබඳව නොදනී | 144 | 18.8 |
| **මවට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබුණේ ද යන වග** | | |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබුණි | 132 | 17.3 |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් නොතිබුණි | 389 | 50.9 |
| නොදනී | 243 | 31.8 |
| **මවගේ සෞඛ්‍ය තත්ත්වය** | | |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවිය | 69 | 9.0 |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයක් නොතිබුණි | 462 | 60.5 |
| නොදනී | 233 | 30.5 |
| **එකතුව** | **764** | **100** |

ආයතනගත කරන අවස්ථාවේ පියා භාරකරුවකු ලෙස ඉදිරිපත් වී සිට ඇත්තේ ළමුන් 261 දෙනෙකුගේ පමණක් වුව ද ඒ වන විට ළමුන් 621 දෙනෙකුගේ පියා ජීවතුන් අතර සිටි බවට වාර්තා වී ඇති බැවින් එම ළමුන් සම්බන්ධයෙන් පියා පිළිබඳව මූලික තොරතුරු එක්රැස් කරගැනීමක් සිදු කරන ලදී. ඒ අනුව ළමයා ආයතනගත කරන අවස්ථාව වන විට පියාගේ විවාහක තත්ත්වය සැලකීමේදී ළමුන්ගෙන් 268 දෙනෙකුගේ පියවරුන් එවකට ළමයාගේ මව සමග විවාහකව සිට ඇති බව වාර්තා වී ඇති අතර පියවරුන් අතරින් 42 දෙනෙක් ළමයාගේ මව නොවන වෙනත් අයෙකු සමග විවාහකව සිට ඇති බව වාර්තා වේ.

ළමයා ආයතනගත කරන අවස්ථාව වන විට මෙම ළමුන්ගෙන් 67 දෙනෙකුගේ පියා බන්ධනාගාරගත ව සිට ඇති බවත් 7 දෙනෙකුගේ පියා විදේශගතව සිට ඇති බවත් වාර්තා වී ඇත. එසේම ළමයා ආයතනගත කරන අවස්ථාව වන විට පියාට රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් තිබුනේ ද යන්න විමසා බැලීමේදී ළමුන් 176 දෙනෙකුගේ පියවරුන්ට රැකියාවක් හෝ ස්ථිර ආදායම් මාර්ගයක් තිබූ බව වාර්තා වී ඇත. ළමුන්ගෙන් 182 දෙනෙකුගේ පියවරුන්ට රැකියාවක් හෝ කිසිදු ස්ථිර ආදායම් මාර්ගයක් නොතිබී ඇති බව ද වාර්තා වී ඇත. මෙසේ වුව ද ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවී ඇති බවට වාර්තා වී ඇත්තේ ළමුන් 29 දෙනෙකුගේ පියවරුන් පමණි. ළමුන්ගෙන් අඩකගේ පමණ පියවරුන්ට ආදායම් ඉපැයීමට බාධාවක් වන ආකාරයේ රෝගී/ ආබාධිත තත්ත්වයක් නොතිබුණ බව වාර්තා වී ඇත.


ආයතනගත කරන අවස්ථාවේ මව භාරකරුවකු ලෙස ඉදිරිපත් වී සිට ඇත්තේ ළමුන් 428 දෙනෙකුගේ පමණක් වුව ද ඒ වන විට ළමුන් 764 දෙනෙකුගේ මව ජීවතුන් අතර සිටි බවට වාර්තා වී ඇති බැවින් එම ළමුන් සම්බන්ධයෙන් මව පිළිබඳව මූලික තොරතුරු එක්රැස් කරගැනීමක් සිදු කරන ලදී. ඒ වන විට ළමයාගේ මවගේ විවාහක තත්ත්වය සැලකීමේදී ළමුන් 268 දෙනෙකුගේ මව්වරු ළමයාගේ පියා සමග විවාහ වී ඇති බව වාර්තා වී ඇති අතර ළමුන් 101 දෙනෙකුගේ මවුවරුන් ළමයාගේ පියා නොවන වෙනත් අයෙකු සමග විවාහකව සිට ඇත. ළමුන් 158 දෙනෙකුගේ පමණ මව්වරුන් වැන්දඹු/ දික්කසාද වූ/ වෙන් වූ ගණයට අයත් බව වාර්තා වී තිබීම වගකිව යුතු පාර්ශ්වයන්ගේ අවධානය යොමු විය යුතු කරුණකි.

ළමයා ආයතනගත කරන අවස්ථාව වන විට මෙම ළමුන්ගෙන් 16 දෙනෙකුගේ මව බන්ධනාගාරගතව සිට ඇති බවත්, 48 දෙනෙකුගේ මව විදේශගතව සිට ඇති බවත් වාර්තා වී ඇත. එසේම ළමයා ආයතනගත කරන අවස්ථාව වන විට මවට රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් තිබුනේ ද යන්න විමසා බැලීමේදී රැකියාවක් හෝ ස්ථිර ආදායම් මාර්ගයක් තිබූ බව තහවුරු වී ඇත්තේ ළමුන් 132 දෙනෙකුගේ මව්වරුන්ට පමණක් වන අතර 389 දෙනෙකුගේ මව්වරුන්ට රැකියාවක් හෝ කිසිදු ස්ථිර ආදායම් මාර්ගයක් නොතිබී ඇති බව වාර්තා වී ඇත. මෙසේ වුව ද ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවී ඇති බවට වාර්තා වී ඇත්තේ ළමුන්ගෙන් 69 දෙනෙකුගේ මව්වරුන් පමණි. ළමුන්ගෙන් අඩකට වැඩි පිරිසකගේ මව්වරුන්ට ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයක් නොතිබුණ බව වාර්තා වී ඇත.

**වගුව 4.38 ආයතනගත කරන අවස්ථාව වන විට භාරකරුවෙක් යටතේ සිටි ළමුන් භාරකරුට තිබූ ඥාතිත්වය හා භාරකරු ඒ වන විට පදිංචියට සුදුසු වාසස්ථානයක ජීවත්ව සිටියේද යන්න අනුව**

| ඥාතිත්වය | එකතුව | | පදිංචියට සුදුසු වාසස්ථානයක ජීවත්ව සිටි | | පදිංචියට නුසුදුසු වාසස්ථානයක ජීවත්ව සිටි | | නොදනී | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | එකතුවේ % | සංඛ්‍යාව | එකතුවේ % | සංඛ්‍යාව | එකතුවේ % |
| සීයා | 9 | 100 | 7 | 77.8 | 2 | 22.2 | - | - |
| ආච්චි | 73 | 100 | 52 | 71.2 | 14 | 19.2 | 7 | 9.6 |
| මාමා | 4 | 100 | 3 | 75.0 | - | - | 1 | 25.0 |
| නැන්දා | 29 | 100 | 24 | 82.8 | - | - | 5 | 17.2 |
| සහෝදරයා/ සහෝදරිය | 9 | 100 | 8 | 88.9 | 1 | 11.1 | - | - |
| වෙනත් ඥාති | 7 | 100 | 4 | 57.1 | 3 | 42.9 | - | - |
| ඥාති නොවන | 12 | 100 | 6 | 50.0 | 3 | 25.0 | 3 | 25.0 |
| **එකතුව** | **143** | **100** | **104** | **72.7** | **23** | **16.1** | **16** | **11.2** |

රූප සටහන 4.11
ආයතනගත කරන අවස්ථාව වන විට භාරකරුවෙක් යටතේ සිටි ළමුන් භාරකරුට තිබූ ඥාතිත්වය අනුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් අතරින් 143 දෙනෙකු ආයතනගත වන විට මව/ පියා නොවන වෙනත් භාරකරුවෙක් යටතේ ජීවත්ව සිට ඇති බව වාර්තා වී ඇත. එය මුළු ළමුන්ගෙන් 16% පමණ වේ. එසේම මෙම ළමුන් භාරකරුට ඇති ඥාතිත්වය අනුව සැලකීමේදී වැඩිම පිරිසක භාරකාරීත්වය දරා ඇත්තේ ළමයාගේ ආච්චි විසින් වන අතර එය භාරකරුවකු යටතේ සිට ඇති ළමුන්ගෙන් අඩක් පමණ වේ. මීට අමතරව 29 දෙනෙක් මවගේ හෝ පියාගේ සහෝදරියකගේ (නැන්දා) භාරකාරිත්වය යටතේ ජීවත්ව ඇති බව වාර්තා වී ඇති අතර තවත් 22 දෙනෙක් සීයා, මාමා හෝ සහෝදරයෙක්/ සහෝදරියකගේ භාරකාරීත්වය යටතේ ජීවත්ව සිට ඇති බව වාර්තා වේ.

ආයතනගත වන අවස්ථාව වන විට මව/ පියා නොවන වෙනත් භාරකරුවෙක් යටතේ සිට ඇති ළමුන් පදිංචිව සිටි ස්ථානය පදිංචියට සුදුසු තත්ත්වයක පැවතියේ ද යන්න විමසා බැලීමේදී මෙම ළමුන්ගෙන් 72.7%කට ආසන්න සංඛ්‍යාවක් පදිංචිව සිට ඇත්තේ කිසියම් ආකාරයකින් පදිංචිය සඳහා සුදුසු ආකාරයකට සකස් කරන ලද ස්ථානයක බව සංගණන තොරතුරුවලින් අනාවරණය වී ඇත. එමෙන්ම එම ළමුන්ගෙන් 23 දෙනෙක් පදිංචියට නුසුදුසු ස්ථානයක පදිංචිව සිට ඇති බව වාර්තා වී ඇත.

### වගුව 4.39 ආයතනගත කරන අවස්ථාව වන විට භාරකරුවෙක් යටතේ සිටි ළමුන් භාරකරුගේ තොරතුරු අනුව

| භාරකරු පිළිබඳව තොරතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **භාරකරුට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබුණේ ද යන වග** | | |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබුණි | 27 | 18.9 |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් නොතිබුණි | 74 | 51.7 |
| නොදනී | 42 | 29.4 |
| **භාරකරුගේ සෞඛ්‍ය තත්ත්වය** | | |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවිය | 19 | 13.3 |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයක් නොතිබුණි | 75 | 52.4 |
| නොදනී | 49 | 34.3 |
| **භාරකරුගේ වයස** | | |
| 18-64 | 67 | 46.9 |
| 65 හෝ ඊට වැඩි | 47 | 32.9 |
| නොදනී | 29 | 20.3 |
| **එකතුව** | **143** | **100** |

ආයතනගත වන විට භාරකරුවකුගේ රැකවරණය යටතේ සිට ඇති ළමුන්ගෙන් අඩකගේ පමණ භාරකරුවන්හට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් නොතිබුණ බව වාර්තා වී ඇති අතර කිසියම් ආදායම් මාර්ගයක් තිබූ බව වාර්තා වී ඇත්තේ මෙම ළමුන්ගෙන් 27 දෙනෙකුගේ භාරකරුවන්ට පමණි. භාරකරුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව විමසා බැලීමේදී 19 දෙනෙකුගේ භාරකරුවන් ඒ වන විට ආදායමක් ඉපයිය නොහැකි සේ රෝගී හෝ ආබාධිත තත්ත්වයකින් පසුවෙමින් සිට ඇති බව වාර්තා වී ඇති අතර 75 දෙනෙකුගේ භාරකරුවන් ආදායම් ඉපැයීමේ කාර්යයට බලපෑමක් සිදුවන සේ කිසිදු රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙළෙමින් සිට නොමැති බව වාර්තා වී ඇත. භාරකරුගේ වයස පිළිබඳ අවධානය යොමු කිරීමේදී ළමුන්ගෙන් වැඩි පිරිසකගේ (67කගේ) භාරකරුවන් අවුරුදු 18-64 අතර වයස් කාණ්ඩය තුළ පසුවූවන් බවත්, ළමුන් 47 දෙනෙකුගේ භාරකරුවන් අවුරුදු 65 හෝ ඊට වැඩි පුද්ගලයන් වූ බවත් වාර්තා වී ඇත.


### 4.5.2 දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ වර්තමාන තොරතුරු

මේ යටතේ වර්තමානයේ ළමයාගේ භාරකරු ලෙස ආයතනයට ඉදිරිපත් වී ඇත්තේ කවරෙක්ද යන වග, දෙමව්පියන් භාරකරුවන් වන්නේ නම් ඔවුන්ගේ විවාහක තත්ත්වය, දෙමව්පියන්/ භාරකරුවන් බන්ධනාගාරගත වී/ විදේශගත වී සිටින්නේද යන වග, දෙමව්පියන්ට/ භාරකරුවන්ට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබේද යන වග හා රැකියාවක්/ හෝ ආදායම් මාර්ගයක් ඇත්නම් එය කුමක්ද යන වග, දෙමව්පියන්/ භාරකරු ආදායමක් ඉපැයිය නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවූයේද යන වග හා ඔවුන් ළමයා බැලීමට ආයතනයට පැමිණෙන කාල පරාසය යනාදී තොරතුරු මේ යටතේ එක්රැස් කරන ලදී.

**වගුව 4.40 වර්තමාන භාරකාරිත්වයේ ස්වභාවය අනුව ආයතනගත ළමුන්**

| භාරකරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **දකුණු පළාත** | **921** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම | 92 | 10.0 |
| පියා පමණක් | 154 | 16.7 |
| මව පමණක් | 326 | 35.4 |
| වෙනත් පුද්ගලයෙක් | 132 | 14.3 |
| භාරකරුවෙක් නැත | 217 | 23.6 |
| **ගාල්ල** | **725** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම | 79 | 10.9 |
| පියා පමණක් | 118 | 16.3 |
| මව පමණක් | 255 | 35.2 |
| වෙනත් පුද්ගලයෙක් | 102 | 14.1 |
| භාරකරුවෙක් නැත | 171 | 23.6 |
| **මාතර** | **97** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම | 5 | 5.2 |
| පියා පමණක් | 16 | 16.5 |
| මව පමණක් | 42 | 43.3 |
| වෙනත් පුද්ගලයෙක් | 12 | 12.4 |
| භාරකරුවෙක් නැත | 22 | 22.7 |
| **හම්බන්තොට** | **99** | **100** |
| දෙමව්පියන් දෙදෙනාම | 8 | 8.1 |
| පියා පමණක් | 20 | 20.2 |
| මව පමණක් | 29 | 29.3 |
| වෙනත් පුද්ගලයෙක් | 18 | 18.2 |
| භාරකරුවෙක් නැත | 24 | 24.2 |

රූප සටහන 4.12
වර්තමාන භාරකාරිත්වයේ ස්වභාවය අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් අතරින් 62% (572) කගේ පමණ දෙමව්පියන් දෙදෙනාම හෝ එක් අයෙක් වර්තමානයේ භාරකරුවන් ලෙස ඉදිරිපත්ව ඇති බව වාර්තා වී ඇත. මෙම ළමුන්ගෙන් 23.6% , එනම් 217 දෙනෙක් වෙනුවෙන් වර්තමානයේ කිසිදු භාරකරුවෙක් ඉදිරිපත්ව නොතිබීම පිළිබඳව වගකිව යුතු අංශ විසින් අවධානය යොමු කළ යුතුව ඇත.

**වගුව 4.41 පියාගේ වර්තමාන තොරතුරු අනුව ආයතනගත ළමුන්**

| පියාගේ වර්තමාන තොරතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **පියාගේ විවාහක තත්ත්වය** | | |
| අවිවාහක | 5 | 0.8 |
| ළමයාගේ මව සමග විවාහක | 157 | 26.0 |
| ළමයාගේ මව නොවන වෙනත් අයෙකු සමග විවාහක | 51 | 8.4 |
| වැන්දඹු/ දික්කසාද වූ/ වෙන් වූ | 84 | 13.9 |
| නොදනී | 307 | 50.7 |
| සඳහන් නොකළ | 1 | 0.2 |
| **පියා බන්ධනාගාරගත වී සිටින/ විදේශගත වී සිටින අයෙක් ද යන වග** | | |
| බන්ධනාගාරගත වී සිටින අයෙක් | 24 | 4.0 |
| විදේශගත වී සිටින අයෙක් | 3 | 0.5 |
| බන්ධනාගාරගත වී හෝ විදේශගත වී සිටින අයෙක් නොවේ | 329 | 54.4 |
| ඒ පිළිබඳව නොදනී | 249 | 41.2 |
| **පියාට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබේ ද යන වග** | | |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් ඇත | 171 | 28.3 |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් නැත | 96 | 15.9 |
| නොදනී | 338 | 55.9 |
| **පියාගේ සෞඛ්‍ය තත්ත්වය** | | |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසු වේ | 24 | 4.0 |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයක් නැත | 258 | 42.6 |
| නොදනී | 323 | 53.4 |
| **පියා ළමයා බැලීමට ආයතනයට පැමිණෙන කාල පරාසය** | | |
| මාසයකට කිහිප වරක් | 10 | 1.7 |
| මාසයකට වරක් පමණ | 70 | 11.6 |
| වසරකට කිහිප වරක් | 117 | 19.3 |
| වසර කිහිපයකට වරක් | 28 | 4.6 |
| එක් වරක් පමණක් පැමිණ ඇත | 47 | 7.8 |
| මෙතෙක් හමුවීමට පැමිණ නැත | 333 | 55.0 |
| **එකතුව** | **605** | **100** |

සංගණනය පවත්වන අවස්ථාව වන විට පියා භාරකරුවකු ලෙස ඉදිරිපත්ව ඇත්තේ ළමුන් 246 දෙනෙකුගේ පමණක් වුව ද ඒ වන විට ළමුන් 605 දෙනෙකුගේ පියා ජීවතුන් අතර සිටින බවට වාර්තා වී ඇති බැවින් එම ළමුන් සම්බන්ධයෙන් පියා පිළිබඳව මූලික තොරතුරු එක්රැස් කරගැනීමක් සිදු කරන ලදී. ඒ අනුව පියාගේ වර්තමාන විවාහක තත්ත්වය සැලකීමේදී ළමුන්ගෙන් 157 දෙනෙකුගේ පමණක් පියවරුන් ළමයාගේ මව සමග විවාහක බව වාර්තා වී ඇති අතර ළමයාගේ මව නොවන වෙනත් අයෙකු සමග විවාහකව ඇත්තේ ළමුන්ගෙන් 51 දෙනෙකුගේ පියවරුන් පමණි.

සංගණනය පවත්වන අවස්ථාව වන විට මෙම ළමුන්ගෙන් 24 දෙනෙකුගේ පියවරුන් බන්ධනාගාරගතව සිට ඇති බවත්, 3 දෙනෙකුගේ පමණක් පියා විදේශගතව සිට ඇති බවත් වාර්තා වී ඇත. එසේම සංගණනය පවත්වන අවස්ථාව වන විට පියාට රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් තිබුනේ ද යන්න විමසා බැලීමේදී රැකියාවක් හෝ ස්ථිර ආදායම් මාර්ගයක් ඇති බව වාර්තා වී ඇත්තේ 171 දෙනෙකුගේ පියවරුන්ට පමණක් වන අතර තවත් 96 දෙනෙකුගේ පියවරුන්ට රැකියාවක් හෝ කිසිදු ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බව වාර්තා වී ඇත. මෙසේ වුව ද ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවන බව වාර්තා වී ඇත්තේ ළමුන්ගෙන් 24 දෙනෙකුගේ පියවරුන් පමණි. ළමුන්ගෙන් 258 දෙනෙකුගේ පියවරුන් ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසු නොවන බවත් වාර්තා වී ඇත. සංගණන අවස්ථාව වන විට මෙම ළමුන්ගෙන් 605 දෙනෙකුගේ පියවරුන් ජීවත්ව සිටින බව වාර්තා වී තිබුණ ද ඒ අතරින් 333 දෙනෙකුගේ පියවරුන් කිසිම දිනක සිය දරුවන් හමුවීමට ආයතනයට පැමිණ නැති බව වාර්තා වීම කණගාටුවට කරුණකි. අනෙකුත් ළමුන්ගේ පියවරුන් අවම වශයෙන් එක් වරක් හෝ ළමයා හමුවීමට ආයතනයට පැමිණ ඇති බව වාර්තා වී ඇත. මේ අතරින් ද අවම වශයෙන් මසකට වරක් හෝ ළමයා හමුවීමට පැමිණ ඇත්තේ ළමුන්ගෙන් 80 දෙනෙකුගේ පියවරුන් පමණි.

සංගණනය පවත්වන අවස්ථාව වන විට මව භාරකරුවකු ලෙස ඉදිරිපත්ව ඇත්තේ ළමුන් 418 දෙනෙකුගේ පමණක් වුව ද ඒ වන විට ළමුන් 765 දෙනෙකුගේ මව ජීවතුන් අතර සිටින බවට වාර්තා වී ඇති බැවින් එම ළමුන් සම්බන්ධයෙන් මව පිළිබඳව මූලික තොරතුරු එක්රැස් කරගැනීමක් සිදු කරන ලදී. මවගේ වර්තමාන විවාහක තත්ත්වය සැලකීමේදී ළමුන්ගෙන් 157 දෙනෙකුගේ මව්වරුන් ළමයාගේ පියා සමග විවාහක බව වාර්තා වී ඇති අතර ළමයාගේ පියා නොවන වෙනත් අයෙකු සමග විවාහකව ඇත්තේ ළමුන්ගෙන් 111 දෙනෙකුගේ මව්වරුන් පමණි.

සංගණනය පවත්වන අවස්ථාව වන විට මෙම ළමුන්ගෙන් 7 දෙනෙකුගේ මව බන්ධනාගාරගතව සිට ඇති බවත්, 42 දෙනෙකුගේ මව විදේශගතව සිට ඇති බවත් වාර්තා වී ඇත. එසේම සංගණනය

### වගුව 4.42 මවගේ වර්තමාන තොරතුරු අනුව ආයතනගත ළමුන්

| මවගේ වර්තමාන තොරතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **මවගේ වර්තමාන විවාහක තත්ත්වය** | | |
| අවිවාහක | 49 | 6.4 |
| ළමයාගේ පියා සමග විවාහක | 157 | 20.5 |
| ළමයාගේ පියා නොවන වෙනත් අයෙකු සමග විවාහක | 111 | 14.5 |
| වැන්දඹු/ දික්කසාද වූ/ වෙන් වූ | 119 | 15.6 |
| නොදනී | 329 | 43.0 |
| **මව බන්ධනාගාරගත වී සිටින/ විදේශගත වී සිටින අයෙක් ද යන වග** | | |
| බන්ධනාගාරගත වී සිටින අයෙක් | 7 | 0.9 |
| විදේශගත වී සිටින අයෙක් | 42 | 5.5 |
| බන්ධනාගාරගත වී හෝ විදේශගත වී සිටින අයෙක් නොවේ | 470 | 61.4 |
| ඒ පිළිබඳව නොදනී | 246 | 32.2 |
| **මවට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් තිබේ ද යන වග** | | |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් ඇත | 154 | 20.1 |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් නැත | 263 | 34.4 |
| නොදනී | 348 | 45.5 |
| **මවගේ සෞඛ්‍ය තත්ත්වය** | | |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසු වේ | 68 | 8.9 |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයක් නැත | 394 | 51.5 |
| නොදනී | 303 | 39.6 |
| **මව ළමයා බැලීමට ආයතනයට පැමිණෙන කාල පරාසය** | | |
| මාසයකට කිහිප වරක් | 15 | 2.0 |
| මාසයකට වරක් පමණ | 97 | 12.7 |
| වසරකට කිහිප වරක් | 212 | 27.7 |
| වසර කිහිපයකට වරක් | 55 | 7.2 |
| එක් වරක් පමණක් පැමිණ ඇත | 76 | 9.9 |
| මෙතෙක් හමුවීමට පැමිණ නැත | 310 | 40.5 |
| **එකතුව** | **765** | **100** |

පවත්වන අවස්ථාව වන විට මවට රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් තිබුනේ ද යන්න විමසා බැලීමේදී රැකියාවක් හෝ ස්ථිර ආදායම් මාර්ගයක් ඇති බව වාර්තා වී ඇත්තේ ළමුන් 154කගේ මව්වරුන්ට පමණක් වන අතර ළමුන් 263කගේ මව්වරුන්ට රැකියාවක් හෝ කිසිදු ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බව වාර්තා වී ඇත. මෙසේ වුව ද ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසුවන බව වාර්තා වී ඇත්තේ ළමුන්ගෙන් 68 දෙනෙකුගේ මව්වරුන් පමණි. ළමයින්ගෙන් 394 දෙනෙකුගේ මව්වරුන් ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසු නොවන බවත් වාර්තා වී ඇත. සංගණන අවස්ථාව වන විට මෙම ළමුන්ගෙන් 765 දෙනෙකුගේ මව්වරුන් ජීවත්ව සිටින බව වාර්තා වී තිබුණ ද ඒ අතරින් 310 දෙනෙකුගේ මව්වරුන්

කිසිම දිනක සිය දරුවන් හමුවීමට ආයතනයට පැමිණ නැති බව වාර්තා වීම කණගාටුවට කරුණකි. අනෙකුත් ළමුන්ගේ මව්වරුන් අතරින් බහුතරය අවම වශයෙන් එක්වරක් හෝ ළමයා හමුවීමට ආයතනයට පැමිණ ඇති බව වාර්තා වී ඇති අතර මේ අතරින් ද අවම වශයෙන් මසකට වරක් හෝ ළමයා හමුවීමට පැමිණ ඇත්තේ ළමුන්ගෙන් 112 දෙනෙකුගේ මව්වරුන් පමණි.

### වගුව 4.43 වර්තමානයේ මව/ පියා නොවන වෙනත් භාරකරුවෙක් සිටින ආයතනගත ළමුන් භාරකරුගේ තොරතුරු අනුව

| භාරකරුගේ වර්තමාන තොරතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| **භාරකරුගේ වයස** | | |
| 18-64 | 60 | 45.5 |
| 65 හා ඊට වැඩි | 14 | 10.6 |
| නොදනී | 58 | 43.9 |
| **ළමයා භාරකරුට ඇති ඥාතිත්වය** | | |
| සීයා | 8 | 6.1 |
| ආච්චි | 51 | 38.6 |
| මාමා | 5 | 3.8 |
| නැන්දා | 33 | 25.0 |
| සහෝදරයා/ සහෝදරිය | 21 | 15.9 |
| සුළු පියා/ සුළු මව | 5 | 3.8 |
| වෙනත් ඥාති | 6 | 4.5 |
| ඥාති ද යන්න සඳහන් නොකළ | 3 | 2.3 |
| **භාරකරුගේ විවාහක තත්ත්වය** | | |
| අවිවාහක | 12 | 9.1 |
| විවාහක | 75 | 56.8 |
| වැන්දඹු/ දික්කසාද වූ/ වෙන් වූ | 17 | 12.9 |
| නොදනී | 28 | 21.2 |
| **භාරකරුගෙන් යැපෙන දරුවන් සංඛ්‍යාව** | | |
| යැපෙන දරුවන් නැත | 86 | 65.2 |
| එක් දරුවෙක් පමණි | 12 | 9.1 |
| දරුවන් 2 | 22 | 16.7 |
| දරුවන් 3 | 4 | 3.0 |
| දරුවන් 4 | 2 | 1.5 |
| දරුවන් 5 හෝ ඊට වැඩි | 6 | 4.5 |
| **භාරකරුට රැකියාවක්/ස්ථිර ආදායම් මාර්ගයක් තිබේ ද යන වග** | | |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් ඇත | 33 | 25.0 |
| රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් නැත | 60 | 45.5 |
| නොදනී | 39 | 29.5 |
| **භාරකරුගේ සෞඛ්‍ය තත්ත්වය** | | |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයකින් පසු වේ | 13 | 9.8 |
| ආදායම් ඉපැයීමක් කළ නොහැකි ලෙස රෝගී/ ආබාධිත තත්ත්වයක් නැත | 74 | 56.1 |
| නොදනී | 45 | 34.1 |
| **භාරකරු ළමයා බැලීමට ආයතනයට පැමිණෙන කාල පරාසය** | | |
| මාසයකට කිහිප වරක් | 5 | 3.8 |
| මාසයකට වරක් පමණ | 18 | 13.6 |
| වසරකට කිහිප වරක් | 58 | 43.9 |
| වසර කිහිපයකට වරක් | 16 | 12.1 |
| එක් වරක් පමණක් පැමිණ ඇත | 19 | 14.4 |
| මෙතෙක් හමුවීමට පැමිණ නැත | 16 | 12.1 |
| **එකතුව** | **132** | **100** |

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන්ගෙන් 132 දෙනෙකුගේ, එනම් 14%ක පමණ සංගණන අවස්ථාව වන විට භාරකාරිත්වය දරනු ලැබ ඇත්තේ මව/ පියා නොවන වෙනත් පාර්ශ්වයක් විසින් බව වාර්තා වී ඇත. එම භාරකාරිත්වය ළමයාට ඇති ඥාතිත්වය අනුව සලකා බැලීමේදී එකී ළමුන්ගෙන් 51 දෙනෙකුගේ භාරකාරිත්වය දරන්නේ ළමයාගේ ආච්චි විසින් බව වාර්තා වී ඇත. මීට අමතරව ළමුන් 33 දෙනෙකුගේ භාරකාරිත්වය දරන්නේ මවගේ/ පියාගේ සහෝදරිය (නැන්දා) විසින් බව ද වාර්තා වී ඇත.

භාරකරුගේ වයස පිළිබඳ අවධානය යොමු කිරීමේදී ළමුන්ගෙන් වැඩි පිරිසකගේ (60 දෙනෙකුගේ) භාරකරුවන් අවුරුදු 18-64 අතර වයස් කාණ්ඩය තුළ පසුවන්නන් බව වාර්තා වී ඇති අතර ළමුන් 14 දෙනෙකුගේ භාරකරු අවුරුදු 65 හා ඊට වැඩි අයකු බව වාර්තා වී ඇත. භාරකරුගේ විවාහක තත්ත්වය සැලකීමේදී මෙම ළමුන්ගෙන් අඩකට වැඩි පිරිසකගේ භාරකරුවන් විවාහක අය බව වාර්තා වී ඇති අතර ළමුන් 12 දෙනෙකුගේ භාරකරුවන් අවිවාහක බව ද වාර්තා වී ඇත. සංගණන අවස්ථාව වන විට භාරකරුවකුගේ රැකවරණය යටතේ සිට ඇති ළමුන්ගෙන් 45% දෙනෙකුගේ භාරකරුවන්හට රැකියාවක්/ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බව වාර්තා වී ඇති අතර කිසියම් ආදායම් මාර්ගයක් තිබූ බව වාර්තා වී ඇත්තේ මෙම ළමුන්ගෙන් 33 දෙනෙකුගේ භාරකරුවන්ට පමණි. භාරකරුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව විමසා බැලීමේදී ළමුන් 13 දෙනෙකුගේ පමණ භාරකරුවන් ඒ වන විට ආදායමක් ඉපැයිය නොහැකි සේ රෝගී හෝ ආබාධිත තත්ත්වයකින් පසුවෙමින් සිට ඇති බව වාර්තා වී ඇත. කෙසේ වුව ද ළමුන්ගෙන් 74 දෙනෙකුගේ භාරකරුවන් ආදායම් ඉපැයීමේ කාර්යයට බලපෑමක් සිදුවන ආකාරයේ කිසිදු රෝගී/ ආබාධිත තත්ත්වයකින් පෙලෙමින් නොසිටි බව වාර්තා වී ඇත. මෙම දරුවන්ට අමතරව මෙම භාරකරුවන්ගෙන් යැපෙන වෙනත් දරුවන් සිටීද යන්න විමසීමේදී මෙම ළමුන්ගෙන් 86 දෙනෙකුගේ

භාරකරුවන්ට ඔවුන්ගෙන් යැපෙන වෙනත් දරුවන් නොමැති බව ද, 12 දෙනෙකුගේ භාරකරුවන්ට එක් දරුවෙක් පමණක් සිටින බව ද වාර්තා වී ඇත. භාරකරු මත යැපෙන දරුවන් 4 දෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින බව වාර්තා වී ඇත්තේ ළමුන්ගෙන් 8 දෙනෙකුගේ භාරකරුවන්ට පමණි. මෙම ළමුන්ගෙන් 23 දෙනෙකුගේ භාරකරුවන් අවම වශයෙන් මසකට වරක් හෝ ළමයා බැලීම සඳහා ආයතනයට පැමිණෙන බවත්, ළමුන් 16 දෙනෙකුගේ භාරකරුවන් එක් වරක් හෝ ළමයා හමුවීමට ආයතනයට පැමිණ නැති බවත් වාර්තා වී ඇත.

## 4.6 ළමුන්ගේ සහෝදර/ සහෝදරියන් පිළිබඳ තොරතුරු


ආයතනගතව සිටින ළමුන්ගේ පවුල් පසුබිම පිළිබඳව විමසා බැලීමේදී එම ළමුන්ට තවත් සහෝදර/ සහෝදරියන් සිටීද යන්න හා එසේ සිටී නම් ඔවුන් සිටින්නේ කුමන ස්ථානවල ද යන්න පිළිබඳව තොරතුරු ලබා ගැනීම වැදගත් වේ. එම නිසා මෙම සංගණනයේදී ළමුන්ගේ සහෝදර/ සහෝරියන් පිළිබඳව තොරතුරු ද එක්රැස් කරන ලදී.

**වගුව 4.44 ළමයාට සිටින සහෝදර/ සහෝදරියන් සංඛ්‍යාව අනුව ආයතනගත ළමුන්**

| සහෝදර/ සහෝදරියන් සංඛ්‍යාව | සංඛ්‍යාව | % |
|---|---|---|
| සහෝදර/ සහෝදරියන් 1 | 243 | 26.4 |
| සහෝදර/ සහෝදරියන් 2 | 216 | 23.5 |
| සහෝදර/ සහෝදරියන් 3 | 118 | 12.8 |
| සහෝදර/ සහෝදරියන් 4 | 55 | 6.0 |
| සහෝදර/ සහෝදරියන් 5 | 19 | 2.1 |
| සහෝදර/ සහෝදරියන් 6 හෝ ඊට වැඩි | 20 | 2.2 |
| සහෝදර/ සහෝදරියන් නැත | 141 | 15.3 |
| සහෝදර/ සහෝදරියන් සිටී ද යන්න නොදනී | 109 | 11.8 |
| **එකතුව** | **921** | **100** |

ළමයාට ඇති සහෝදර සහෝදරියන් සංඛ්‍යාව පිළිබඳව විමසීමේදී දකුණු පළාත තුළ ආයතනගත ළමුන්ගෙන් 921 අතරින් 141 දෙනෙකුට සහෝදර/ සහෝදරියන් කිසිවෙක් නොමැති බව වාර්තා වී ඇති අතර 671 දෙනෙකුට අවම වශයෙන් එක් සහෝදරයෙක් හෝ සහෝදරියක් සිටින බව වාර්තා වී ඇත. දකුණු පළාත් තුළ ආයතනගත ළමුන්ගෙන් අඩකට පමණ සිටින්නේ සහෝදර සහෝදරියන් එක් අයෙක් හෝ දෙදෙනෙක් පමණි.

රූප සටහන 4.13
ළමයාට සිටින සහෝදර/ සහෝදරියන් සංඛ්‍යාව අනුව ආයතනගත ළමුන්




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

**වගුව 4.45 සහෝදර/ සහෝදරියන් සිටින ආයතනගත ළමුන් එම සහෝදර/ සහෝදරියන් දැනට ජීවත්වන ස්ථානය අනුව**

| සහෝදර/ සහෝදරියන් දැනට ජීවත්වන ස්ථානය | සංඛ්‍යාව | % |
|---|---|---|
| සහෝදර/ සහෝදරියන් සියලුදෙනාම මෙම ආයතනයේ ම ජීවත්වේ | 158 | 23.6 |
| සහෝදර/ සහෝදරියන් සියලුදෙනාම වෙනත් ආයතනයක/ආයතනවල ජීවත්වේ | 55 | 8.2 |
| සහෝදර/ සහෝදරියන් සියලුදෙනාම මව/ පියා/ භාරකරු සමග ජීවත්වේ | 213 | 31.7 |
| සහෝදර/ සහෝදරියන් සියලුදෙනාම වෙනත් ස්ථානයක ජීවත්වේ | 3 | 0.5 |
| සහෝදර/ සහෝදරියන් සියලුදෙනාම මෙම ආයතනයේ හා වෙනත් ආයතනවල ජීවත්වේ | 27 | 4.0 |
| සහෝදර/ සහෝදරියන් සියලුදෙනාම මෙම ආයතනයේ හා මව/ පියා/ භාරකරු සමග ජීවත්වේ | 73 | 10.9 |
| සහෝදරයෙක්/ සහෝදරියක් එක් අයෙක් හෝ ආයතනගතව සිටින අතර අන් අය මව/ පියා භාරකරු සමග හෝ වෙනත් ස්ථානයක ජීවත් වේ. | 57 | 8.5 |
| සහෝදර/ සහෝදරියන් එක් අයෙක් හෝ මව/ පියා භාරකරු සමග ජීවත්වන අතර අන් අය වෙනත් ස්ථානයක (ආයතනගත නොවන) ජීවත් වේ හෝ ජීවත් වන ස්ථානය නොදනී | 19 | 2.8 |
| සහෝදර/ සහෝදරියන් ජීවත්වන ස්ථානය නොදනී | 66 | 9.8 |
| **එකතුව** | **671** | **100** |

අවම වශයෙන් එක් සහෝදරයෙක්/ සහෝදරියක් සිටින බව සඳහන්ව ඇති ළමුන් 671 දෙනාගේ සහෝදර/ සහෝදරියන් පදිංචිව සිටින ස්ථානය පිළිබඳව තොරතුරු විමසීමේදී මෙම ළමුන් අතරින් 240 දෙනෙකුගේ සහෝදර/ සහෝදරියන් සියලු දෙනාම ආයතනගතව ජීවත්වන බව වාර්තා වී තිබීම සැලකිල්ලට බඳුන් විය යුතු කරුණක් ලෙස සඳහන් කළ හැකිය. එසේම මෙම ළමුන්ගෙන් 55%කගේ පමණ අවම වශයෙන් එක් සහෝදරයෙක්/ සහෝදරියක් ආයතනගතව ජීවත්වන බව සංගණන දත්ත මගින් පිළිඹිබු වේ.

## 4.7 ළමුන් සමාජගත කිරීම පිළිබඳ තොරතුරු

එක්සත් ජාතීන්ගේ විකල්ප රැකවරණ මාර්ගෝපදේශය අනුව ළමයකු ආයතනගතව රඳවා තිබීම නිර්දේශිත ක්‍රමයක් නොවන අතර ළමයකු සඳහා පවුල් පාදක රැකවරණයක් (Family base care) හෝ පවුලක් වැනි (Family like care) රැකවරණයක් ලබා දිය යුතු බව නිර්දේශ කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ආයතනගත කිරීම නිර්දේශිත ක්‍රමයක් නොවන බැවින් ළමුන් ආයතනික පරිසරයෙන් මුදවා කිසියම් ආකාරයකින් බාහිර පරිසරය වෙත යොමුකිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් හඳුනාගත යුතුව ඇත. ඒ අනුව ආයතනගත ළමුන් සමාජගත කිරීම සඳහා මේ වන විට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සිදුකරගෙන යනු ලබන ක්‍රමවේදයේ ශක්තීන් හා දුර්වලතා හඳුනාගැනීමත්, සමාජගත කළ නොහැකි වීමට හේතු හඳුනාගැනීමත් සඳහා මෙම සංගණනයේදී සමාජගත කිරීම පිළිබඳ දීර්ඝ වශයෙන් තොරතුරු රැස්කරන ලදී.

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් 921 දෙනා අතරින් 655 දෙනෙකු සමාජගත කිරීම සඳහා කිසිඳු උත්සාහයක් දරා නොමැති බව හඳුනාගෙන ඇත. මෙය ප්‍රතිශතයක් ලෙස සැලකූ විට මුළු ළමුන්ගෙන් 71% ක් වේ. සමාජගත කිරීම සඳහා කිසියම් උත්සාහයක් දරා ඇත්තේ ළමුන් 246 දෙනෙකු සඳහා පමණි. එය මුළු ළමයින්ගෙන් 1/4ක් පමණ වේ. ගැහැණු ළමුන්ගෙන් 26.5% සමාජගත කිරීම සඳහා කෙදිනක හෝ කිසියම් උත්සාහයක් දරා ඇති අතර පිරිමි ළමුන් සඳහා මෙම ප්‍රතිශතය 27.2% කි.

වගුව 4.46 ස්ත්‍රී/ පුරුෂ භාවය, වයස් කාණ්ඩය හා ළමයා සමාජගත කිරීම සඳහා කෙදිනක හෝ කිසියම් උත්සාහයක් දරා තිබේද යන්න අනුව ආයතනගතව සිටින ළමුන්

| වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය | එකතුව | | උත්සාහයක් දරා ඇත | | උත්සාහයක් දරා නැත | | අදාළ නැත | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **පුරුෂ** | **324** | **100** | **88** | **27.2** | **236** | **72.8** | **-** | **-** |
| 0-4 | 36 | 100 | 11 | 30.6 | 25 | 69.4 | - | - |
| 5-9 | 67 | 100 | 17 | 25.4 | 50 | 74.6 | - | - |
| 10-14 | 124 | 100 | 29 | 23.4 | 95 | 76.6 | - | - |
| 15+ | 97 | 100 | 31 | 32.0 | 66 | 68.0 | - | - |
| **ස්ත්‍රී** | **597** | **100** | **158** | **26.5** | **419** | **70.2** | **20** | **3.4** |
| 0-4 | 32 | 100 | 11 | 34.4 | 21 | 65.6 | - | - |
| 5-9 | 91 | 100 | 26 | 28.6 | 62 | 68.1 | 3 | 3.3 |
| 10-14 | 221 | 100 | 50 | 22.6 | 159 | 71.9 | 12 | 5.4 |
| 15+ | 253 | 100 | 71 | 28.1 | 177 | 70.0 | 5 | 2.0 |
| **එකතුව** | **921** | **100** | **246** | **26.7** | **655** | **71.1** | **20** | **2.2** |
| 0-4 | 68 | 100 | 22 | 32.4 | 46 | 67.6 | - | - |
| 5-9 | 158 | 100 | 43 | 27.2 | 112 | 70.9 | 3 | 1.9 |
| 10-14 | 345 | 100 | 79 | 22.9 | 254 | 73.6 | 12 | 3.5 |
| 15+ | 350 | 100 | 102 | 11.1 | 243 | 69.4 | 5 | 1.4 |

**වගුව 4.47 සමාජගත කිරීම සඳහා උත්සාහ කරන ලද ආයතනගත ළමුන් සමාජගත කිරීමට මෙතෙක් කරන ලද/ මේ වන විට කරමින් පවතින උත්සාහයන් හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව**

| දරා ඇති උත්සාහය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පියාට/ මවට නැවත භාරදීමට උත්සාහ කිරීම | 150 | 61.0 | 45 | 51.1 | 105 | 63.3 |
| ඥාති/ ඥාති නොවන පාර්ශ්වයකට භාර දීමට උත්සාහ කිරීම | 41 | 16.7 | 16 | 18.2 | 25 | 15.1 |
| හදාවඩා ගැනීම සඳහා දේශීය පාර්ශ්වයක් වෙත භාර දීමට උත්සාහ කිරීම | 53 | 21.5 | 26 | 29.5 | 27 | 16.3 |
| හදාවඩා ගැනීම සඳහා විදේශීය පාර්ශ්වයක් වෙත භාර දීමට උත්සාහ කිරීම | 2 | 0.8 | 2 | 2.3 | - | - |
| සේවාස්ථ පුහුණුවකට/ රැකියාවකට/ ස්වයං රැකියාවකට යොමු කිරීම සඳහා උත්සාහ කිරීම | 11 | 4.5 | 2 | 2.3 | 9 | 5.4 |
| **සමාජගත කිරීම සඳහා උත්සාහයක් දරා ඇති ළමයින් සංඛ්‍යාව** | **246** | **-** | **88** | **-** | **158** | **-** |

සටහන: ඇතැම් ළමයින් සමාජගත කිරීම සඳහා උත්සාහයන් කිහිපයක් ඇති බැවින් සමාජගත කිරීම සඳහා උත්සාහයක් දරා ඇති ළමයින් සංඛ්‍යාවේ එකතුවට සමාන නොවේ

සමාජගත කිරීම සඳහා කෙදිනක හෝ කිසියම් උත්සාහයක් දරා ඇති ළමුන් සමාජගත කිරීම සඳහා දරන ලද උත්සාහයන් සලකා බැලීමේදී වැඩිම ළමුන් සංඛ්‍යාවක් (150) පියාට/ මවට නැවත භාරදීමට උත්සාහ දරා ඇති බව වාර්තා වී ඇත. ප්‍රතිශතයක් ලෙස සලකා බැලූ විට එය සමාජගත කිරීම සඳහා කිසියම් උත්සාහයක් දරා ඇති ළමුන් සංඛ්‍යාවෙන් 61% පමණ වේ. එසේම ළමුන් 41 දෙනෙකු ඥාති හෝ ඥාති නොවන පාර්ශ්වයක් වෙත භාර දීමට උත්සාහ දරා ඇති බව ද, 53 දෙනෙකු හදාවඩා ගැනීම සඳහා දේශීය පාර්ශ්වයක් වෙත භාර දීමට උත්සාහ දරා ඇති බව ද, 11 දෙනෙකු සේවාස්ථ පුහුණුවකට/ රැකියාවකට/ ස්වයං රැකියාවකට යොමු කිරීම මගින් සමාජගත කිරීම සඳහා උත්සාහ දරා ඇති බව ද වාර්තා වී ඇත.

**වගුව 4.48 සමාජගත කිරීම සඳහා උත්සාහ නොකරන ලද ආයතනගත ළමුන් එසේ නොකිරීමට හේතුව/හේතු හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව**

| උත්සාහ නොකිරීමට හේතුව | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| නිවාසගත කිරීමට අනුමත කළ/ නියෝග කළ කාල සීමාව ඉක්මවා නොතිබීම | 158 | 24.1 | 53 | 22.5 | 105 | 25.1 |
| නිවාසගත වීමෙන් අනතුරුව සමාජගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ගත නොවීම | 115 | 17.6 | 61 | 25.8 | 54 | 12.9 |
| පියාගේ සහ මවගේ තොරතුරු සොයමින් සිටීම | 41 | 6.3 | 22 | 9.3 | 19 | 4.5 |
| මව/ පියා/ භාරකරුවන්ගේ කැමැත්ත ලබා නොදීම | 158 | 24.1 | 45 | 19.1 | 113 | 27.0 |
| ළමයාගේ සෞඛ්‍ය ගැටලු | 26 | 4.0 | 18 | 7.6 | 8 | 1.9 |
| මව/ පියා/ භාරකරුගේ සෞඛ්‍ය ගැටලු | 7 | 1.1 | 3 | 1.3 | 4 | 1.0 |
| නීතිමය බාධාවන් | 102 | 15.6 | 48 | 20.3 | 54 | 12.9 |
| පරිපාලනමය හේතු | 4 | 0.6 | 2 | 0.8 | 2 | 0.5 |
| ආරක්ෂිතම ස්ථානය මෙම ස්ථානය වීම | 245 | 37.4 | 54 | 22.9 | 191 | 45.6 |
| ළමයා ඉගෙනීම් කටයුතු සිදු කරමින් සිටීම | 28 | 4.3 | - | - | 28 | 6.7 |
| වෙනත් | 3 | 0.5 | 1 | 0.4 | 2 | 0.5 |
| **සමාජගත කිරීම සඳහා උත්සාහයක් දරා නැති ළමයින් සංඛ්‍යාව** | **655** | **-** | **236** | **-** | **419** | **-** |

සටහන: ඇතැම් ළමයින් සමාජගත කිරීම සඳහා උත්සාහ නොකිරීමට හේතු කිහිපයක් බලපා ඇති බැවින් සමාජගත කිරීම සඳහා උත්සාහයක් දරා නැති ළමයින් සංඛ්‍යාවේ එකතුවට සමාන නොවේ

ඉහත සඳහන් කළ පරිදි දකුණු පළාතේ ආයතනගත ළමුන් අතරින් සමාජගත කිරීම සඳහා කවදා හෝ කිසියම් උත්සාහයක් දරා නොමැති බව වාර්තා වී ඇති ළමුන් 655 දෙනා සමාජගත කිරීම සඳහා කිසිම උත්සාහයක් නොදැරීමට විවිධ හේතු සාධක බලපා ඇති බව සංගණන දත්ත අනුව පැහැදිලි වේ. ඒ අතරින් වැඩි ළමුන් පිරිසක් සමාජගත නොකිරීම සඳහා බලපාන ලද හේතුව ලෙස සඳහන්ව ඇත්තේ ළමයාට ඇති ආරක්ෂිතම ස්ථානය මෙම ආයතනය ලෙස සැලකීම බව සඳහන්ව ඇත. එසේම සමාජගත කිරීම සඳහා මව/ පියා/ භාරකරුවන්ගේ කැමැත්ත ලබා නොදීම, නිවාසගත කිරීමට අනුමත කළ/නියෝග කළ කාල සීමාව ඉක්මවා නොතිබීම, නිවාසගත වීමෙන් අනතුරුව සමාජගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ගත නොවීම හා නීතිමය බාධාවන් ද වැදගත් හේතු ලෙස සඳහන්ව ඇත.

***කුලවැද්දීම***

ආයතනගත ළමයකු සමාජගත කිරීම සඳහා ළමයාගේ පවුලට හෝ ඥාති පාර්ශ්වයකට භාර දිය නොහැකි අවස්ථාවල වෙනත් බාහිර පාර්ශ්වයකට (දේශීය/ විදේශීය) හදා වඩා ගැනීම සඳහා භාරදීම කුලවැද්දීම යනුවෙන් අදහස් කෙරේ. කුලවැද්දීම සඳහා ළමයෙකු දේශීය පාර්ශ්වයක් වෙත යොමු කිරීම පළාත් පරිවාස කොමසාරිස් හරහා සිදු කරනු ලබන අතර විදේශීය පාර්ශ්වයක් වෙත යොමු කිරීම මධ්‍යම රජය යටතේ ඇති පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලැබේ. කුලවැද්දීම සිදු කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය තුළ පළාත් අනුව යම් යම් වෙනස්කම් දැකිය හැකිය. එසේම ළමයාගේ පසුබිම අනුව ද කුලවැද්දීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාවලියේ වෙනස්කම් දැකිය හැකිය.

### වගුව 4.49 කුලවැද්දීමේ ක්‍රියාවලියකට (දේශීය/ විදේශීය) ඇතුළත් කර ඇති ආයතනගත ළමුන් කුලවැද්දීම සඳහා මේ වන විට සිදුකර ඇති/ සිදුකරමින් පවතින ක්‍රියාමාර්ග හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව

| ක්‍රියාමාර්ගය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| මව/ පියා/ භාරකරුගේ එකඟතාව/ දිවුරුම් ප්‍රකාශ ලබා ගැනීම | 21 | 50.0 | 8 | 42.1 | 13 | 56.5 |
| ස්ථාපන කමිටුව/ කුලවැද්දීමේ කමිටුව මගින් කුලවැද්දීමේ නිර්දේශ ලබා ගැනීම | 17 | 40.5 | 10 | 52.6 | 7 | 30.4 |
| කුලවැද්දීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීම | 4 | 9.5 | 1 | 5.3 | 3 | 13.0 |
| කුලවැද්දීමේ ලේඛනයට නම ඇතුළත් කිරීම | 13 | 31.0 | 8 | 42.1 | 5 | 21.7 |
| කුලවැද්දීම සඳහා නම ප්‍රසිද්ධ කිරීම | 2 | 4.8 | 1 | 5.3 | 1 | 4.3 |
| සුදුසු ඉල්ලුම්කරුවකු හඳුනාගැනීම | 3 | 7.1 | 1 | 5.3 | 2 | 8.7 |
| කුලවැද්දුම් නඩුව ගොනු කිරීම/ විභාග වෙමින් පැවතීම | 3 | 7.1 | 1 | 5.3 | 2 | 8.7 |
| **කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර ඇති මුළු ළමුන් සංඛ්‍යාව** | **42** | **-** | **19** | **-** | **23** | **-** |

සටහන: ඇතැම් ළමයින් කුලවැද්දීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන තිබිය හැකි බැවින් කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර ඇති මුළු ළමුන් සංඛ්‍යාවේ එකතුවට සමාන නොවේ.

දකුණු පළාත තුළ ආයතනගත ළමුන් අතරින් සංගණන අවස්ථාව වන විට කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත්ව සිට ඇත්තේ ළමුන් 42 දෙනෙක් පමණි. මෙම ළමුන් 42 දෙනා කුලවැද්දීමේ ක්‍රියාවලියේ විවිධ පියවරයන් සම්පූර්ණ කර ඇති ආකාරය වගුව 4.49 මගින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ළමුන් තිදෙනෙක් වෙනුවෙන් කුලවැද්දීමේ ක්‍රියාවලියේ අවසාන අදියර වන කුලවැද්දීමේ නඩුව ගොනු කිරීම ද සිදු කර ඇති බව සඳහන් කළ හැකිය.

### වගුව 4.50 සමාජගත කිරීම සඳහා උත්සාහ කර ඇති නමුත් කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර නොමැති ළමුන් එයට හේතුව අනුව

| හේතුව | සංඛ්‍යාව | % |
|---|---|---|
| අදාළ වයස ඉක්මවා තිබීම | 58 | 28.4 |
| මව/ පියා/ භාරකරුගේ අකමැත්ත | 99 | 48.5 |
| මව/ පියා/ භාරකරුගේ එකඟතා ප්‍රකාශ මේ වන තුරු නොලැබී තිබීම | 24 | 11.8 |
| මීට පෙර කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර තිබුණ ද එය අසාර්ථක වීම | 4 | 2.0 |
| කුලවැද්දීමට සුදුසු ළමයකු නොවීම | 28 | 13.7 |
| මව/ පියාට/ ඥාතීන්ට/ ඥාතී නොවන පාර්ශ්වයකට භාරදීමට කටයුතු කරමින් සිටීම | 12 | 5.9 |
| **සමාජගත කිරීම සඳහා උත්සාහ කර ඇති නමුත් කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර නොමැති ළමුන් සංඛ්‍යාව** | **204** | **-** |

සටහන: ඇතැම් ළමයින් කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර නොකිරීම සඳහා හේතු කිහිපයක් බලපා තිබිය හැකි බැවින් සමාජගත කිරීම සඳහා උත්සාහ කර ඇති නමුත් කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර නොමැති ළමුන් සංඛ්‍යාවේ එකතුවට සමාන නොවේ

දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් අතරින් කිසියම් කණ්ඩායමක් සමාජගත කිරීම සඳහා කවදා හෝ කිසියම් උත්සාහයක් දරා තිබුන ද ඒ අතරින් සංගණන අවස්ථාව වන විට කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් කර නොමැති ළමුන් සංඛ්‍යාව 204 වේ. මෙම ළමුන් ඒ වන විට කුලවැද්දීමේ ක්‍රියාවලියකට ඇතුළත් නොකිරීමට බලපාන ලද හේතු පිළිබඳව විමසා බැලීමේදී ප්‍රධාන හේතු 6ක් හඳුනාගත හැකි විය. ඒ අතරින් වැඩිම පිරිසක් කුලවැද්දීම සඳහා පියවර ගත නොහැකි වීමට මව/ පියා/ භාරකරුගේ අකමැත්ත හේතු වී ඇති බව අනාවරණය වී ඇත. කුලවැද්දීම සඳහා නිර්දේශිත වයස් සීමාව (අවුරුදු 14ට අඩු වීම) ඉක්මවා තිබීම හේතුවෙන් ද ඇතැම් ළමයින් කුලවැද්දිම සඳහා යොමු කිරීමට නොහැකි වී ඇත.

# 5 වන පරිච්ඡේදය
# කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

ළමුන් වෙත රැකවරණය හා ආරක්ෂාව ලබාදීම මෙන්ම ළමයාගේ ආකල්පමය වර්ධනයක් ඇති කරවමින් මනා ශික්ෂණයකින් යුතුව ළමුන් ගොඩනැංවීම ළමා රැකවරණ මධ්‍යස්ථානයන්හි සේවයේ නිරත කාර්ය මණ්ඩලවල ප්‍රධාන වගකීම වේ. පවුල් පරිසරය තුළ ළමයකු හැදෙන වැඩෙන ආකාරයට සමානව අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසමින් අධ්‍යාපන හා සෞඛ්‍ය මෙන්ම ළමුන් සඳහා සපයා දිය යුතු අනෙකුත් පහසුකම් හා සේවාවන් සපයා දෙමින් කායිකව හා මානසිකව නිරෝගීමත් ළමයකු බාහිර සමාජයට යොමු කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම ද ළමා රැකවරණ මධ්‍යස්ථානයක කාර්ය මණ්ඩලය මගින් බලාපොරොත්තු වන මෙහෙවරක් වේ. ඒ අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය අදාළ සේවාවන් සැපයීම සඳහා ප්‍රමාණවත්වේ ද යන්න හා මෙම කාර්ය භාර්ය ඉටු කිරීම සඳහා අපේක්ෂිත ප්‍රමිතීන්ගෙන් යුක්ත ද යන්න පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම ද මෙම සංගණනයේදී සිදුකරන ලදී.

## 5.1 මූලික තොරතුරු

මේ යටතේ දකුණු පළාත තුළ ළමා රැකවරණ මධ්‍යස්ථානවල මුළු කාර්ය මණ්ඩලය පිළිබඳවත්, වයස හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ඔවුන්ගේ ව්‍යාප්තිය පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.

දකුණු පළාතෙහි එක් එක් දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු ළමා රැකවරණ මධ්‍යස්ථාන තුළ සේවය කරන මුළු කාර්ය මණ්ඩලය ආයතන වර්ගය අනුව වගුව 5.1 මගින් ඉදිරිපත් කර ඇත.

**වගුව 5.1 ආයතන වර්ගය හා දිස්ත්‍රික්කය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය**


| ආයතන වර්ගය | එකතුව | ගාල්ල | මාතර | හම්බන්තොට |
|---|---|---|---|---|
| රැඳවුම් නිවාසය | 8 | 8 | - | - |
| සහතික කළ පාසල | 40 | 40 | - | - |
| රජයේ භාරගැනීමේ ළමා නිවාසය | 34 | 34 | - | - |
| නිවර්තන ළමා නිවාසය | 27 | 27 | - | - |
| ස්වේච්ඡා ළමා නිවාසය | 165 | 117 | 27 | 21 |
| වෙනත් | 20 | - | - | 20 |
| **එකතුව** | **294** | **226** | **27** | **41** |

දකුණු පළාත තුළ ළමා රැකවරණ මධ්‍යස්ථානයන්හි සේවය කරන මුළු කාර්ය මණ්ඩලය 294ක් වන අතර ආයතන වර්ගය අනුව කාර්ය මණ්ඩලය ව්‍යාප්ත වී සිටින ආකාරය විමසීමේදී පළාතේ පිහිටි මුළු ආයතනවලින් 77% නියෝජනය කරන ස්වේච්ඡා ළමා නිවාස තුළ වැඩිම කාර්ය මණ්ඩලයක් වාර්තා වේ. එය මුළු කාර්ය මණ්ඩලයෙන් 56% පමණ වේ. මෙම කාර්ය මණ්ඩලය දකුණු පළාත තුළ දිස්ත්‍රික්ක අතර ව්‍යාප්තව සිටින ආකාරය සැලකීමේදී වැඩිම ළමුන් සංඛ්‍යාවක් වාර්තා වන ගාල්ල දිස්ත්‍රික්කයෙන් වැඩිම සේවක සංඛ්‍යාවක් ද වාර්තා වන බව පෙන්වා දිය හැකි අතර එය අනුපාතයක් ලෙස සැලකූ විට ළමුන් තිදෙනෙක් සඳහා එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු පමණ වේ.

**වගුව 5.2 වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය**

| වයස් කාණ්ඩය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 20 - 24 | 17 | 5.8 | 4 | 4.0 | 13 | 6.7 |
| 25 - 29 | 22 | 7.5 | 11 | 11.1 | 11 | 5.6 |
| 30 - 34 | 34 | 11.6 | 10 | 10.1 | 24 | 12.3 |
| 35 - 39 | 36 | 12.2 | 12 | 12.1 | 24 | 12.3 |
| 40 - 44 | 34 | 11.6 | 13 | 13.1 | 21 | 10.8 |
| 45 - 49 | 37 | 12.6 | 13 | 13.1 | 24 | 12.3 |
| 50 - 54 | 36 | 12.2 | 11 | 11.1 | 25 | 12.8 |
| 55 - 59 | 35 | 11.9 | 13 | 13.1 | 22 | 11.3 |
| 60 - 64 | 24 | 8.2 | 4 | 4.0 | 20 | 10.3 |
| 65 - 69 | 11 | 3.7 | 4 | 4.0 | 7 | 3.6 |
| 70 - 74 | 5 | 1.7 | 1 | 1.0 | 4 | 2.1 |
| 75 හෝ ඊට වැඩි | 3 | 1.0 | 3 | 3.0 | - | - |
| **එකතුව** | **294** | **100** | **99** | **100** | **195** | **100** |

රූප සටහන 5.1
වයස් කාණ්ඩය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ ආයතනයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව සැලකීමේදී 2/3 පමණ කාන්තාවන් වන බවත්, 1/3 පමණ පිරිමින් වන බවත් ඉහත වගුව 5.2 අනුව පැහැදිලි වේ. මෙසේ ඉහළ කාන්තා කාර්ය මණ්ඩලයක් වාර්තා වීමට වැඩි වශයෙන් බලපා ඇත්තේ වැඩි ආයතන සංඛ්‍යාවක් ගැහැණු ළමයින් සඳහා පමණක් වීමත්, මිශ්‍ර ආයතන තුළ ද ගැහැණු ළමුන් වැඩි සංඛ්‍යාවක් රඳවා තිබීමත් හේතුවෙන් එම ආයතන සඳහා කාන්තා කාර්ය මණ්ඩලය වැඩි වශයෙන් යෙදවිය යුතු වීම විය හැකිය.

වයස් කාණ්ඩ හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලයේ ව්‍යාප්තිය සලකා බැලීමේදී අවුරුදු 25-29 වයස් කාණ්ඩ හා 75 හෝ ඊට වැඩි වයස් කාණ්ඩය හැර සෙසු සෑම වයස් කාණ්ඩයක් සඳහා ම ස්ත්‍රී නියෝජනය පුරුෂ නියෝජනයට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බව රූප සටහන 5.1 මගින් පැහැදිලි වේ.

ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල තුළින් මනා පරිණතභාවයක් අපේක්ෂා කරන අතර ඔවුනට ඉතා කාර්යක්ෂමව සේවය සැපයීමේ හැකියාව තිබිය යුතු ය. ඒ අනුව ඉතාමත් තරුණ හා වයස්ගත පුද්ගලයන් ළමා රැකවරණ මධ්‍යස්ථානවල සේවය සඳහා නිර්දේශ කළ නොහැකි වුවත් දකුණු පළාත තුළ පිහිටි ආයතනවල කාර්ය මණ්ඩල තුළ වයස අවුරුදු 60 හෝ ඊට වැඩි සාමාජිකයින් 15% පමණ සිටින බවත්, අවුරුදු 65 හෝ ඊට වැඩි සාමාජිකයින් 6.5% පමණ සිටින බවත් සංගණන තොරතුරු මගින් හෙළි වී තිබේ. එසේම කාර්ය මණ්ඩලයෙන් 13% පමණ වයස අවුරුදු 30ට අඩු බව ද වාර්තා වී ඇත. ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සම්බන්ධයෙන් සැලකීමේදී මෙය එතරම් සුදුසු තත්ත්වයක් නොවන බව අවධාරණය කළ යුතු අතර මේ සඳහා වගකිව යුතු අංශවල අවධානය යොමු විය යුතුව ඇත.

## 5.2 රැකියාව පිළිබඳ තොරතුරු

දකුණු පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයේ ව්‍යාප්තිය තනතුර, සේවා කාලය, රැකියාවේ ස්වභාවය හා සේවයේ නිරතවීමේ ස්වභාවය අනුව සංඛ්‍යාත්මකව ඉදිරිපත් කිරීම මෙහිදී සිදු කෙරේ.

වගුව 5.3 රැකියාව හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය

| රැකියාව | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කම්කරු/ සනීපාරක්ෂක කම්කරු/ කාර්යාල කම්කරු/උද්‍යාන කම්කරු | 43 | 14.6 | 19 | 19.2 | 24 | 12.3 |
| නිවාස මාතා | 30 | 10.2 | - | - | 30 | 15.4 |
| සහකාර වෝඩ්න්/ සහකාර මේට්‍රන්/ උප වෝඩ්න්/ උප මේට්‍රන් | 26 | 8.8 | 1 | 1.0 | 25 | 12.8 |
| අරක්කැමි, මුළුතැන්ගෙයි සේවක/ සේවිකා/ සහය අරක්කැමි | 25 | 8.5 | 7 | 7.1 | 18 | 9.2 |
| ස්ථාන භාර මේට්‍රන්/ ප්‍රධාන පාලිකා/ පාසල්පති/ අධිකාරි | 23 | 7.8 | 2 | 2.0 | 21 | 10.8 |
| මුරකරු/ ආරක්ෂක නිලධාරී | 20 | 6.8 | 19 | 19.2 | 1 | 0.5 |
| ඕවසියර් | 12 | 4.1 | 7 | 7.1 | 5 | 2.6 |
| සහන සේවිකා | 11 | 3.7 | 1 | 1.0 | 10 | 5.1 |
| උපස්ථායක/ සාත්තු සේවිකා | 10 | 3.4 | 4 | 4.0 | 6 | 3.1 |
| වෝඩ්න්/ මේට්‍රන්/ නිවාස පාලක/ නිවාස පාලිකා | 8 | 2.7 | - | - | 8 | 4.1 |
| කළමණාකරු | 8 | 2.7 | 6 | 6.1 | 2 | 1.0 |
| රියදුරු | 7 | 2.4 | 7 | 7.1 | - | - |
| සංවර්ධන නිලධාරී | 7 | 2.4 | 1 | 1.0 | 6 | 3.1 |

| රැකියාව | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ගුරු (පෙර පාසල්/ පුහුණු/ නුපුහුණු) | 6 | 2.0 | 1 | 1.0 | 5 | 2.6 |
| ළමා රැකවල්කරු | 6 | 2.0 | 4 | 4.0 | 2 | 1.0 |
| අධ්‍යාපන උපදේශක | 5 | 1.7 | 1 | 1.0 | 4 | 2.1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර/ ලිපිකරු | 4 | 1.4 | - | - | 4 | 2.1 |
| නිවාසාචාර්ය/ සහකාර නිවාසාචාර්ය | 3 | 1.0 | 1 | 1.0 | 2 | 1.0 |
| වෘත්තීය පුහුණු උපදේශක | 3 | 1.0 | 2 | 2.0 | 1 | 0.5 |
| කාර්යාල කාර්ය සහායක/ කාර්යාල සහායක | 3 | 1.0 | 3 | 3.0 | - | - |
| ගිණුම් සහකාර | 3 | 1.0 | - | - | 3 | 1.5 |
| පෙර පාසල් ගුරු/ පෙර පාසල් පාලිකා සහායක | 3 | 1.0 | - | - | 3 | 1.5 |
| කනිෂ්ඨ සහාය සේවක | 3 | 1.0 | 3 | 3.0 | - | - |
| රෙදි සේදුම්කරු | 2 | 0.7 | - | - | 2 | 1.0 |
| සහකාර නඩත්තු නිලධාරී | 2 | 0.7 | 2 | - | - | - |
| ස්ථානභාර නිලධාරී | 2 | 0.7 | 2 | 2.0 | - | - |
| ජ්‍යෙෂ්ඨ සහය සේවක | 2 | 0.7 | 1 | 1.0 | 1 | 0.5 |
| වෙනත් | 17 | 5.8 | 5 | 5.1 | 12 | 6.2 |
| **එකතුව** | **294** | **100** | **99** | **100** | **195** | **100** |

ඉහත වගුව 5.3 මගින් දකුණු පළාත තුළ ළමා රැකවරණ මධ්‍යස්ථානයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය තනතුරු අනුව ව්‍යාප්තව ඇති ආකාරය පෙන්නුම් කෙරේ.

### වගුව 5.4 සේවා කාලය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය

| සේවා කාලය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **වර්තමාන ආයතනයේ සේවා කාලය** | | | | | | |
| අවු. 1ට අඩු | 67 | 22.8 | 21 | 21.2 | 46 | 23.6 |
| අවු. 1 -4 | 103 | 35.0 | 42 | 42.4 | 61 | 31.3 |
| අවු. 5-9 | 64 | 21.8 | 17 | 17.2 | 47 | 24.1 |
| අවු. 10 හෝ ඊට වැඩි | 55 | 18.7 | 18 | 18.2 | 37 | 19.0 |
| සඳහන් නොකළ | 5 | 1.7 | 1 | 1.0 | 4 | 2.1 |
| **වර්තමාන තනතුරෙහි සේවා කාලය** | | | | | | |
| අවු. 1ට අඩු | 51 | 17.3 | 15 | 15.2 | 36 | 18.5 |
| අවු. 1 -4 | 94 | 32.0 | 35 | 35.4 | 59 | 30.3 |
| අවු. 5-9 | 79 | 26.9 | 23 | 23.2 | 56 | 28.7 |
| අවු. 10 හෝ ඊට වැඩි | 66 | 22.4 | 24 | 24.2 | 42 | 21.5 |
| සඳහන් නොකළ | 4 | 1.4 | 2 | 2.0 | 2 | 1.0 |
| **එකතුව** | **294** | **100** | **99** | **100** | **195** | **100** |

දකුණු පළාත තුළ ළමා රැකවරණ මධ්‍යස්ථානයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය වර්තමානයේ සිටින ආයතනය තුළ සේවය කර ඇති කාල පරිච්ඡේදය සලකා බැලීමේදී මුළු කාර්ය මණ්ඩලයෙන් 19%ක් පමණ අවුරුදු 10ට වැඩි සේවා කාලයක් වාර්තා කර ඇති අතර කාර්ය මණ්ඩලයෙන් 23% පමණ මෙම ආයතනයේ සේවය ආරම්භ කර වයස අවුරුදු 1ට අඩු කාලයක් වාර්තා කර ඇත.

වර්තමාන තනතුරෙහි සේවා කාලය සැලකීමේදී අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක් එම තනතුරෙහි අත්දැකීම් සහිත සේවක සංඛ්‍යාව මුළු සේවක සංඛ්‍යාවෙන් 22%ක් පමණ බව පෙනේ. එසේම සිය තනතුරෙහි වසරකට අඩු අත්දැකීම් සහිත බව වාර්තා කර ඇති සේවක සංඛ්‍යාව මුළු සේවක සංඛ්‍යාවෙන් 17%ක් පමණ වේ.

### වගුව 5.5 රැකියාවේ ස්වභාවය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය

| රැකියාවේ ස්වභාවය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ස්ථිර | 234 | 79.6 | 85 | 85.9 | 149 | 76.4 |
| තාවකාලික/ අනියම් | 36 | 12.2 | 9 | 9.1 | 27 | 13.8 |
| කොන්ත්‍රාත් | 17 | 5.8 | 5 | 5.1 | 12 | 6.2 |
| වෙනත් | 5 | 1.7 | - | - | 5 | 2.6 |
| සඳහන් නොකළ | 2 | 0.7 | - | - | 2 | 1.0 |
| **එකතුව** | **294** | **100** | **99** | **100** | **195** | **100** |

රූප සටහන 5.2
රැකියාවේ ස්වභාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

දකුණු පළාත තුළ ළමා රැකවරණ මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය අතරින් 80%ක් පමණ රැකියා සුරක්ෂිතතාවයකින් යුතු ව සිය රැකියාවේ නියුතු බව වගුව 5.5 මගින් පැහැදිළි වේ. එනම් 294 දෙනෙකු වූ මුළු කාර්ය මණ්ඩලයෙන් 234 දෙනෙකු ම ස්ථිර පදනමින් සේවයේ යෙදෙන්නන් වේ.

### වගුව 5.6 සේවයේ නිරතවීමේ ස්වභාවය හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය

| සේවයේ නිරතවීමේ ස්වභාවය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **නේවාසික/ නේවාසික නොවන** | | | | | | |
| නේවාසික | 122 | 41.5 | 33 | 33.3 | 89 | 45.6 |
| නේවාසික නොවන | 170 | 57.8 | 65 | 65.7 | 105 | 53.8 |
| සඳහන් නොකළ | 2 | 0.7 | 1 | 1.0 | 1 | 0.5 |
| **සේවා මුර/ දෛනික රාජකාරි** | | | | | | |
| සේවා මුර ක්‍රමයට | 91 | 31.0 | 46 | 46.5 | 45 | 23.1 |
| සාමාන්‍ය දෛනික රාජකාරි ක්‍රමයට | 186 | 63.3 | 46 | 46.5 | 140 | 71.8 |
| සඳහන් නොකළ | 17 | 5.8 | 7 | 7.1 | 10 | 5.1 |
| **එකතුව** | **294** | **100** | **99** | **100** | **195** | **100** |

සේවයේ නිරතවීමේ ස්වභාවය අනුව කාර්ය මණ්ඩලයේ තොරතුරු විමසා බැලීමේ දී මුළු සේවක සංඛ්‍යාවෙන් 42%ක් පමණ ආයතන තුළ නේවාසිකව සිය රාජකාරී ඉටු කරනු ලබන අතර වෙනත් ස්ථානවල සිට සේවයට වාර්තා කරනු ලබන පිරිස 58%ක් පමණ වේ.

එසේ ම දකුණු පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයෙන් 63%ක් පමණ සාමාන්‍ය දෛනික රාජකාරි පදනමින් සිය සේවය සපයනු ලබන බව ද, 31% පමණක් සේවා මුර ක්‍රමයට සේවය සපයනු ලබන බව ද මෙම සංගණන තොරතුරු මගින් අනාවරණය වී ඇත.


## 5.3 අධ්‍යාපනය/ වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු

ළමා රැකවරණ මධ්‍යස්ථානයන්හි සේවය කරන කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට එම ආයතනයන්හි නේවාසික ළමුන් පිළිබඳ විශාල වගකීමක් පැවරෙන බැවින් විශේෂයෙන්ම ළමුන් රැකබලාගන්නා පිරිස මනා අධ්‍යාපනයක් ලබා තිබීමත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා අදාළ වන වෘත්තිය පුහුණුවක් ලබා තිබීමත් අතිශයින් වැදගත් වේ. ඒ අනුව මෙම සංගණනය මගින් කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳව ද තොරතුරු එක්රැස් කරන ලදී.

### වගුව 5.7 ඉහළ ම අධ්‍යාපන සුදුසුකම හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය

| ඉහළ ම අධ්‍යාපන සුදුසුකම | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1-5 ශ්‍රේණියක් සමත් | 10 | 3.4 | 7 | 7.1 | 3 | 1.5 |
| 6-10 ශ්‍රේණියක් සමත් | 61 | 20.7 | 22 | 22.2 | 39 | 20.0 |
| අ-පො-ස (සා/පෙළ) සමත් | 76 | 25.9 | 31 | 31.3 | 45 | 23.1 |
| අ-පො-ස (උ/පෙළ) සමත් | 116 | 39.5 | 30 | 30.3 | 86 | 44.1 |
| උපාධි/ පශ්චාත් උපාධි | 29 | 9.9 | 8 | 8.1 | 21 | 10.8 |
| සඳහන් නොකළ | 2 | 0.7 | 1 | 1.0 | 1 | 0.5 |
| **එකතුව** | **294** | **100** | **99** | **100** | **195** | **100** |

රූප සටහන 5.3
ඉහළ ම අධ්‍යාපන සුදුසුකම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව DCS

ළමා රැකවරණ මධ්‍යස්ථානවලට අනුයුක්ත කරගනු ලබන කාර්ය මණ්ඩල විසින් සම්පූර්ණ කර තිබිය යුතු අවම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා වන ප්‍රමිතීන්හි පැහැදිළිව සඳහන් කර ඇත. ඒ අනුව ළමා රැකවරණ මධ්‍යස්ථානයක පාලක/ පාලිකාව අවම වශයෙන් අ. පො. ස. (උ/ පෙළ) විභාගයට පෙනී සිටි අයෙකු විය යුතු අතර සහාය පාලක/ පාලිකාවන් අවම වශයෙන් අ. පො. ස. (සා/ පෙළ) විභාගයෙන් විෂයන් 5ක් සමත්වී තිබිය යුතු වේ. කෙසේ වුව ද දකුණු පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය තුළ අ.පො.ස. (සා/පෙළ) හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත 75% වාර්තා වී තිබීමත්, ඒ අතරින් උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත 10% වාර්තා වී තිබීමත් සතුටට කරුණකි.

### වගුව 5.8 වර්තමාන රැකියාවට අදාළ වන වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම අනුව ළමා රැකවරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය

| වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා ඇති | 91 | 17 | 74 |
| ළමා රැකවරණ ඩිප්ලෝමාව/ පාඨමාලාව | 31 | 7 | 24 |
| මුල් ළමාවිය සංවර්ධන පාඨමාලාව/ පෙර පාසල් පාඨමාලාව/ පෙර පාසල් ඩිප්ලෝමා පාඨමාලාව | 16 | - | 16 |
| තොරතුරු තාක්ෂණ පාඨමාලාව | 11 | 2 | 9 |
| උපදේශන/ මානසික උපදේශන පාඨමාලාව/ ඩිප්ලෝමාව | 2 | 1 | 1 |
| මනෝ විද්‍යාව/ මනෝ විද්‍යා පාඨමාලාව/ඩිප්ලෝමාව | 3 | 1 | 2 |
| ළමා නිවාස පාඨමාලාව | 5 | - | 5 |
| හෙද ඩිප්ලෝමාව/ පාඨමාලාව | 2 | - | 2 |
| ඉංග්‍රීසි පාඨමාලාව | 4 | 1 | 3 |

| වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| සමාජ වැඩ පාඨමාලාව | 2 | 2 | - |
| විදුලි කාර්මික/විදුලි හා ඉලෙක්ට්‍රොනික පාඨමාලාව | 2 | 2 | - |
| මව් තනතුරු පිළිබඳ පාඨමාලාව | 11 | - | 11 |
| ප්‍රජා සංවර්ධනය හා යහපාලනය | 2 | 2 | - |
| AAT | 2 | - | 2 |
| වරලත් ගණකාධිකාරී | 2 | - | 2 |
| ලේඛන ඩිප්ලෝමා | 2 | - | 2 |
| වෙනත් පාඨමාලා | 16 | 2 | 14 |
| වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා නැති | 203 | 82 | 121 |
| **මුළු සේවක සංඛ්‍යාව** | **294** | **99** | **195** |

සටහන: ඇතැම් පුද්ගලයන් එක් සුදුසුකමකට වඩා ලබා ඇති බැවින් එකතුව මුළු සේවක සංඛ්‍යාවට සමාන නොවේ

මෙවැනි සංවේදී රැකියා ක්ෂේත්‍රයක් තුළ සේවාවන් සැපයීමේදී ඒ පිළිබඳ ව නිරන්තර පුහුණුව සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම ඉතා වැදගත් බව සඳහන් කළ යුතු වේ. කෙසේ නමුත් කාර්ය මණ්ඩලය අතරින් වර්තමාන රැකියාවට අදාළ වන වෘත්තීය සුදුසුකම් ලබා ඇති ප්‍රතිශතය 31%ක් පමණ වන අතර එවැනි වෘත්තීය සුදුසුකම් ලබා නොමැති ප්‍රතිශතය 69%ක් පමණ වේ. ඒ අනුව කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය මගපෙන්වීම් ලබා දීමට අවශ්‍ය පාඨමාලා සඳහා තවදුරටත් යොමු කිරීම වැදගත් බව පෙනී යයි.

# 6 වන පරිච්ඡේදය
# ප්‍රතිපත්තිමය ඇගයීම

දෙමව්පියන්ගේ රැකවරණය අහිමි වූ ළමයකු ආයතනික රැකවරණයට යොමු කළ යුත්තේ වෙනත් කිසිදු විකල්ප රැකවරණ ක්‍රමයක් නොමැති අවස්ථාවක අවසාන පියවර වශයෙන් පමණක් වුව ද ශ්‍රී ලංකාවේ පරිවාස යාන්ත්‍රණය කෙරෙහි අවධානය යොමු කිරීමේදී ළමුන් ආයතනගත කිරීම හෝ පුනරුත්ථාපනය සඳහා ඇති වෙනත් විකල්ප ක්‍රම භාවිත කිරීම අවම මට්ටමක පවතින බවත්, ළමුන් ආයතනික රැකවරණය කරා යොමු කිරීම පහසු ක්‍රමයක් ලෙස සලකා කටයුතු කරන බවත් නිරීක්ෂණය වේ.මෙවැනි වාතාවරණයක් හමුවේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් ආයතනගත ළමුන් සඳහා සකස් කරන ලද විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ජාතික ක්‍රියාකාරී සැලැස්මක් හරහා ක්‍රියාවට නැංවීමට සැලසුම් කිරීම සාධනීය තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකිය.

විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය දත්ත ලබා ගැනීමේ අරමුණින් සිදු කරන ලද මෙම සංගණනය මගින් ආයතනගත ළමුන් පිළිබඳව මෙන්ම ආයතනය පිළිබඳවත්,ආයතනික කාර්ය මණ්ඩලය පිළිබඳවත් විස්තරාත්මක තොරතුරු රැස් කරගන්නා ලදී. මෙහිදී ළමුන් ආයතනික රැකවරණය කරා යොමු කිරීමට බලපාන ලද හේතු පිළිබඳවත්, එම ළමුන්ගේ දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳවත්, එම පවුල්වල සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳවත් අවධානය යොමු කර මෙම ළමයින් ආයතනික පරිසරයෙන් මුදාහැර නැවත සමාජයට යොමු කිරීමේ හැකියාව පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා උපකාරී විය හැකි දත්ත ද,ආයතනය සතු පහසුකම් හා ආයතනය මගින් ළමුන් සඳහා සපයනු ලබන සේවාවන් පිළිබඳව මෙන්ම ආයතනික කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත්භාවය හා ප්‍රමිතිය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා උපකාරී වේ යයි අපේක්ෂිත දත්ත ද මෙම සංගණනය මගින් එක්රැස් කරගන්නා ලදී.මෙසේ එක්රැස් කරගන්නා ලද දත්ත මගින් ළමුන්ගේ සුභසාධනය ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා පළාතේ පරිවාස යාන්ත්‍රණය මගින් සිදුකළ හැකි ප්‍රතිපත්තිමය මැදිහත්වීම් පිළිබඳවත්,ළමා රැකවරණ මධ්‍යස්ථාන මගින් ඉටු කළ යුතු කාර්යභාර්ය පිළිබඳවත් වැදගත් තොරතුරු රැසක් අනාවරණය වේ.

### නීතිමය ප්‍රතිපාදන යාවත්කාලීන කිරීම

මෙහිදී ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්ති සම්පාදනය කිරීම මධ්‍යම රජය යටතේ වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සිදු කළ යුතු අතර එම ප්‍රතිපත්තිමය තීරණ පළාත තුළ ක්‍රියාවට නැංවීම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සිදු කළ යුතුව ඇත. විශේෂයෙන්ම පරිවාස විෂය සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන ඇතැම් අණ පනත් යල්පැන ගොස් ඇති බවත් එබැවින් එම අණ පනත් වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කළ යුතු බවත් සඳහන් කළ යුතු ය. එසේ කිරීම තුළින් ළමුන් සම්බන්ධයෙන් කාලීනව පැන නගින ගැටලු පහසුවෙන් නිරාකරණය කරගැනීම සඳහා මංපෙත් විවර කරගත හැකි බව පෙනේ.

### රාජ්‍ය යාන්ත්‍රණයේ අධීක්ෂණය හා නියාමනය නිසියාකාරව පවත්වාගෙන යාම

සෑම ළමා රැකවරණ මධ්‍යස්ථානයක්ම ප්‍රශස්ත ආකාරයට පවත්වාගෙන යන්නේ ද යන්න නියාමනය හා අධීක්ෂණය ළමා රැකවරණ මධ්‍යස්ථාන සම්බන්ධයෙන් වගකීම දරන රාජ්‍ය යාන්ත්‍රණයේ කාර්ය භාරය වේ. ළමා රැකවරණ මධ්‍යස්ථාන සම්බන්ධයෙන් නිකුත් කරන ලද සම්මතයන් අනුව මෙම ආයතන ක්‍රියාත්මක වන්නේ ද යන්න නිරන්තරයෙන් පරීක්ෂා කර බැලිය යුතු ය. ඒ අනුව නිරන්තර අධීක්ෂණය තුළින් ආයතනික පරිපාලනයට තමා මෙම ආයතන සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින බව ඒත්තු ගැන්වීම තුළින් ආයතනගත ළමුන්ගේ උන්නතිය තහවුරු කළ හැකි වේ. ඒ අනුව 1998 අංක 50 දරන පනත මගින් ළමා රැකවරණය අධීක්ෂණය කිරීමට අනිවාර්ය බලතල හිමිව ඇති ජාතික ළමාරක්ෂක අධිකාරිය සියලුම ළමා රැකවරණ මධ්‍යස්ථාන නිසි ලෙස අධීක්ෂණය කිරීමත්, ඒවායේ පහසුකම් හා සේවාවන් නියාමනය කිරීමත් සිදු කළ යුතුව ඇත.

ආයතනගත ළමුන් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ඇතැම් ළමුන් දීර්ඝ කාලීනව ආයතන තුළ රැඳී සිටින බවක් නිරීක්ෂණය වේ. දකුණු පළාත තුළ ආයතනගත ළමුන්ගෙන් 10%ක් පමණ වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් ආයතනගතව සිටින බව වාර්තා වී ඇත. එසේ වුව ද ශ්‍රී ලංකාවේ පවත්නා පරිවාස නීතිය අනුව ළමයකු ආයතනගත කරනු ලබන්නේ උපරිම වසර 3ක කාල සීමාවක් දක්වා පමණක් වන අතර ආයතනගත කරන ලද දින සිට ළමයා සම්බන්ධයෙන් සමීප අධීක්ෂණයක් පවත්වාගෙන යමින් ළමයා සමාජගත කිරීම සඳහා අවශ්‍ය සැලසුම සකස් කළ යුතු වේ. එසේ වුව ද ළමුන් ආයතනගතව දීර්ඝ කාලපරිච්ඡේද ගත කරනු ලැබීමෙන් පැහැදිලි වන්නේ පවත්නා පරිවාස යාන්ත්‍රණය ක්‍රියාත්මකවීමේ ගැටලු හෝ එමගින් විසඳාගත නොහැකි ආකාරයේ ගැටලු සහිත බවයි. මේ සම්බන්ධයෙන් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය යුතු වේ.

ළමයකු ආයතනගත කරන විට ආයතනික පරිසරය ළමයාට අතිශයින්ම හිතකර වන සේ සකස් කර තිබිය යුතු වේ. ළමයාගේ අධ්‍යාපනය, විනෝදාස්වාදය හා ක්‍රීඩා කටයුතු මෙන්ම කායික හා මානසික සෞඛ්‍ය යහපත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් හා සේවාවන් ආයතනය මගින් ප්‍රමාණවත්ව හා ඉහළ ගුණාත්මකතාවයකින් යුතුව සම්පාදනය කළ යුතු වේ. දකුණු පළාත තුළ පිහිටා ඇති ආයතන පිළිබඳව අවධානය යොමු කිරීමේදී බොහෝ ආයතනවල මෙම පහසුකම් හා සේවාවන් ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන ගිය ද ඇතැම් ආයතන තුළ එවැනි

තත්ත්වයක් නිරීක්ෂණය නොවීය.විශේෂයෙන්ම ළමයින් සඳහා ප්‍රමාණවත් වන සේ ඇඳන්, වැසිකිළි පහසුකම් යනාදිය  සපයමින් ළමයින්ගේ සනීපාරක්ෂාව තහවුරු කිරීමත්, ළමයින්ගේ වයසට අදාළව පෙර පාසල්/ පාසල්/ වෘත්තීය අධ්‍යාපනය සඳහා ළමුන් යොමු කරවමින් ඔවුන්ගේ අධ්‍යාපන අයිතිය සුරැකීමත් ආයතන විසින් නිසියාකාරව සිදු කරනවා ද යන්න පිළිබඳව නිරන්තර අවධානයෙන් පසුවෙමින් එසේ සිදු නොවන අවස්ථාවල අදාළ පියවර ගැනීම ආයතනභාර ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරීන් / පරිවාස නිලධාරීන් විසින් අඛණ්ඩව හා සැලකිලිමත්ව සිදු කළ යුතු ය. තව ද ළමයින්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබා දීම හා උපදේශන සේවා සැපයීම පිළිබඳව නියමයන් හඳුන්වාදීම හෝ මේ වන විටත් හඳුන්වා දී ඇති නියමයන් නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම නිර්මාණය කරදීමත් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ.

තම පවුලෙන්/ සමාජයෙන් ලැබිය යුතු රැකවරණය අහිමිවීම හේතුවෙන් රැකවරණය ලබාදීම උදෙසා ආයතනගත කරන ලද ළමයෙක්ට ආයතනය තුළදී ද අපේක්ෂිත රැකවරණය නොලැබෙන ඇතැම් අවස්ථා වර්තමාන ළමා රැකවරණ පද්ධතිය තුළින් වාර්තා වේ. එවැනි සිද්ධි ඇතිවීම වළක්වා ගනිමින් ආයතනගත ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව වගකීම දැරීම ආයතනික පරිපාලනය මෙන්ම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුත්තකි. ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ආයතන විසින් සම්පූර්ණ කර තිබිය යුතු අවශ්‍යතා විවිධ නීති රීති හා අණ පනත් මගින් හඳුන්වා දී තිබුණ ද එම අවශ්‍යතා සම්පූර්ණ කිරීම අඛණ්ඩව සිදු කරනවා ද යන්න පිළිබඳව සමීපව අධීක්ෂණය කිරීම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් සිදු කරමින් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කළ යුතු ය. ආයතනික කාර්ය මණ්ඩලය පිළිබඳව සාකච්ඡා කිරීමේදී ඔවුන්ගේ රාජකාරි ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගේ තනතුරට හා කාර්ය භාර්යයට අදාළව වෘත්තිය පුහුණු අවස්ථා වැඩි වශයෙන් ලබා දිය යුතු ය. එමගින් කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් එම කාර්ය මණ්ඩල තුළින් ලබා ගත හැකි වේ. එසේම ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී ඔවුන්ගේ වයස පිළිබඳව සැලකිලිමත් වීම ද වැදගත් වේ. විශේෂයෙන්ම ළමුන් පිළිබඳ වගකීම් දැරීමට අසීරු වයස්ගත පුද්ගලයන් මෙන්ම සමාජීය වගකීම පිළිබඳ අවබෝධය අඩු ලාබාල වයසේ පසුවන පුද්ගලයන් මෙම කාර්ය මණ්ඩල සඳහා ඇතුළත් නොවන සේ කටයුතු කිරීමට අදාළ නීති රීති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම ද පළාත් රාජ්‍ය යාන්ත්‍රණයේ වගකීමක් වේ.

## ආයතනික රැකවරණ සැලසුම් සකස් කිරීම  හා විකල්ප රැකවරණ ක්‍රම හඳුන්වාදීම කෙරෙහි නැඹුරුවීම

නීතිමය ගැටලු, පවුල විසින් ළමයා නැවත භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම, ළමයා දරුකමට හදාවඩා ගැනීම සඳහා වෙනත් පාර්ශ්වයක් වෙත ලබා දීම සඳහා එකඟතාවය ප්‍රකාශ නොකිරීම වැනි හේතු නිසා ඇතැම් ළමයින්ට අවුරුදු 18න් පසුව පවා ආයතනගතව සිටීමට සිදු වූ අවස්ථා දැකිය හැකිය. තව ද ඇතැම් විට ප්‍රායෝගික ගැටලු හා පරිපාලන දුර්වලතා නිසා ළමයින්ට විකල්ප පවුලක රැකවරණය ලැබීමට ඇති අවස්ථා ද අහිමි වී ඇත. ආයතනගතව සිටින අනාථ/ අත්හල ගණයේ ලා සැලකෙන ළමයකු මුල්ම අවධියේදී දරුකමට හදාවඩා ගැනීම සඳහා වෙනත් පාර්ශ්වයකට ලබා දීම සඳහා නීතිමය ප්‍රතිපාදන තිබුන ද, එය ද නිසියාකාරව ක්‍රියාත්මක නොවන බවක් පෙනී යයි. මේ සඳහා වන නීතිමය රාමුව තුළ පවත්නා සංකීර්ණතාවය කුලවැද්දීම සඳහා ළමුන් යොමු කිරීම ඉතාමත් මන්දගාමීව සිදුවීමට හේතු වනවා විය හැකිය. කෙසේ වුව ද පවත්නා යාන්ත්‍රණය තුළ ළමුන් කුලවැද්දීම කාර්යක්ෂමව සිදු කරමින් මෙම ළමුන් පවුල් පාදක රැකවරණයක් කරා යොමු කිරීමට අදාළ පාර්ශ්ව උපරිම වශයෙන් කටයුතු කළ යුතු වේ.

ඇතැම් අවස්ථාවල ආයතනික පරිපාලනය විසින් ළමයාට ජීවත්වීම සඳහා වඩාත් සුදුසු ස්ථානය ළමා රැකවරණ මධ්‍යස්ථානයක් ලෙස හඳුනා ගන්නා බව වාර්තා වී ඇති අතර මෙය ද ළමයින් සමාජගත කිරීම සඳහා ඍණාත්මකව බලපා ඇති බව පෙනී යයි. මෙවැනි අවස්ථාවල පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පූර්ණ මැදිහත්වීමෙන් ළමයින් සමාජගත කිරීම සඳහා සුදුසු පියවරයන් ගත යුතු වේ.

එක් එක් ළමයාගේ පවුල් පරිසරය, දෙමව්පියන්/ භාරකරුවන් පිළිබඳ තොරතුරු මෙන්ම ළමයාගේ කායික මානසික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් එක් එක් ළමයාට පෞද්ගලික වන සේ රැකවරණ සැලසුම් සකස් කරමින් ඉතා කෙටි කාලයක් තුළ ළමයා නැවත සමාජයට යොමු කිරීම සඳහා වන වැඩපිළිවෙළ සකස් කිරීම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමක් වේ.

## පවුල් ඒකක ශක්තිමත් කිරීම

ආයතනගත ළමුන්ගේ පවුල් පසුබිම පිළිබඳව විමසා බැලීමේදි දකුණු පළාත තුළ ආයතනගතව සිටින ළමුන් 921 දෙනා අතරින් 636 දෙනෙකුම ආයතනගත කරන අවස්ථාව වන විට තම මව/ පියා/ දෙමව්පියන් සමග ජීවත්ව සිට ඇති බවත්, ඒ වන විට ළමුන් 851 දෙනෙකුගේම මව/ පියා/ දෙමව්පියන් දෙදෙනාම ජීවත්ව සිට ඇති බවත් වාර්තා වී ඇත. එසේම සංගණනය පවත්වන අවස්ථාව වන විට මව/ පියා/ දෙමව්පියන් දෙදෙනාම භාරකරුවන් ලෙස ඉදිරිපත් වී ඇති ළමුන් 572 දෙනෙක් වාර්තාවීමෙන් පෙනීයන්නේ මෙම ළමුන් නැවත තම පවුල වෙත යොමු කිරීම සඳහා වැඩි ඉඩකඩක් පවතින බව යි.  එසේ වුව ද මෙම පවුල්වල ආර්ථික තත්ත්වය පිළිබඳව විමසා බැලීමේදී පෙනී යන්නේ මොවුන්ගේ

දෙමව්පියන්ගෙන් බහුතරයක් ළමයින් නැවත පවුලට සම්බන්ධ කරගැනීමට තරම් ආර්ථික වශයෙන් ස්ථාවර තත්ත්වයක පසු නොවන බවයි. එසේම බොහෝ පවුල් පරිසර තුළ සමාජයීය වශයෙන් ද ගැටලුකාරී තත්ත්වයන් නිරීක්ෂණය වේ. එම නිසා මෙවැනි ළමුන් සිටින පවුල් හඳුනාගෙන එම පවුල් ඒකක ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ආර්ථික හා මනෝ සමාජයීය සහයෝගය ලබාදීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපනය කළ යුතුව ඇත. මේ සඳහා ප්‍රාදේශීය වශයෙන් පිහිටුවා ඇති රාජ්‍ය යාන්ත්‍රණයේ මැදිහත්වීම ලබාගැනීමට කටයුතු කිරීම ද වැදගත් වේ. මෙවැනි ක්‍රියාමාර්ග තුළින් අසරණ ළමයින් ගණයේ සලකා ආයතනගත කර ඇති 57% පමණ වන ළමුන් පහසුවෙන් සිය පවුල වෙත යොමු කිරීමට අවස්ථාව සලසා ගත හැකි වේ.

### ප්‍රමාණවත් වන සේ ප්‍රතිපාදන වෙන් කිරීම

එසේම ආයතනගත ළමුන්ගේ සුභසිද්ධිය තහවුරු කිරීමේ දී ඒ සඳහා පළාත් සභාව මගින් පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය ද වැදගත් වේ.

රාජ්‍ය අංශය මගින් පවත්වාගෙන යන ළමා රැකවරණ මධ්‍යස්ථානවල පහසුකම් සම්පූර්ණ කිරීමත්, සේවා සම්පාදනය කිරීමත් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත්ව ලබා දීම රාජ්‍ය අංශයේ වගකීමක් වේ. එසේම ස්වේච්ඡා සංවිධාන මගින් පවත්වාගෙන යන ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා පහසුකම් හා සේවාවන් අවශ්‍ය වන අවස්ථාවලදී එම අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා අදාළ ස්වේච්ඡා සංවිධාන/ පෞද්ගලික අංශය අපොහොසත් වන්නේ නම් රාජ්‍ය යාන්ත්‍රණයේ මැදිහත්වීමෙන් හෝ එම පහසුකම් සම්පූර්ණ කිරීම ළමුන් වෙනුවෙන් සිදුකළ යුතු සේවාවකි. මෙම සියලු අවශ්‍යතාවයන් සඳහා ප්‍රමාණවත් වන සේ පළාත් සභාව මගින් පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ඉහළ නංවා ගැනීම ද අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුත්තකි.

මෙම සංගණන තොරතුරු පාදක කර ගනිමින් මේ වන විට ආයතනගතව සිටින ළමුන් සමාජගත කිරීම සඳහාත්, ඉදිරියේදී ළමුන් ආයතනගත කිරීම් අඩු වන ආකාරයෙන් කටයුතු කිරීම සඳහාත් බලධාරීන් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

2019 ළමා නිවාසගත ළමුන් පිළිබඳ සංගණනය

# දකුණු පළාත

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය
www.statistics.gov.lk



**දැක්ම**

"දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම."

**මෙහෙවර**

"ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම හා උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබාදීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයේ සංවර්ධනයට දායක වීම."

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71, පොල්දූව පාර
බත්තරමුල්ල

info@statistics.gov.lk
+94112147000
+94112147400
+94112147011
www.statistics.gov.lk

පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය මගින් මෙම ප්‍රකාශනය සකස් කරන ලදී.
research@statistics.gov.lk
+94112147473
+94112147474

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මුද්‍රණ අංශය විසින් මුද්‍රණය කරන ලදී.